# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 නොවැම්බර් මස 01 වන දින

## II වන කොටස

## අතිරේකය

(2019.11.01 දින නිකුත් කරන ලදී)

## ශ්‍රී ලංකා මහ බැංකුව

**ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත ඉවත් කිරීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

මිල **:** රු. 152.00 තැපැල් ගාස්තුව **:** රු. 55.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා මහ බැංකුව

එල්.ඩී.-ඕ. 12/2019

**ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත ඉවත් කිරීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1\. (1) මේ පනත 2019 අංක     දරන ශ්‍රී ලංකා මහ බැංකුව පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මේ පනතේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක බලාත්මකභාවයට පත් විය යුතු ය.

(2) නියමිත දිනය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාරව මේ පනත සම්බන්ධයෙන් සහතිකය සටහන් කරනු ලැබූ දින සිට මාස හයක කාලසීමාවකට පසු නොවන දිනයක් විය යුතු ය.

### I වන කොටස

### මහ බැංකුව පිහිටුවීම

මහ බැංකුව පිහිටුවීම.

2\. (1) ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා වගකිව යුතු අධිකාරියක් වන්නා වූ (මේ පනතේ "මහ බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මහ බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මහ බැංකුව අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එහි සංස්ථාපිත නාමයෙන් එය විසින් ද, එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය.

3\. මහ බැංකුව එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ දී පවත්වාගෙන යා යුතු අතර, එහි කටයුතු නිසි පරිදි කරගෙන යාම

සඳහා අවශ්‍ය විය හැකි යම් ශාඛා, නියෝජ්‍යායතන සහ සම්බන්ධීකාරකයන් ශ්‍රී ලංකාවේ වෙනත් ස්ථානවල හෝ විදේශයන්හි පවත්වාගෙන යා හැකි ය.

මහ බැංකුවේ ප්‍රාග්ධනය.

4. (1) මහ බැංකුවේ ප්‍රාග්ධනය, පාලක මණ්ඩලය විසින් කලින් කලට නිශ්චය කරනු ලැබිය හැකි සම්පූර්ණයෙන් ම සහභාග සහ ගෙවා නිමි ප්‍රාග්ධන මුදලක් විය යුතු ය.

(2) මහ බැංකුවේ ප්‍රාග්ධනය, සම්පූර්ණයෙන් ම රජය විසින් දරනු ලැබිය යුතු අතර, එය පැවරීම හෝ කවර හෝ බැඳීමකට යටත් කිරීම නො කළ යුතු ය.

(3) මහ බැංකුවේ ප්‍රාග්ධනය, ඒකාබද්ධ අරමුදලින් වෙන් කරන ලද අරමුදල්වලින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, පාලක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදලකින් වැඩි කරනු ලැබිය හැකි ය.

(4) මහ බැංකුවේ ප්‍රාග්ධනය කවර හෝ අවස්ථාවක දී අඩු නොකළ යුතු ය.

මහ බැංකුවේ ස්වාධීනත්වය සහ වගවීම.

5. (1) මහ බැංකුවට පරිපාලනමය සහ මූල්‍යමය ස්වාධීනත්වය තිබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි මහ බැංකුව ස්වාධීන විය යුතු ය; වගවීමෙන් යුක්ත විය යුතු ය.

(3) මහ බැංකුවේ ස්වාධීනත්වයට සෑමවිට ම ගරු කරනු ලැබිය යුතු අතර, කවර හෝ තැනැත්තකු හෝ අස්ථිත්වයක් විසින්, පාලක මණ්ඩලයේ, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සහ විධායක මණ්ඩලයේ සාමාජිකයන්ට හෝ ඒවායේ සේවා නියුක්තයන්ට මේ පනත යටතේ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ සිදු කිරීමේ දී කවර හෝ බලපෑමක් කිරීම හෝ මහ බැංකුවේ කටයුතුවලට බාධා කිරීම හෝ නො කළ යුතු ය.

(4) මේ පනත යටතේ වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ සිදු කිරීමේ දී හැර, පාලක මණ්ඩලයේ, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සහ විධායක මණ්ඩලයේ සාමාජිකයන්,

මහ බැංකුවේ සේවානියුක්තයන් හෝ මහ බැංකුව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් කිසිදු තැනැත්තකුගෙන් උපදෙස් ගැනීම නො කළ යුතු ය:

එසේ වුවද, මේ වගන්තියේ කිසිවකින්, මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම පිණිස වෘත්තීයමය හෝ විශේෂඥ උපදෙස් ගැනීමෙන් මහ බැංකුව වළක්වනු නො ලැබිය යුතු ය.

මහ බැංකුවේ අරමුණු.

**6.** (1) දේශීය මිල ස්ථායීතාවය අත්කර ගැනීම සහ පවත්වාගෙන යාම මහ බැංකුවේ ප්‍රධාන අරමුණ විය යුතු ය.

(2) මූල්‍ය පද්ධති ස්ථායීතාවය සුරක්ෂිත කිරීම මහ බැංකුවේ එක් කේන්ද්‍රීය අරමුණක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රධාන අරමුණ ළඟාකර ගැනීමේ දී මහ බැංකුව විසින්, වෙනත් කරුණු අතර, එහි විභව්‍ය මට්ටම දෙසට වූ නිමවුම් ස්ථායීතාවය සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ සඳහන් කේන්ද්‍රීය අරමුණ ළඟාකර ගැනීමේ දී මහ බැංකුව විසින්, වෙනත් කරුණු අතර, මූල්‍ය පද්ධතියේ සංවර්ධනය සහ කාර්යක්ෂමතාවය සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

මහ බැංකුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

**7.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මහ බැංකුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු යඃ-

(අ) මුදල් ප්‍රතිපත්තිය තීරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ආ) විනිමය අනුපාත ප්‍රතිපත්තිය තීරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඇ) ශ්‍රී ලංකාවේ නිල ජාත්‍යන්තර සංචිත පවත්වාගෙන යාම සහ කළමනාකරණය කිරීම;

(ඈ) ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම සහ කළමනාකරණය කිරීම;

(ඉ) ගෙවීම් පද්ධති පරිපාලනය කිරීම, අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම සහ ඒ ගෙවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය, ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාවය සහතික කිරීම;

(ඊ) මූල්‍ය ආයතන ලියාපදිංචි කිරීම, ඊට බලපත්‍ර දීම, නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම;

(උ) මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන මූල්‍ය ආයතන නිරාකරණය කිරීම;

(ඌ) සාර්වවිචක්ෂණශීලී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම;

(එ) සංඛ්‍යාලේඛන රැස්කිරීම සහ ඉදිරිපත් කිරීම;

(ඒ) රජයේ මූල්‍ය උපදේශකවරයා ලෙස සහ රජයේ බැංකුකරු ලෙස කටයුතු කිරීම;

(ඔ) යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ විධිවිධාන සලස්වා ඇති ප්‍රමාණයට, රජයේ රාජ්‍ය මූල්‍ය නියෝජිතයා ලෙස කටයුතු කිරීම;

(ඕ) ස්වකීය ප්‍රතිපත්ති සහ මෙහෙයුම් පිළිබඳව පාර්ලිමේන්තුව, රජය සහ මහජනතාව වෙත දැනුම් දීම;

(ක) ජාත්‍යන්තර රාජ්‍ය මූල්‍ය ආයතන ඇතුළුව ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, ඒ ජාත්‍යන්තර සංවිධානවලට සහභාගී වීම සහ ස්වකීය අරමුණුවලට අදාළ කාරණා සම්බන්ධයෙන් දේශීය සහ විදේශීය රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම;

(ග) ශ්‍රී ලංකාව තුළ මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම;

(ච) මූල්‍ය පද්ධති ස්ථායීතාවය සුරක්ෂිත කිරීමේ උපක්‍රමයක් ලෙස තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනාක්‍රම ඇති කිරීම;

(ජ) චංචල සහ නිශ්චල දේපළ දැරීම, විකිණීම සහ බැහැර කිරීම සහ ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ට) අවශ්‍ය යයි ඊට හැඟෙන වත්කම් අත්කර ගැනීම සහ දැරීම සහ බැරකම් දැරීම; සහ

(ඩ) පොදුවේ මහ බැංකුවේ අරමුණු ක්‍රියාවේ යෙදවීම හෝ ඒ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ හෝ හිතකර වන්නා වූ සියලු ක්‍රියා සහ දේ සිදු කිරීම.

(2) මහ බැංකුවේ අරමුණු ළඟා කර ගැනීමේ කාර්යය සඳහා පාලක මණ්ඩලය, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සහ විධායක මණ්ඩලය විසින්, මේ පනත මගින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් මහ බැංකුව වෙත පවරන ලද, වෙන් කරන ලද හෝ පනවන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම කළ යුතු ය.

## II වන කොටස

### පාලක මණ්ඩලය, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සහ විධායක මණ්ඩලය

මහ බැංකුවේ පාලක මණ්ඩලය.

**8.** (1) මහ බැංකුවේ කටයුතුවල පරිපාලනය සහ කළමනාකරණය අධීක්ෂණය කිරීමේ සහ මුදල් ප්‍රතිපත්තිය නොවන මහ බැංකුවේ සාමාන්‍ය ප්‍රතිපත්තිය තීරණය කිරීමේ වගකීම පැවරුණු (මේ පනතේ "පාලක මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහ බැංකුවේ පාලක මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) පාලක මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා;

(ආ) පාලක මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු මහ බැංකුවේ අධිපතිවරයා; සහ

(ඇ) ආර්ථික විද්‍යාව, බැංකුකරණය, මූල්‍යය, ගිණුම්කරණය සහ විගණනය, නීතිය හෝ අවදානම් කළමනාකරණය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති සාමාජිකයන් තිදෙනෙක්.

(3) මහ බැංකුවේ සේවානියුක්තයකු විය යුතු පාලක මණ්ඩලයේ ලේකම්වරයා, විධායක මණ්ඩලය විසින් නම් කරනු ලැබිය යුතු ය.

(4) සභාපතිවරයා හැර පාලක මණ්ඩලයේ සාමාජිකයන් විසින්, මහ බැංකුවේ අධීක්ෂණ සහ ප්‍රතිපත්ති සකස් කිරීමේ කර්තව්‍ය ඉටු කළ යුතු අතර, මහ බැංකුවේ කිසිදු විධායක කර්තව්‍යයක් ඉටු නො කළ යුතු ය.

(5) (අ) මුදල් ප්‍රතිපත්තිය නොවන සාමාන්‍ය ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගැනීම;

(ආ) මූල්‍ය ආයතනවලට උපදෙස් නිකුත් කිරීම, ගෙවීම්, නිෂ්කාශන සහ පියවීම් පද්ධති නියාමනය කිරීම, ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීම ඇතුළුව බලාත්මක කිරීමේ පියවර ගැනීම සහ ඒ ආයතන සඳහා ලැබුම්කරුවකු පත් කිරීම;

(ඇ) මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් විධිවිධාන සලසා ඇති පරිදි පරිපාලනමය ක්‍රියාමාර්ග ගැනීම;

(ඈ) මහ බැංකුවේ ආයතනික ක්‍රමෝපාය සකස් කිරීම;

(ඉ) මහ බැංකුවේ අයවැය අනුමත කිරීම;

(ඊ) මහ බැංකුවේ වාර්ෂික ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම;

(උ) මහ බැංකුවේ සහ මහ බැංකුවේ සේවානියුක්තයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය නියාමනය කිරීමේ සාමාන්‍ය රාමුවක් සකස් කිරීම;

(ඌ) මහ බැංකුවේ සේවානියුක්තයන්ගේ පත් කිරීම්, උසස් කිරීම් සහ විනය පාලනය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පටිපාටි සකස් කිරීම;

(එ) මහ බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා පත් කිරීම;

(ඒ) මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණය, අවදානම් කළමනාකරණය, අනුකූලතාව, තොරතුරු තාක්ෂණය, ආරක්ෂාව සහ අභ්‍යන්තර පාලන පද්ධතිය සුපරීක්ෂණය කිරීම;

(ඔ) මහ බැංකුවේ පරිපාලනය අධීක්ෂණය කිරීම;

(ඕ) මහ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි ඇතුළු ප්‍රතිපත්ති, ජාත්‍යන්තරව පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වන පරිදි යොදා ගැනීම;

(ක) මහ බැංකුවේ විගණන කමිටුව විසින් පිළියෙල කරනු ලබන අභ්‍යන්තර විගණන වාර්තාව අනුමත කිරීම සහ අභ්‍යන්තර විගණකවරයාගේ නිර්දේශ මහ බැංකුව තුළ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම;

(ග) ස්වකීය කාර්ය පටිපාටිමය රීති සෑදීම; සහ

(ච) පොදුවේ, මහ බැංකුවේ පරිපාලනය සහ කළමනාකරණය සඳහා අවශ්‍ය වන්නා වූ හෝ ඒ සඳහා ආනුෂංගික වන්නා වූ හෝ හිතකර වන්නා වූ සියලු ක්‍රියා සහ දේවල් සිදු කිරීම සහ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම,

පාලක මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය විය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව සඳහන් කර්තව්‍ය පාලක මණ්ඩලය විසින් 14 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විධායක මණ්ඩලය වෙත පවරනු ලැබිය හැකි ය.

(7) පාලක මණ්ඩලය විසින්, මහ බැංකුවේ පරිපාලනය සහ කළමනාකරණය සුපරීක්ෂණය කිරීමේ දී සහාය වීමට විශේෂිත මණ්ඩල සහ අනුකමිටු පිහිටුවනු ලැබිය හැකි ය.

(8) පාලක මණ්ඩලය විසින්, මහ බැංකුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ සිදු කිරීමට බලපාන හෝ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වන යම් කාරණාවකට අදාළව අවශ්‍ය යයි එය විසින් සලකනු ලබන යම් රීති සාදනු ලැබිය හැකි ය.

(9) පාලක මණ්ඩලය විසින්, මහ බැංකුවේ පරිපාලනය, කළමනාකරණය සහ මෙහෙයුම් සම්බන්ධයෙන් සහ මහ බැංකුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ සිදු කිරීමේ දී මහ බැංකුව දරන ලද සියලු වියදම් පියවා

ගැනීමේ කාර්යය සඳහා මහ බැංකුවේ අරමුදල් භාවිත කරනු ලැබිය හැකි ය.

පාලක මණ්ඩලයේ රැස්වීම්.

**9.** (1) පාලක මණ්ඩලයේ රැස්වීම් යටත් පිරිසෙයින් මාසයකට එක් වරක් සහ මහ බැංකුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ සහ සිදු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන වාර ගණනක් පවත්වනු ලැබිය යුතු ය.

(2) පාලක මණ්ඩලයේ සභාපතිවරයා, පැමිණ සිටී නම්, පාලක මණ්ඩලයේ සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විටක දී ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරාපත් කර ගනු ලබන පත් කළ සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(3) පාලක මණ්ඩලයේ රැස්වීම්, සභාපතිවරයා විසින් හෝ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයන් දෙදෙනෙකුගේ ලිඛිත ඉල්ලීමක් මත කැඳවනු ලැබිය යුතු ය.

(4) පාලක මණ්ඩලයේ රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතු ය.

(5) පාලක මණ්ඩලයේ එක් එක් සාමාජිකයාට එක් ඡන්දය බැගින් තිබිය යුතු අතර, පාලක මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්ද සමාන වන අවස්ථාවක දී, ඒ රැස්වීමේ මුලසුන දරන තැනැත්තාට, ස්වකීය ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

(6) පාලක මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කළ යුතු සියලු කාරණා පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරයක ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

(7) පාලක මණ්ඩලය විසින්, මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම සඳහා කාර්ය පටිපාටිමය රීති සාදනු ලැබිය හැකි අතර, ඒ කාර්ය පටිපාටිමය රීති මගින් පාලක මණ්ඩලයේ රැස්වීම් පවත්වනු ලැබිය යුතු ආකාරය පිළිබඳව විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

(8) මේ වගන්තියේ පූර්වයෙන් වූ විධිවිධානවලට යටත්ව, පාලක මණ්ඩලය විසින්, පාලක මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු පිළිබඳව, එහි කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(9) පාලක මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් පැවතීමේ හේතුව නිසාම පමණක් හෝ පාලක මණ්ඩලයේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අවලංගු යයි සලකනු නො ලැබිය යුතු ය.

**පාලක මණ්ඩලයේ රැස්වීම් කටයුතුවල රහස්‍යභාවය.**

**10.** (1) පාලක මණ්ඩලයේ රැස්වීම් කටයුතු රහසිගත විය යුතු ය. පාලක මණ්ඩලය විසින් යම් කාරණයක් සම්බන්ධයෙන් ගනු ලබන යම් තීරණයක්, අවශ්‍ය යයි එය විසින් සලකන්නේ නම් ප්‍රසිද්ධියට පත් කරනු ලැබිය හැකි ය.

(2) පාලක මණ්ඩලයේ එක් එක් රැස්වීම්වල සටහන් ඒ රැස්වීමේ මුලසුන දරන තැනැත්තා සහ පාලක මණ්ඩලයේ ලේකම්වරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

**මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය.**

**11.** (1) මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සකස් කිරීම සහ දේශීය මිල ස්ථායීතාව අත්කර ගැනීම සහ පවත්වාගෙන යාම පිණිස, නම්‍යශීලී උද්ධමන ඉලක්ක රාමුව සමඟ සමපාත වන්නා වූ නම්‍යශීලී විනිමය අනුපාත උපායමාර්ගයක් ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරුණු (මේ පනතේ "මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික සහ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගනිමින් මුදල් සැපයුම, ලබා ගැනීමේ හැකියාව සහ පිරිවැය නියාමනය කළ යුතු ය.

**මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සංයුතිය.**

**12.** (1) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු යः-

(අ) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු මහ බැංකුවේ අධිපතිවරයා;

(ආ) මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරු; සහ

(ඇ) ආර්ථික විද්‍යාව හෝ මූල්‍යය යන ක්ෂේත්‍රයක විශේෂඥයන් හතර දෙනෙකු.

(2) පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකු (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ විශේෂඥයකු ලෙස පත් කරනු ලැබිය හැකි ය.

(3) මහ බැංකුවේ සේවානියුක්තයකු විය යුතු මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ ලේකම්වරයා විධායක මණ්ඩලය විසින් නම් කරනු ලැබිය යුතු ය.

**මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ රැස්වීම්.**

**13.** (1) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය, යටත් පිරිසෙයින් වර්ෂයේ සෑම කාර්තුවකට ම එක් වරක් රැස්විය යුතු ය.

(2) සෑම වර්ෂයක ම, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ රැස්වීම් පිළිබඳ කාලසටහන ඒ වර්ෂයේ පළමු රැස්වීමට පෙරාතුව මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

(3) යම් හදිසි අවශ්‍යතාවක් හේතුවෙන් අතිරේක රැස්වීමක් අවශ්‍ය යයි හෝ රැස්වීම් කාලසටහන වෙනස් කිරීම අවශ්‍ය යයි මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සභාපතිවරයාගේ අදහස වන්නේ නම් රැස්වීම් පිළිබඳ කාලසටහන වෙනස් කරනු ලැබිය හැකි ය. එවැනි අවස්ථානුගත කරුණුවල දී, රැස්වීම් පිළිබඳ ප්‍රතිශෝධිත කාලසටහන හැකිතාක් ඉක්මණින් මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

(4) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සභාපතිවරයා, පැමිණ සිටී නම්, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විටක දී ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරාපත් කර ගනු ලබන පත් කළ සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(5) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු අතර, ඉන් එක් අයකු මහ බැංකුවේ අධිපතිවරයා හෝ ඔහු නොපැමිණි විටක දී, මිල ස්ථායීතාවය භාර මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයා විය යුතු ය.

(6) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ එක් එක් සාමාජිකයාට එක් ඡන්දය බැගින් තිබිය යුතු අතර, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්ද සමාන වන අවස්ථාවක දී, ඒ රැස්වීමේ මුලසුන දරන සාමාජිකයාට ස්වකීය ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

(7) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කළ යුතු සියලු කාරණා පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරයක ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

(8) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු රහසිගත විය යුතු ය.

(9) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින්, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සෑම රැස්වීමක් ම අවසාන වීමෙන් පසුව, එය විසින් සම්මත කරනු ලැබූ සියලු යෝජනා, ඒ යෝජනා කෙරෙහි පදනම් වූ මෑත කාලීන ආර්ථික සංවර්ධනයන් සහ ආර්ථික දැක්ම පිළිබඳ පැහැදිලි කිරීමක් ද සමඟ ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

(10) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින්, ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම සඳහා කාර්ය පටිපාටිමය රීති සාදනු ලැබිය හැකි ය.

(11) කාර්ය පටිපාටිමය රීති මගින්, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ රැස්වීම් පවත්වනු ලැබිය යුතු ආකාරය පිළිබඳව විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

(12) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ එක් එක් රැස්වීම්වල සටහන් ලිඛිතව පවත්වාගෙන යනු ලැබිය යුතු අතර, ඒ සටහන් යටත් පිරිසෙයින් වසර දොළහක කාලසීමාවක් සඳහා රඳවා තබා ගනු ලැබිය යුතු ය.

(13) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් පැවතීමේ හේතුව නිසාම පමණක් හෝ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අවලංගු යයි සලකනු නො ලැබිය යුතු ය.

විධායක මණ්ඩලය.

**14.** (1) මහ බැංකුවේ එදිනෙදා මෙහෙයුම් කටයුතු පිළිබඳ වගකීම පැවරුණු (මේ පනතේ "විධායක මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහ බැංකුවේ විධායක මණ්ඩලයක් තිබිය යුතු ය.

(2) විධායක මණ්ඩලය, විධායක මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු මහ බැංකුවේ අධිපතිවරයාගෙන්, මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ

නියෝජ්‍ය අධිපතිවරයාගෙන් සහ මහ බැංකුවේ අනෙකුත් නියෝජ්‍ය අධිපතිවරුන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) විධායක මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය-

(අ) පාලක මණ්ඩලය සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් පිළිගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම; සහ

(ආ) පාලක මණ්ඩලය හෝ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් ඊට ප්‍රකාශිතව ම පවරා දෙන ලද මහ බැංකුවේ වෙනත් කර්තව්‍ය ඉටු කිරීම,

විය යුතු ය.

(4) විධායක මණ්ඩලය විසින්, මේ පනත යටතේ වූ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ සිදු කිරීමේ දී සහාය වීමට විධායක අනුකමිටු පිහිටුවනු ලැබිය හැකි ය.

(5) විධායක මණ්ඩලය විසින්, ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම සඳහා කාර්ය පටිපාටිමය රීති සාදනු ලැබිය හැකි ය.

මහ බැංකුවේ අධිපතිවරයාගේ සහ නියෝජ්‍ය අධිපතිවරුන්ගේ බලතල.

**15.** (1) මහ බැංකුවේ අධිපතිවරයා මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා ද ප්‍රධාන අනුයෝජිතයා ද විය යුතු ය.

(2) මහ බැංකුවේ අධිපතිවරයාට, මහ බැංකුව වෙනුවෙන් යම් රීතියක්, නියෝගයක්, විධානයක්, දැන්වීමක්, කොන්ත්‍රාත්තුවක්, පොරොන්දු නෝට්ටුවක්, සුරැකුමක්, වාර්තාවක්, ශේෂ පත්‍රයක්, ප්‍රකාශයක් හෝ වෙනත් යම් ලේඛනයක් අත්සන් කිරීමට අධිකාරී බලය තිබිය යුතු ය.

(3) මහ බැංකුවේ අධිපතිවරයා විසින් ස්වකීය සම්පූර්ණ වෘත්තීයමය කාලය මහ බැංකුවේ කටයුතුවලට කැප කළ යුතු ය.

(4) මහ බැංකුවේ අධිපතිවරයා විසින් රජයේ හෝ පෞද්ගලික සහ පාරිශ්‍රමික සහිත හෝ පාරිශ්‍රමික රහිත කවර හෝ වෙනත් යම් ධුරයක් හෝ සේවා නියුක්තියක් පිළිගැනීම හෝ දැරීම නො කළ යුතු යඃ

එසේ වුව ද, මේ උපවගන්තියේ විධිවිධානවල කිසිවකින් මහ බැංකුවේ අධිපතිවරයා-

(අ) යම් විද්වත් ධුරයක් හෝ තනතුරක් හෝ ආර්ථික විද්‍යාව, මුදල්, බැංකුකරණය, සංඛ්‍යානය හෝ මූල්‍යය යන විෂයයන්වල පර්යේෂණ කටයුතු සිදු කිරීමේ කාර්යය සඳහා පිහිටුවන ලද ආයතනයක හෝ සංවිධානයක යම් ධුරයක් හෝ තනතුරක් පිළිගැනීමෙන් හෝ දැරීමෙන්;

(ආ) ශ්‍රී ලංකාවේ ජාතික සුබසාධනයට බලපාන යම් මුදල්, බැංකුකරණ, මූල්‍යමය හෝ සාමාන්‍ය ආර්ථික කාරණයකට හෝ ප්‍රශ්නයකට අදාළ වන යම් විමර්ශනයක කාර්ය සඳහා (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද යම් කොමිෂන් සභාවක සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමෙන් හෝ කටයුතු කිරීමෙන්; හෝ

(ඇ) යම් කාරණයක් හෝ ප්‍රශ්නයක් පිළිබඳව විමර්ශනය කරන, පරීක්ෂා කරන හෝ ඒ මත උපදෙස් දෙන යම් සභාවක, කමිටුවක හෝ වෙනත් මණ්ඩලයක සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමෙන් හෝ කටයුතු කිරීමෙන්,

වළක්වනු ලබන්නේ යයි සලකනු නො ලැබිය යුතු ය.

(5) මහ බැංකුවේ අධිපතිවරයා විසින් ඔහුගේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයා වෙත හෝ පාලක මණ්ඩලයේ එකඟත්වය ඇතිව මහ බැංකුවේ වෙනත් යම් නියෝජ්‍ය අධිපතිවරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(6) මහ බැංකුවේ අධිපතිවරයා තාවකාලිකව රාජකාරියෙන් බැහැර වන හෝ මහ බැංකුවේ අධිපතිවරයාට තාවකාලිකව ඔහුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ සිදු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, 16 වන වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූලව නම් කරන ලද මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයා විසින් මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා ලෙස කටයුතු කළ යුතු අතර, ඔහුට මහ බැංකුවේ අධිපතිවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ සිදු කිරීමට අධිකාරී බලය තිබිය යුතු ය.

(7) මහ බැංකුවේ අධිපතිවරයා සහ මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයා තාවකාලිකව රාජකාරියෙන් බැහැර වන හෝ ඔවුන්ට තාවකාලිකව ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ සිදු කිරීමට නො හැකි වන අවස්ථාවක දී, පාලක මණ්ඩලය විසින්, මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා ලෙස කටයුතු කිරීමට මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයකු පත් කරනු ලැබිය යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ පත් කරන ලද මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයා මහ බැංකුවේ වැඩබලන ප්‍රධාන විධායක නිලධරයා ලෙස නම් කරනු ලැබිය යුතු ය.

(9) (අ) මහ බැංකුවේ අධිපතිවරයා විසින් යම් හේතුවක් නිසා ධුරය අත්හරින හෝ ධුරය දැරීම නතර කරන අවස්ථාවක දී 16 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව පත් කරන ලද මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයා මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා ලෙස කටයුතු කළ යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් කරන ලද මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයාට, යම් හේතුවක් නිසා ප්‍රධාන විධායක නිලධරයා ලෙස කටයුතු කිරීමට නොහැකි වන අවස්ථාවක දී (8) වන උපවගන්තිය ප්‍රකාරව නම් කරන ලද වැඩබලන ප්‍රධාන විධායක නිලධරයා, මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා ලෙස කටයුතු කළ යුතු ය.

(10) මහ බැංකුවේ අධිපතිවරයාගේ ධුරය, දින හතළිස් පහකට වඩා වැඩි කාලයක් පුරප්පාඩුව නො පැවතිය යුතු ය.

#### මහ බැංකුවේ අධිපතිවරයා සහ අනෙකුත් පත් කළ සාමාජිකයන් සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයා පත් කිරීම.

**16.** (1) අමාත්‍යවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඉදිරිපත් කරන ලද නිර්දේශය මත සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟත්වය ඇතිව ජනාධිපතිවරයා විසින් මහ බැංකුවේ අධිපතිවරයා සහ (මේ පනතේ "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) 8 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් පාලක මණ්ඩලයේ සාමාජිකයන් සහ 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ විශේෂඥයන් පත් කරනු ලැබිය යුතු ය.

(2) පාලක මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව -

(අ) මේ පනතින් හෝ පාලක මණ්ඩලය විසින් තමන් වෙත පවරන ලද යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම කළ යුතු වන්නා වූ මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරු තුන් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් පත් කළ යුතු ය; සහ

(ආ) (අ) ඡේදය යටතේ පත් කරන ලද එක් නියෝජ්‍ය අධිපතිවරයකු මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයා ලෙස නම් කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සිදු කරනු ලබන සෑම පත්කිරීමක් ම 18 වන වගන්තියේ විධිවිධානවලට යටත් විය යුතු ය.

(4) මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරු මහ බැංකුවේ සේවානියුක්තයන් විය යුතු අතර, ඔවුන් රාජ්‍ය අංශයට අදාළ නිර්ණායක හා සමගාමීව පාලක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි විශ්‍රාම යාමේ වයස් සීමාවකට යටත් විය යුතු ය.

(5) මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරු පත් කිරීම සහ මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයා නම් කිරීම විනිවිදභාවයෙන් යුතුව සිදු කරනු ලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ සඳහන් පත් කිරීම්, ඊට පෙර පත් කළ සාමාජිකයාගේ ධුර කාලය අවසන් වීමට දින තිහකට නො අඩු කාලසීමාවක් තුළ පරිසමාප්ත කළ යුතු ය.

(7) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟත්වය ලැබුණු දින සිට දින තිහක කාලසීමාවක් ඇතුළත (1) වන උපවගන්තියේ සඳහන් පත්කිරීමක් සිදු කිරීමට ජනාධිපතිවරයා අපොහොසත් වන අවස්ථාවක දී, (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නිර්දේශ කරන ලදුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟත්වය ලද තැනැත්තා, ඒ කාලසීමාව ඉකුත් වන දින සිට බලපවත්වන පරිදි මහ බැංකුවේ අධිපතිවරයා ලෙස, පාලක මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ විශේෂඥයන් ලෙස පත් කරනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

පත් කළ සාමාජිකයකුගේ ධුර කාලය.

**17.** (1) පත් කළ සාමාජිකයකුගේ ධුර කාලය ඔහු පත් කිරීමේ දින සිට ආරම්භ වන වසර හයක කාලසීමාවක් විය යුතු ය.

(2) යම් පත් කළ සාමාජිකයකු ස්වකීය ධුර කාලය අවසන් වීමට පෙරාතුව තම ධුරය අත්හරින අවස්ථාවක දී, එසේ ධුරය අත්හරින පත් කළ සාමාජිකයාගේ ධුර කාලයෙහි ඉකුත් නොවී ඇති ධුර කාලය තුළ ඔහු වෙනුවට ධුරය දැරීමට වෙනත් තැනැත්තකු 16 වන වගන්තියට අනුකූලව දින හැටක කාලසීමාවක් ඇතුළත පත් කරනු ලැබිය යුතු ය.

(3) කාලය ඉක්මයාමෙන් ධුරය අත්හරින යම් පත් කළ සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලැබිය යුතු යː

එසේ වුවද, ඒ යම් සාමාජිකයකුගේ මුළු ධුර කාලය වසර දොළහක කාලසීමාවක් නො ඉක්ම විය යුතු ය.

මහ බැංකුවේ අධිපතිවරයාගේ සහ අනෙකුත් පත් කළ සාමාජිකයන්ගේ සහ නියෝජ්‍ය අධිපතිවරුන්ගේ සුදුසුකම් සහ නුසුදුසුකම්.

**18.** (1) 16 වන වගන්තිය යටතේ පත් කරනු ලබන තැනැත්තන් සාමාජයීය සහ වෘත්තීයමය ජීවිතයේ දී කීර්තියක් අත්කර ගෙන ඇත්තා වූ ද ආර්ථික විද්‍යාව, මුදල් ප්‍රතිපත්ති, බැංකුකරණය, මූල්‍යය, ගිණුම්කරණය සහ විගණනය, නීතිය හෝ අවදානම් කළමනාකරණය යන ක්ෂේත්‍රවල වෘත්තීයමය හෝ අධ්‍යාපනික පළපුරුද්ද ඇත්තා වූ ද විශිෂ්ටත්වයට පත් සහ අවංකභාවයෙන් යුත් තැනැත්තන් විය යුතු ය.

(2) යම් තැනැත්තකු-

(අ) වංචාවක්, රැවටීමක්, වංකභාවයක් හෝ වෘත්තීයමය විෂමාචාරයක් හා සම්බන්ධ යම් ක්‍රියාවක් සිදු කරනු ලැබ ඇත්නම් හෝ සිදු කිරීමෙහිලා සම්බන්ධ වී ඇත්නම්;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයක දී, යම් නියාමන අධිකාරියක්, අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීමය සංගමයක්, පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක් හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක් විසින් වංචාවක්, රැවටීමක්, වංකභාවයක් හෝ වෙනත් ඒ හා සමාන අපරාධමය ක්‍රියාවක් සම්බන්ධයෙන් වූ චෝදනාවක් පිළිබඳ නොතීසියක් භාර දෙනු ලැබීමෙන් අනතුරුව ඒ පිළිබඳව විමර්ශනයකට හෝ පරීක්ෂණයකට භාජනය වී ඇත්නම්;

(ඈ) මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සිදු කරන ලද අපරාධයක් හෝ දුරාචාර හැසිරීමක් පිළිබඳ යම් වරදක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයක දී යම් අධිකරණයක් මගින් වරදකරු කර ඇත්නම්;

(ඇ) නිදහස් නො කරන ලද වස්තු භංගත්වයට පත්වූවකු වේ නම් හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් මගින් නිදහස් නො කළ බුන්වත් තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක යම් අධිකරණයක යම් නඩු තීන්දුවක් හෝ ආඥාවක් ඉටු කිරීමට හෝ ණයක් ආපසු ගෙවීමට අපොහොසත් වී ඇත්නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් මගින් සිහිවිකල තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්;

(උ) නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක නියමයක් මගින් ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයක යම් මූල්‍ය ආයතනයක හෝ සංස්ථාගත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ වෙනත් නිලධරයකු ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබ හෝ සේවය අත්හිටුවනු ලැබ ඇත්නම්;

(ඌ) (i) බලපත්‍රය අත්හිටුවනු ලැබ ඇති හෝ අවලංගු කරනු ලැබ ඇති; හෝ

(ii) ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයක දී, ගණන් බේරා වසා දමනු ලැබ ඇති හෝ ගණන් බේරා වසා දමමින් තිබෙන හෝ අනිවාර්ය ඈවර කිරීමකට ලක් වී ඇති,

යම් මූල්‍ය ආයතනයක ප්‍රධාන විධායක නිලධරයකු ව සිටියේ නම් හෝ වෙනත් යම් අධිකාරී බලය සහිත තනතුරක් දැරුවේ නම්;

(එ) පාර්ලිමේන්තුවේ හෝ පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක සාමාජිකයකු වේ නම් හෝ සාමාජිකයකු බවට පත් වන්නේ නම්;

(ඒ) රජයේ නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු වේ නම් හෝ ඒ නිලධරයකු බවට පත්වන්නේ නම් හෝ තම පූර්ව සේවානියුක්තියෙන් උද්ගත වන විශ්‍රාම ගැන්වීමේ ප්‍රතිලාභ නොවන වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික හෝ ප්‍රතිලාභ, රජයේ අරමුදල්වලින්, පළාත් සභා අරමුදල්වලින් හෝ යම් පළාත් පාලන ආයතනයක අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු වන්නා වූ ශාස්ත්‍රීය තනතුරක් නොවන යම් ධුරයක් හෝ තනතුරක්, තෝරා පත් කිරීමෙන් හෝ පත් කිරීමෙන් දරමින් සිටී නම්:

එසේ වුව ද, මේ උපවගන්තියේ කිසිවක් මගින්, (3) වන උපවගන්තිය යටතේ තාවකාලිකව මුදා හරිනු ලැබ ඇති මහ බැංකුවේ යම් නියෝජ්‍ය අධිපතිවරයකු, යම් ආයතනයක යම් ධුරයක් හෝ තනතුරක් දැරීමේ හේතුව නිසාම පමණක් මහ බැංකුවේ ඒ නියෝජ්‍ය අධිපතිවරයා අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ධුරයෙන් ඉවත් කිරීමට පාලක මණ්ඩලයට බලය දෙනු ලබන්නේ යයි අර්ථ නිරූපනය නො කළ යුතු ය:

එසේම තවදුරටත්, මේ උපවගන්තියේ කිසිවක් (3) වන උපවගන්තිය යටතේ රජයේ සංස්ථාවක ධුරයක හෝ තනතුරක සේවය කිරීමට තාවකාලිකව මුදාහරිනු ලැබ ඇති මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයකුට, ඒ නියෝජ්‍ය අධිපතිවරයා රජයේ නිලධරයකු ලෙස ඒ ධුරය හෝ තනතුර දරන අතරතුර දී මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ හෝ විධායක මණ්ඩලයේ සාකච්ඡාවලට සහභාගී වීමට හැකි කරවීමක් ලෙසින් තේරුම් ගනු නො ලැබිය යුතු ය;

(ඔ) දේශපාලන පක්ෂයක නිලයක් දරන්නේ නම්; හෝ

(ඕ) ශ්‍රී ලංකාව තුළ ඇති කාර්යාල හරහා කටයුතු කරනු ලබන මූල්‍ය ආයතනයක අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ සේවානියුක්තයකු ලෙස නැතහොත් මූල්‍ය ආයතනයක කොටස් ප්‍රාග්ධන හිමිකමක අර්ථලාභී හිමිකරුවකු ලෙස නැතහොත් වෙනත් යම් මූල්‍ය ආයතනයක කොටස් ප්‍රාග්ධන හිමිකමකින් සියයට පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක අර්ථලාභී හිමිකරුවකු ලෙස සිටී නම් හෝ එසේ පත් වන්නේ නම්,

ඒ තැනැත්තා, මහ බැංකුවේ අධිපතිවරයා ලෙස හෝ 8 වන හෝ 11 වන වගන්තිය යටතේ පිහිටුවන ලද යම් මණ්ඩලයක පත් කළ සාමාජිකයකු ලෙස හෝ මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයකු ලෙස පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කර ගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

(3) පාලක මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව යම් අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක, මේ පනත යටතේ මුල්‍ය ආයතනයක් නොවන ජාත්‍යන්තර රාජ්‍ය මුල්‍ය ආයතනයක හෝ රජයේ සංස්ථාවක යම් ධුරයක හෝ තනතුරක සේවය කිරීම සඳහා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයකු තාවකාලිකව මුදා හරිනු ලැබිය හැකි ය.

ධුරයෙන් ඉල්ලා අස්වීම.

**19.** 16 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් ධුරයක සේවය කරන යම් තැනැත්තකුට, ජනාධිපතිවරයා වෙත මාස තුනකට අඩු නොවන ලිඛිත දැන්වීමක් කිරීමෙන් ඒ ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

නුසුදුසුකම් සහ ධුරයෙන් ඉවත් කිරීම.

**20.** (1) 16 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති යටතේ පත් කරන ලද යම් තැනැත්තකු 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් කවරක් හෝ සිදුවීමෙන් පසුව ධුරය දැරීම නතර කළ යුතු ය.

(2) 16 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කළ යම් තැනැත්තකු -

(අ) මාස තුනකට වැඩි කාලසීමාවක් තිස්සේ පවත්නා ශාරීරික හෝ මානසික දුබලතාවයක් හේතුවෙන් සිය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ සිදු කිරීමට නොහැකි වී ඇති බවට;

(ආ) මහ බැංකුවේ අදාළ ආචාරධර්ම සංග්‍රහවලට අනුකූලව කටයුතු කර නොමැති බවට;

(ඇ) පාලක මණ්ඩලයේ අනුමතය නොමැතිව අඛණ්ඩව මාස තුනකට වැඩි කාලසීමාවක් සිය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ සිදු කිරීමට අපොහොසත් වී ඇති බවට; හෝ

(ඇ) 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර නුසුදුසු වන බවට,

අදාළ පත් කළ තැනැත්තාට කරුණු කියාපෑමට අවස්ථාවක් දීමෙන් පසුව පාලක මණ්ඩලය සෑහීමට පත්වන අවස්ථාවක දී, පාලක මණ්ඩලයේ ලිඛිත නිර්දේශයක් මත ජනාධිපතිවරයා විසින් ඒ තැනැත්තා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) 16 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත් කළ යම් තැනැත්තකු-

(අ) මාස තුනකට වැඩි කාලසීමාවක් තිස්සේ පවත්නා ශාරීරික හෝ මානසික දුබලතාවයක් හේතුවෙන් සිය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ සිදු කිරීමට නොහැකි වී ඇති බවට;

(ආ) මහ බැංකුවේ අදාළ ආචාරධර්ම සංග්‍රහවලට අනුකූලව කටයුතු කර නොමැති බවට; හෝ

(ඇ) පාලක මණ්ඩලයේ අනුමතය නොමැතිව අඛණ්ඩව මාස තුනකට වැඩි කාලසීමාවක් සිය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ සිදු කිරීමට අපොහොසත් වී ඇති බවට,

අදාළ තැනැත්තාට කරුණු කියාපෑමට අවස්ථාවක් දීමෙන් පසුව පාලක මණ්ඩලය සෑහීමට පත්වන අවස්ථාවක දී, පාලක මණ්ඩලයේ තීරණයක් මත, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ඒ තැනැත්තා ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) 16 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවලට අනුකූලව පත්කරන ලද කිසිදු තැනැත්තකු (2) වන හෝ (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති හේතු නොවන වෙනත් හේතු මත ධුරයෙන් ඉවත් කරනු නො ලැබිය යුතු ය.

තදනන්තර ක්‍රියා මත වූ සීමා කිරීම.

**21.** පාලක මණ්ඩලයේ, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ හෝ විධායක මණ්ඩලයේ සාමාජිකයකුව සිටීම නතර කරන්නා වූ යම් තැනැත්තකු, ඒ නතර කිරීමේ දින සිට වසරක කාලසීමාවක් ඉකුත් වන තෙක් යම් මූල්‍ය ආයතනයක් තුළ හෝ යම් මූල්‍ය ආයතනයක් වෙනුවෙන් කවර හෝ තත්ත්වයකින් සේවය නො කළ යුතු ය.

පාරිශ්‍රමික.

**22.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මහ බැංකුවේ අධිපතිවරයාගේ පාරිශ්‍රමිකය සහ පත් කළ සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කරන ලද පාරිශ්‍රමික මුදල සහ දීමනා පිළිබඳව ඒ අධිපතිවරයාට සහ පත් කළ සාමාජිකයන්ට නිකුත් කරනු ලබන පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු අතර, ඒ පාරිශ්‍රමික මුදල හෝ දීමනා ඒ මහ බැංකු අධිපතිවරයාගේ සහ පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය තුළ දී අඩු නො කළ යුතු ය.

(3) කිසිදු පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් මහ බැංකුවේ ලාභ හෝ එහි ආදායම් කිසිවක් මත පදනම් නො විය යුතු ය.

ආචාරධර්ම සංග්‍රහ.

**23.** පාලක මණ්ඩලය විසින් මහ බැංකුවේ පාලක මණ්ඩලයේ, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සහ විධායක මණ්ඩලයේ සාමාජිකයන්ට අදාළ වන ආචාර ධර්ම සංග්‍රහ පිළිගනු ලැබිය යුතු ය.

## III වන කොටස

## මහ බැංකුවේ සේවානියුක්තයන්

මහ බැංකුවේ සේවානියුක්තයන් පත් කිරීම සහ ඉවත් කිරීම.

**24.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, පාලක මණ්ඩලය විසින්, 16 වන වගන්තියේ (2) වන උපවගන්තියට යටත්ව, මහ බැංකුවේ සේවානියුක්තයන් පත් කිරීම සහ ඉවත් කිරීම කළ හැකි අතර, පාරිශ්‍රමික ඇතුළුව ඔවුන්ගේ සේවානියුක්ති නියම සහ කොන්දේසි නියම කරනු ලැබිය හැකි ය.

(2) කිසිදු පාරිශ්‍රමිකයක් මහ බැංකුවේ ලාභ හෝ එහි ආදායම් කිසිවක් මත පදනම් නො විය යුතු ය.

(3) පාලක මණ්ඩලය විසින්, සේවානියුක්තයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සහ නාමිකයන්ගේ සුබසාධනය සඳහා විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් හෝ යෝජනාක්‍රම පිහිටුවීම සහ නියාමනය කිරීම කළ හැකි අතර, ඒ යම් අරමුදල්වලට හෝ යෝජනාක්‍රමවලට දායක වීම කළ හැකි ය.

(4) 114 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, පාලක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නියමවලට සහ කොන්දේසිවලට යටත්ව, පාලක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාර්ය සඳහා මහ බැංකුවේ සේවකයන්ට ණය සහ අත්තිකාරම් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

සේවානියුක්තයන් විසින් වෙනත් යම් ධුරයක් භාර ගැනීම නො කළ යුතු බව.

**25.** (1) මහ බැංකුවේ සේවානියුක්තයන්, ස්වකීය වෘත්තීයමය සේවාවන් මහ බැංකුව වෙත කැප කළ යුතු අතර, මහ බැංකුවේ නාමිකයකු ලෙස නැතහොත් අධ්‍යාපනික හෝ ශාස්ත්‍රීය කාර්ය වෙනුවෙන් මිස සහ ඒ කාර්ය ඒ සේවානියුක්තයාගේ මහ බැංකුවේ ස්වකීය වෘත්තීයමය සේවා හා ගැටීමක් සිදු නොවන්නේ නම් ද, ඒ වෘත්තීයමය සේවා මහ බැංකුව වෙත කැප කිරීමේ හැකියාව වළක්වනු නො ලබන්නේ නම් ද සහ ඒ කාර්ය ඒ සම්බන්ධයෙන් පාලක මණ්ඩලය නිශ්චය කරනු ලබන සීමාවන් තුළ පවතින්නේ නම් ද මිස, මහ බැංකුවේ සේවානියුක්තයන් විසින් රජයේ හෝ පෞද්ගලික අංශයේ වුව ද, පාරිශ්‍රමික සහිත හෝ පාරිශ්‍රමික රහිත වුව ද යම් ධුරයක් හෝ සේවානියුක්තියක් භාරගැනීම හෝ දැරීම නො කළ යුතු ය.

(2) පාලක මණ්ඩලය විසින්, යම් අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක, ජාත්‍යන්තර රාජ්‍ය මූල්‍ය ආයතනයක හෝ මූල්‍ය ආයතනයක් නොවන රාජ්‍ය සංස්ථාවක ඉල්ලීම මත, මහ බැංකුවේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ කැමැත්ත ඇතිව, පාලක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නියමවලට සහ කොන්දේසිවලට යටත්ව ඒ අමාත්‍යාංශයේ, දෙපාර්තමේන්තුවේ, ජාත්‍යන්තර රාජ්‍ය මූල්‍ය ආයතනයේ හෝ රාජ්‍ය සංස්ථාවේ යම් ධුරයක හෝ තනතුරක සේවය කිරීමට තාවකාලිකව මුදාහරිනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය අනුව යම් ධුරයක හෝ තනතුරක සේවය කිරීමට මුදාහරිනු ලබන මහ බැංකුවේ යම් නිලධරයකු, මේ පනතේ විධිවිධාන යටතේ මහ බැංකුවේ ඔහුගේ ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් ඒ නිලධරයා ඒ ධුරයෙන් හෝ තනතුරෙන් ඉවත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ආචාර ධර්ම සංග්‍රහය.

**26.** පාලක මණ්ඩලය විසින් මහ බැංකුවේ සේවානියුක්තයන්ට අදාළ වන ආචාරධර්ම සංග්‍රහයක් පිළිගනු ලැබිය යුතු ය.

IV වන කොටස

**උද්ධමන ඉලක්කය**

**27.** (1) මහ බැංකුව විසින් ළඟා කර ගත යුතු උද්ධමන ඉලක්කය දැක්වෙන මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමක් අමාත්‍යවරයා සහ මහ බැංකුව විසින් අත්සන් කළ යුතු ය. උද්ධමන ඉලක්කය.

(2) අමාත්‍යවරයා විසින්, උද්ධමන ඉලක්කය සහ ඊට අදාළ වන වෙනත් පරාමිතීන් ද ඇතුළුව මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම, ඒ ගිවිසුමේ දින සිට සතියක කාලසීමාවක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(3) අමාත්‍යවරයා සහ මහ බැංකුව විසින්, උද්ධමන ඉලක්කය සහ ඊට අදාළ වන වෙනත් පරාමිතීන් සෑම වසර තුනකට වරක් හෝ සුවිශේෂී තත්ත්වයන් මත අවශ්‍ය වන්නේ නම් වෙනත් යම් කාලපරාස අනුව සමාලෝචනය කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින්, ඒ සමාලෝචනයෙන් පසුව එසේ සමාලෝචනය කරන ලද උද්ධමන ඉලක්කය සහ ඊට අදාළ වෙනත් පරාමිතීන් සහ ඒ සමාලෝචනයට පාදක වූ සුවිශේෂී අවස්ථානුගත තත්ත්වයන් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ (1) වන සහ (3) වන උපවගන්තිවලට අනුව නිශ්චය කරන ලද ආන්තිකයකින් උද්ධමන ඉලක්කය සපුරාලීමට මහ බැංකුව අනුක්‍රමික කාර්තු දෙකක දී අපොහොසත් වුවහොත් මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් -

(අ) උද්ධමන ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වීමට හේතු;

(ආ) මහ බැංකුව විසින් ගත යුතු යයි යෝජිත ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග; සහ

(ඇ) උද්ධමන ඉලක්කය සාක්ෂාත් කර ගත යුතු කාලසීමාව පිළිබඳ ඇස්තමේන්තුවක්,

දක්වමින් වාර්තාවක් අමාත්‍යවරයා මගින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, ඒ වාර්තාව මහජනතාවට ද ලබා ගත හැකි විය යුතු ය.

(5) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින්, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සහ ඒ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ වෙනත් උපකරණ තීරණය කරනු ලැබිය යුතු අතර, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ඒ උපකරණ අවශ්‍ය පරිදි සකසා ගැනීමට අධිකාරී බලය මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයට තිබිය යුතු ය.

උද්ධමනය පිළිබඳ වාර්තාව පළ කිරීම.

**28.** මහ බැංකුව විසින්, මාස හයකට වරක් උද්ධමනයේ මෑතකාලීන සංචලනයන්, උද්ධමනයේ ප්‍රභවයන් සහ උද්ධමනය පිළිබඳ මධ්‍යකාලීන ප්‍රක්ෂේපණ සහ ඒ ප්‍රක්ෂේපණ කෙරෙහි වන ප්‍රධාන අවදානම් විස්තර කරමින් වාර්තාවක් පළ කරනු ලැබිය යුතු ය.

මිල ස්ථායීතාවය සුරක්ෂිත කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග.

**29.** (1) ශ්‍රී ලංකාව තුළ දේශීය මිල ස්ථායීතාවයට තර්ජනයක් විය හැකි ආර්ථික බාධාවන් සිදුවෙතැයි මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය අපේක්ෂා කරන අවස්ථාවක දී හෝ ඒ දේශීය මිල ස්ථායීතාවයට සත්‍ය වශයෙන් ම අන්තරායකාරී වන්නා වූ මිල මට්ටමේ අසාමාන්‍ය සංචලනයන් පවතින අවස්ථාවක දී-

(අ) අවස්ථානුගත තත්ත්වයන් අනුව සුදුසු වන සහ මේ පනතින් බලය දී ඇති යම් ප්‍රතිපත්ති පිළිගැනීම සහ ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීමට සැලැස්වීම;

(ආ) අවම වශයෙන්-

(i) අපේක්ෂිත ආර්ථික බාධාවලට හේතු හෝ මිල මට්ටමේ ඇති වූ තථ්‍ය අසාමාන්‍ය සංචලනවලට හේතු;

(ii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදන මට්ටම, සේවා නියුක්තිය සහ ආදායම කෙරෙහි ඒ බාධාවලින් හෝ සංචලනවලින් විය හැකි ප්‍රතිවිපාක; සහ

(iii) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ගත යුතු යයි එය විසින් යෝජනා කරන හෝ රජය විසින් අනුගමනය කළ යුතු යයි එය විසින් නිර්දේශ කරන මුදල්මය, රාජ්‍ය මූල්‍ය හෝ පරිපාලනමය ක්‍රියාමාර්ග,

පිළිබඳ විශ්ලේෂණයක් ඇතුළත් විය යුතු විස්තරාත්මක වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම සහ මහජන සුභසිද්ධියට අගතියක් නොවන්නේ නම්, එය ප්‍රසිද්ධ කිරීම,

මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ වගකීම විය යුතු ය.

(2) පළමුවන වාර්තාව ඉදිරිපත් කිරීමට හේතු වූ අවස්ථානුගත කරුණු දේශීය මිල ස්ථායීතාවයට තර්ජනයක් ව පවතින තාක් කල්, තවදුරටත් වාර්තා කාලීනව ඉදිරිපත් කිරීමට මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් කටයුතු කළ යුතු ය.

## V වන කොටස

### මුදල් සහ වෙනත් මෙහෙයුම්

ගිණුම් විවෘත කිරීම.

**30.** (1) ස්වකීය මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී මහ බැංකුව විසින්-

(අ) මූල්‍ය ආයතන, විදේශීය බැංකු සහ රාජ්‍ය අස්ථිත්ව;

(ආ) මහ බැංකු, ජාත්‍යන්තර රාජ්‍ය මූල්‍ය ආයතන, විදේශීය ආණ්ඩු ඇතුළු ජාත්‍යන්තර සංවිධාන සහ ආධාර දෙන සංවිධාන,

වෙනුවෙන් එහි පොත්වල මුදල්, වටිනා ලෝහ සහ සුරැකුම්පත් ගිණුම් විවෘත කර පවත්වාගෙන යා හැකි ය.

(2) මහ බැංකුව විසින් ස්වකීය පොත්වල ගිණුම් විවෘත කිරීම සම්බන්ධයෙන් වන කොන්දේසි, නියම කරනු ලැබිය හැකි ය.

(3) මහ බැංකුව විසින්-

(අ) මහ බැංකුවේ නියාමනයට සහ අධීක්ෂණයට යටත් වන්නා වූ මූල්‍ය ආයතනවල;

(ආ) මහ බැංකු, සුරක්ෂිතාගාර, විදේශීය බැංකු සහ ජාත්‍යන්තර රාජ්‍ය මූල්‍ය ආයතන ඇතුළු ජාත්‍යන්තර සංවිධානවල,

පොත්වල මුදල්, වටිනා ලෝහ සහ සුරැකුම්පත් ගිණුම් විවෘත කර පවත්වාගෙන යා හැකි ය.

මහ බැංකුවේ භාරකාර සේවා.

**31.** මහ බැංකුව විසින් වෙළෙඳපොළ අනුපාතිකවලට සමගාමී වන ගාස්තු ගෙවීමට යටත්ව සහ පාලක මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්ව, මහ බැංකුව විසින් නම් කරනු ලබන්නා වූ නාමනය කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි වෙනුවෙන් සහ පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි සුරැකුම්පත්, වටිනා ලෝහ සහ වෙනත් යම් වටිනා වත්කම් වෙනුවෙන් මූල්‍ය ආයතනවලට, භාරකාර සේවා සලසනු ලැබිය හැකි ය.

විවෘත වෙළෙඳපොළ මෙහෙයුම්.

**32.** (1) මහ බැංකුවේ අරමුණු ඉටු කර ගැනීම සහ එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම පිණිස මහ බැංකුව විසින්-

(අ) ඍජු මිලදී ගැනීම් සහ විකිණීම් මගින් හෝ ප්‍රතිමිල දී ගැනීමේ ගිවිසුමක් යටතේ සහ වටිනා ලෝහ මෙන්ම හිමිකම් සහ අලෙවි කළ හැකි සාධන පත්‍ර ණයට දීම හෝ ණයට ගැනීම මගින් මූල්‍ය වෙළෙඳපොළ කටයුතු සිදු කිරීම;

(ආ) ප්‍රමාණවත් සමපාර්ශ්වීය ද්‍රව්‍ය මත පදනම්ව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී බැංකු සහ අනෙකුත් වෙළෙඳපොළ සහභාගීකරුවන් සමඟ ණය මෙහෙයුම් සිදු කිරීම; හෝ

(ඇ) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි නියමයන් සහ කොන්දේසි මත සහ ආකාරයකින් සුරැකුම්පත් නිකුත් කිරීම,

සිදු කරනු ලැබිය හැකි ය.

(2) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින්-

(අ) මුදල් ප්‍රතිපත්තියේ කාර්යය සඳහා විවට වෙළෙඳපොළ මෙහෙයුම් සහ ණය මෙහෙයුම් වෙනුවෙන් භාවිත කරනු ලැබිය යුතු සාධන පත්‍ර සහ සමපාර්ශ්වීය ද්‍රව්‍ය වර්ග;

(ආ) (අ) ඡේදයේ කාර්ය සඳහා මහ බැංකුව විසින් ගනුදෙනුවලට එළඹිය හැක්කේ කවර කොන්දේසිවලට යටත්ව ද යන්න,

නිශ්චිතව දක්වමින් රීති සාදනු ලැබිය හැකි ය.

(3) පාලක මණ්ඩලය විසින්-

(අ) මූල්‍ය ප්‍රතිපත්තිය නොවන ණය මෙහෙයුම් සඳහා භාවිත කරනු ලැබිය යුතු සාධන පත්‍ර සහ සමපාර්ශ්වීය ද්‍රව්‍ය වර්ග; සහ

(ආ) (අ) ඡේදයේ කාර්ය සඳහා මහ බැංකුව විසින් ගනුදෙනුවලට එළඹිය හැක්කේ කවර කොන්දේසිවලට යටත්ව ද යන්න,

නිශ්චිතව දක්වමින් රීති සාදනු ලැබිය හැකි ය.

මූල්‍ය ආයතනවල සංචිත නියාමනය කිරීම.

**33.** (1) මහ බැංකුව විසින්-

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවලට; සහ

(ආ) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි යම් නිර්ණායක යටතට ගැනෙන (මේ පනතේ "අදාළ මූල්‍ය ආයතන" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් යම් මූල්‍ය ආයතනවලට,

ඔවුන්ගේ තැන්පතු බැරකම්වලට සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි ඔවුන්ගේ වෙනත් යම් මූල්‍යමය බැරකම්වලට එරෙහිව සංචිත පවත්වාගෙන යා යුතු බවට නියම කරනු ලැබිය යුතු අතර, ඒ කාර්යය සඳහා සංචිත පවත්වාගෙන යා යුත්තේ කවර තැන්පතු බැරකම් පන්තිවලට සහ වෙනත් මූල්‍යමය බැරකම් කාණ්ඩවලට එරෙහිව ද යන්න නියම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් හෝ අදාළ මූල්‍ය ආයතනයක් විසින් පවත්වාගෙන යා යුතු යයි නියම කරන ලද සංචිත, එහි එක් එක් පන්තියේ තැන්පතු බැරකම්වල පරිමාවට සහ එහි එක් එක් කාණ්ඩයේ වෙනත් මූල්‍ය බැරකම්වල පරිමාවට සමානුපාතික විය යුතු අතර, ඒ සංචිත (3) වන උපවගන්තියට යටත්ව, මහ බැංකුවේ රුපියල් තැන්පතු ආකාරයෙන් විය යුතු ය.

(3) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින්, ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයේ සහ බැංකු සහ මූල්‍ය පද්ධතිවල යහපත පිණිස, එසේ පවත්වාගෙන යනු ලැබිය යුතු සංචිතවලින් යම් කොටසක් මහ බැංකුවේ රුපියල් තැන්පතු නොවන වත්කම් ආකාරයෙන් පවත්වාගෙන යන ලෙස ඉල්ලා සිටිය හැකි ය.

**34.** (1) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින්, 33 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ, සංචිත පවත්වාගෙන යාමට නියම කරනු ලැබ ඇත්තේ යම් තැන්පතු බැරකම් පන්තිවලට සහ යම් වෙනත් මූල්‍යමය බැරකම් කාණ්ඩවලට එරෙහිව ද, ඒ එක් එක් පන්තිවලට සහ කාණ්ඩවලට අදාළ සංචිත අනුපාත නියම කරනු ලැබිය යුතු අතර, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් අවශ්‍යයයි සලකන පරිදි ඒ අනුපාත කලින් කලට වෙනස් කළ හැකි ය. මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් සංචිත අනුපාත නියම කළ යුතු බව.

(2) යම් තැන්පතු බැරකම් පන්තියකට හෝ යම් වෙනත් මූල්‍ය බැරකම් කාණ්ඩයකට එරෙහිව සංචිතයක් පවත්වාගෙන යා යුතු බවට යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ අදාළ මූල්‍ය ආයතනයකට නියම කරනු ලබන අවස්ථාවේ දී, මහ බැංකුව විසින්, රටේ ජාතික ආර්ථිකයේ සහ බැංකු සහ මූල්‍ය පද්ධතිවල යහපත පිණිස මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් එසේ තීරණය කරන්නේ නම්, සංචිතයක් හෝ එහි කොටසක් ලෙස පවත්වාගෙන යන මුදල මත මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් අනුප්‍රමාණයක් අනුව පොලියක්, අවස්ථාවෝචිත පරිදි, ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවට හෝ අදාළ මූල්‍ය ආයතනයට ගෙවනු ලැබිය යුතු ය.

(3) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් හෝ අදාළ මූල්‍ය ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන සංචිත, ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව හෝ අදාළ මූල්‍ය ආයතනය විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු යයි නියම කරන ලද සංචිතවලට වඩා අඩුවන අවස්ථාවක දී, ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් හෝ අදාළ මූල්‍ය ආයතනය විසින් ඒ ඌන මුදල් ප්‍රමාණය මත පොලියක් මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් අනුප්‍රමාණයක් අනුව මහ බැංකුව වෙත ගෙවනු ලැබිය යුතු ය.

**35.** බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ අදාළ මූල්‍ය ආයතනයක් විසින් 33 වන වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ පවත්වාගෙන යනු ලැබිය යුතු යයි නියම කරන ලද සංචිත නිතිපතා පවත්වාගෙන සංචිත ඌනතාවල ප්‍රතිඵල.

යාමට ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව හෝ අදාළ මූල්‍ය ආයතනය විසින් අපොහොසත් වන අවස්ථාවක දී මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින්, ජාතික ආර්ථිකයේ යහපත පිණිස-

(අ) ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව හෝ අදාළ මූල්‍ය ආයතනය විසින්, ණය ලබා ගැනීම හෝ ආයෝජන සිදුකිරීම තහනම් කරමින් හෝ සීමා කරමින්;

(ආ) ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ හෝ අදාළ මූල්‍ය ආයතනයේ ශුද්ධ ලාභය සම්පූර්ණයෙන් ම හෝ එහි නිශ්චිත කොටසක් එහි කොටස් හිමියන්ට ලාභාංශයක් ගෙවීමේ කාර්යය සඳහා අදාළ කර ගැනීම තහනම් කරමින්,

නියෝගයක් නිකුත් කළ හැකි ය.

මුදල් පාලන මෙහෙයුම් ක්‍රමවේද.

**36.** මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින්, මේ පනතින් බලය දෙනු ලැබිය හැකි වෙනත් මුදල් පාලන ක්‍රමවේද අනුගමනය කරන ලෙසට පාලක මණ්ඩලය වෙත නිර්දේශ කරනු ලැබිය හැකි ය.

මූල්‍ය ආයතනවලට ද්‍රවශීලිතා සහාය.

**37.** (1) පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් නියම සහ කොන්දේසි මත, විශේෂ අවස්ථානුගත කරුණුවල දී, මහ බැංකුව විසින්-

(අ) තත්කාලයේ පවතින එක් අවුරුදු භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට අඩු නොවිය යුතු යම් පොලී අනුපාතිකයක් යටතේ; සහ

(ආ) දින අනූඑකක කාලසීමාවක් නො ඉක්මවන කාලසීමාවක් සඳහා සහ මහ බැංකුව විසින් ගනු ලබන තීරණයකින් අනතුරුව, තවත් දින අනූඑකක කාලසීමාවක් නො ඉක්මවන වැඩිදුර කාලසීමාවකට අලුත් කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා,

මූල්‍ය ආයතනයක් වෙත හෝ ඒ මූල්‍ය ආයතනයේ ප්‍රතිලාභය සඳහා ද්‍රවශීලතා සහාය ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) මහ බැංකුව විසින් ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග නිශ්චිතව දක්වන වැඩපිළිවෙලක් පදනම් කරගෙන ඒ මූල්‍යමය සහාය ලබා දිය යුතු ය:

එසේ වුව ද, පාලක මණ්ඩලයේ මතය අනුව, ඒ මූල්‍ය ආයතනය නුබුන්වත්නම් සහ ණය සඳහා ප්‍රමාණවත් සමපාර්ශ්වීය ද්‍රව්‍ය සැපයීමට හැකියාව ඇත්නම් සහ ඒ මූල්‍යමය සහාය සඳහා වන ඉල්ලීම ද්‍රවශීලීතාව වර්ධනය කිරීමේ අවශ්‍යතාව මත පදනම්ව කර ඇත්නම් මිස, මහ බැංකුව විසින් ඒ කිසිදු බැඳීමක් ඇතිකර ගනු නො ලැබිය යුතු ය.

(3) මූලික දින අනූඑකක කාලය ඉකුත් වීමෙන් පසුව, (2) වන උපවගන්තිය යටතේ ප්‍රදානය කරන ලද ණය පහසුකම් අලුත් කිරීමේ දී ඒ ණය පහසුකම ආපසු ගෙවන බවට සහතික කෙරෙන ලිඛිතව වූ රජයේ ඇපයක් අවශ්‍ය වන්නේ ය. උපරිම අලුත් කිරීමේ කාලසීමාව දින අනූඑකක් විය යුතු අතර, ඉන්පසු ඒ ණය ගණුදෙනුව ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(4) පාලක මණ්ඩලය විසින්, මේ වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන හෝ අලුත් කරනු ලබන ණය ගනුදෙනු සුරක්ෂිත කිරීම සඳහා තැන්පත් කළ යුතු හෝ සැපයිය යුතු සමපාර්ශ්වීය ද්‍රව්‍යවල ස්වභාවය සහ අවම වටිනාකම තීරණය කරනු ලැබිය යුතු ය.

(5) මහ බැංකුව විසින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කරන ලද ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහායලත් මූල්‍ය ආයතන විසින් ක්‍රියාත්මක කර නොමැති බවට හෝ ඒ ක්‍රියාමාර්ගවලින් අපේක්ෂා කරන ලද ප්‍රතිඵල අත් වී නොමැති බවට අනාවරණය කර ගනු ලැබුවහොත්, මහ බැංකුව විසින්, 109 වන වගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිපාලන ක්‍රියාමාර්ග ඇතුළු සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය.

VI වන කොටස

**විදේශ විනිමය මෙහෙයුම් කටයුතු සහ ජාත්‍යන්තර සංචිත**

මහ බැංකුවේ විදේශ විනිමය මෙහෙයුම් කටයුතු.

**38.** (1) මහ බැංකුව විසින්-

(අ) විදේශ විනිමය වෙන්දේසි පැවැත්වීම මගින්;

(ආ) ව්‍යුත්පන්න ගනුදෙනු සිදුකිරීම මගින්;

(ඇ) ඍජු ගනුදෙනු සිදුකිරීම මගින්; හෝ

(ඈ) පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් යම් පිළිගත හැකි ක්‍රම මගින්,

විදේශ විනිමය මෙහෙයුම් කටයුතුවල නිරත විය හැකි ය.

(2) මහ බැංකුව විසින්-

(අ) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී වාණිජ බැංකු;

(ආ) රජය සමග සහ යම් ලිඛිත නීතියක් මගින් හෝ අන්‍යාකාරයකින් පිහිටුවන ලදුව රජය වෙනුවෙන් ක්‍රියාකරන යම් නියෝජ්‍යායතන;

(ඇ) විදේශීය වාණිජ සහ ආයෝජන බැංකු;

(ඈ) විදේශීය මහ බැංකු;

(ඉ) ජාත්‍යන්තර මූල්‍ය ආයතන; සහ

(ඊ) විදේශීය ආණ්ඩු, විදේශීය පළාත් ආණ්ඩු සහ විදේශීය ආණ්ඩු වෙනුවෙන් ක්‍රියා කරන නියෝජ්‍යායතන හෝ ආයතන,

සමග පමණක් විදේශ විනිමය මෙහෙයුම් කටයුතු සිදුකරනු ලැබිය හැකිය.

මහ බැංකුව විසින් විදේශ විනිමය මෙහෙයුම් කටයුතුවල දී කිසිදු කොමිස් මුදලක් භාර නොගත යුතු බව හෝ කිසිදු ගාස්තුවක් අයකිරීම නො කළ යුතු බව.

**39.** මහ බැංකුව විසින් විදේශ විනිමය මිලදී ගැනීමට හෝ විකිණීමට අදාළව ඒ මිල දී ගැනීම් හෝ විකිණීම් සම්බන්ධයෙන් ඇත්ත වශයෙන් ම දරන ලද විදුලි පණිවිඩ හෝ වෙනත් පිරිවැය හැර, කවර හෝ විස්තරයකට අයත් වන කොමිස් මුදලක් භාරගැනීම හෝ ගාස්තුවක් අය කිරීම නො කළ යුතු ය.

විදේශීය ආයතන වෙත ණය ලබාදීම සහ ඒ ආයතනවලින් ණය ලබා ගැනීම

**40.** (1) මහ බැංකුව විසින් 38 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ), (ඈ), (ඉ) සහ (ඊ) ඡේදවල සඳහන් යම් විස්තරයකට අයත් යම් ආයතනයක් වෙත යම් සමපාර්ශ්වීය ණය ප්‍රදානය කිරීම හෝ ඒ ආයතනයකින් ණය ලබාගැනීම සිදුකළ හැකි අතර, මහජන සුබසිද්ධිය පිණිස යෝග්‍ය වන හෝ හිතකර වන සහ මහ බැංකුවේ තත්ත්වය පිළිබඳ සැලකිල්ලට ගත් කල උචිත වන යම් ආයතන සමඟ වෙනත් ගනුදෙනුවල නිරත විය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි ලබා ගන්නා ලද යම් ණය මුදලක් මහ බැංකුව විසින් දරනු ලබන වත්කම් මගින් සුරක්ෂිත කරනු ලැබිය හැකි ය.

(3) මහ බැංකුව විසින් යම් විදේශීය වාණිජ බැංකුවක හෝ ආයෝජන බැංකුවක හෝ 38 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ), (ඈ), (ඉ) සහ (ඊ) ඡේදවල සඳහන් යම් ආයතනයක නියෝජිතයකු වශයෙන් හෝ සම්බන්ධීකාරකයකු වශයෙන් ක්‍රියා කරනු ලැබිය හැකි ය.

ජාත්‍යන්තර සංචිත කළමනාකරණය කිරීම.

**41.** (1) මහ බැංකුව විසින් සුරක්ෂිතභාවය, ද්‍රවශීලතාවය සහ ප්‍රතිලාභ පිළිබඳව ඒ පූර්වතාවයේ අනුපිළිවෙළ අනුව සැලකිල්ලට ගනිමින් ජාත්‍යන්තර යහපත් පරිචයන් සහ පාලක මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ සමඟ අනුකූල වන පරිදි නිල ජාත්‍යන්තර සංචිත කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතවලට පහත දැක්වෙන වත්කම් ඇතුළත් විය හැකි යඃ-

(අ) රත්‍රන් නියෝජනය කෙරෙන බැර ශේෂ ද ඇතුළුව රත්‍රන්;

(ආ) පහත දැක්වෙන ස්වභාවයෙන් යුත්, නිදහසේ පරිවර්තනය කළ හැකි විදේශ ව්‍යාවහාර මුදල්වලින් නාමනය කරන ලද වත්කම්; එනම්-

(i) මහ බැංකුව විසින් දරනු ලබන හෝ මහ බැංකුවේ බැරට පවතින විදේශීය නෝට්ටු සහ කාසි;

(ii) ඉල්ලූ විට හෝ කෙටි කාලයක් තුළ ගෙවිය යුතු වන, මහ බැංකුවේ ගිණුම්වල, විදේශීය මහ බැංකුවල

සහ වාණිජ බැංකුවල හෝ ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල පොත්වල දරනු ලබන බැර ශේෂ සහ අන්තර් බැංකු තැන්පතු;

(iii) පළාත් ආණ්ඩු, විදේශීය මහ බැංකු, ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ නියෝජ්‍යායතන ඇතුළු විදේශීය ආණ්ඩු විසින් නිකුත් කරනු ලබන හෝ තහවුරු කරනු ලබන පහසුවෙන් අලෙවි කළ හැකි ණය සුරැකුම්පත්;

(ඇ) පාලක මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන පරිදි වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තුළ දරන ගැනුම් හිමිකම්වල සමස්ථය හෝ ඒ සමස්ථයෙන් යම් උපරිම ප්‍රතිශතයක්; සහ

(ඈ) පාලක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ, නිදහසේ පරිවර්තනය කළ හැකි විදේශ ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද වෙනත් යම් පහසුවෙන් අලෙවි කළ හැකි මූල්‍ය වත්කම්.

(3) ජාත්‍යන්තර සංචිතවල යම් පහත වැටීමක් ඇති බවට හෝ පහත වැටීමේ ඉඩකඩක් පවතින බවට හෝ මහ බැංකුවේ අරමුණු අවදානමකට ලක් විය හැකි මට්ටමක් දක්වා ඒ සංචිත ළඟාවනු ඇති බවට සහ මහ බැංකුවට ස්වකීය ක්‍රියාමාර්ග මගින් ඒ පහත වැටීම සඳහා පිළියම් කළ නොහැකි බවට මහ බැංකුව සෑහීමට පත් වන අවස්ථාවක දී, ඒ පහත වැටීමට හේතු සහ ඒ පහත වැටීම සම්බන්ධයෙන් පිළියම් කිරීම සඳහා වූ නිර්දේශ ද ඇතුළුව, ඒ පහත වැටීම පිළිබඳව මහ බැංකුව විසින් අමාත්‍යවරයා වෙත ලිඛිතව වාර්තා කරනු ලැබිය යුතු ය.

විනිමය මෙහෙයුම් කටයුතු පිළිබඳ තොරතුරු.

**42.** (1) සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම, විධායක මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් අවසානයේ ව්‍යාපාරික කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව, ඒ කාලසීමාව තුළ දී සිදුකරන ලද විදේශ විනිමය මිලදී ගැනීම් සහ විකිණීම් ප්‍රමාණය සහ සංයුතිය නිශ්චිතව දක්වමින් වාර්තාවක් මහ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ මිලදී ගැනීම්වලට

සහ විකිණීම්වලට අදාළව සහ විදේශ ව්‍යවහාර මුදල්වලින් වූ ස්වකීය ගිණුම්වල සංචලනවලට අදාළව මහ බැංකුව විසින් නියම කරනු ලැබිය හැකි යම් අතිරේක තොරතුරු ද සපයනු ලැබිය යුතු ය.

(2) කවර හෝ හැඩයකින් හෝ ආකෘතියකින් යුතු වන රත්‍රන්, සහ විදේශ විනිමයෙන් වූ සියලුම ගනුදෙනු හෝ මෙහෙයුම් කටයුතු පිළිබඳව යම් නිශ්චිත කාලවල දී හෝ කාල පරාස තුළ දී මහ බැංකුව වෙත වාර්තා ඉදිරිපත් කරන ලෙස විධායක මණ්ඩලය විසින් වෙනත් යම් තැනැත්තකු වෙත නියම කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන සෑම වාර්තාවක් ම, තත්කාර්ය සඳහා විධායක මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් විය යුතු ය.

(4) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ වෙනත් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක සඳහන් යම් ප්‍රකාශයක නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමේ කාර්යය සඳහා මහ බැංකුව විසින් අවශ්‍ය බවට සලකනු ලබන ඒ බලපත්‍රලාභී බැංකුව හෝ වෙනත් තැනැත්තා විසින් පවත්වාගෙන යනු ලබන යම් පොත් සහ ගිණුම් මහ බැංකුව විසින් පරීක්ෂා කිරීම හෝ විභාග කිරීම හෝ ඒ පොත් සහ ගිණුම් ස්වකීය භාරයට ගැනීම හෝ සිදු කළ හැකි ය.

වාණිජ බැංකු විසින් දරන විදේශ විනිමය ප්‍රමාණය පාලනය කිරීම.

**43.** (1) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සාමාන්‍යයෙන් විදේශ ව්‍යාවහාර මුදල්වලින් හෝ යම් නිශ්චිත ව්‍යවහාර මුදලකින් හෝ මුදල්වලින් දරනු ලැබිය හැකි ක්‍රියාකාරී ශේෂයේ උපරිම මුදල තීරණය කරන ආකාරය පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි අතර, ඒ උපරිම මුදල ඉක්මවමින් පවතින අතිරික්ත මුදල් සියල්ල හෝ එහි යම් නිශ්චිත කොටසක් මහ බැංකුව වෙත අලෙවි කරන ලෙස පාලක මණ්ඩලය විසින් ඒ බැංකු වෙත නියම කරනු ලැබිය හැකි ය.

(2) පාලක මණ්ඩලය විසින්, යම් නිශ්චිත බලපත්‍රලාභී වාණිජ බැංකුවක විශේෂ අවශ්‍යතා පිළිබඳව සැලකිල්ලට ගෙන, (1) වන උපවගන්තිය යටතේ යම් නිශ්චිත ව්‍යවහාර මුදලක් සඳහා තීරණය කරන ලද උපරිම මුදල ඉක්මවමින් ඒ ව්‍යවහාර මුදලින් ක්‍රියාකාරී ශේෂ දැරීම සඳහා ඒ බැංකුව වෙත අවසර ලබාදිය හැකි ය.

(3) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක විදේශ ව්‍යාවහාර මුදලින් පවතින ක්‍රියාකාරී ශේෂයන් (1) වන උපවගන්තිය යටතේ තීරණය කරන ලද උපරිම මුදල ඉක්මවා යන්නේ ද යන්න නිශ්චය කිරීමේ දී, ඒ ශේෂයෙන්, පළමුව සඳහන් ව්‍යවහාර මුදල් නිදහසේ පරිවර්තනය කරනු ලැබිය හැක්කේ යම් ව්‍යවහාර මුදලකට ද ඒ ව්‍යවහාර මුදලින් ඒ බැංකුවේ පවතින ශුද්ධ බැරකම් ප්‍රමාණය අඩු කරනු ලැබිය හැකි ය.

## VII වන කොටස

### ව්‍යවහාර මුදල් සහ වලංගු මුදල්

ව්‍යවහාර මුදල්.

**44.** (1) ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල ශ්‍රී ලංකා රුපියල වන්නේ ය. ශ්‍රී ලංකා රුපියල එක් එක් ඒකකය "සතය" යනුවෙන් හඳුන්වනු ලබන ඒකක සියයකට බෙදනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලංකා ව්‍යවහාර මුදල, ඒකක ව්‍යවහාර මුදලක් වීම අවශ්‍ය යයි පාලක මණ්ඩලයේ අදහස වන අවස්ථාවක දී, පාලක මණ්ඩලය විසින් ඒ පිළිබඳව අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය හැකි අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමේ දින සිට එක් අවුරුද්දකට පසු නොවන දිනයක සිට ගනුදෙනුවල දී "සතය" භාවිත කිරීම අහෝසි කරනු ලැබිය හැකි ය.

නිකුත් කිරීමේ බලතල.

**45.** ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පරම අයිතිය සහ අධිකාරිය මහ බැංකුව සතු වන්නේ ය.

මහ බැංකුව හැර වෙනත් යම් තැනැත්තකු විසින් මුදල් නෝට්ටු නිකුත් කිරීම තහනම් බව.

**46.** (1) මහ බැංකුව හැර, වෙනත් කිසිදු තැනැත්තකු විසින් යම් විනිමය බිල්පතක්, පොරොන්දු නෝට්ටුවක් හෝ ඉල්ලූ විට ධාරකයාට ගෙවිය යුතු මුදලක් ගෙවීම සඳහා ගිවිස ගැනීමක් අණ කිරීම, භාරගැනීම, පිළියෙල කිරීම හෝ නිකුත් කිරීම නැතහොත් යම් තැනැත්තකු විසින් ඉල්ලූ විට ධාරකයාට ගෙවිය යුතු වන බිල්පත් හෝ නෝට්ටු මත වන යම් මුදලක් හෝ මුදල් ණයට ගැනීම, ණයගැතිව සිටීම හෝ ලබාගැනීම නො කළ යුතු යඃ

එසේ වුව ද, බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ඔවුන්ගේ නියෝජිතයන්ගේ ගනුදෙනුකරුවන් සහ තැන්පත්කරුවන් විසින්, ඒ බැංකු සහ නියෝජිතයන් වෙත ඒ බැංකු සහ නියෝජිතයන්

සන්තකයේ ඇති සහ චෙක්පත් හෝ අණකර සම්බන්ධයෙන් අණ කරන තැන්ත්තාගේ අභිමතය මත ඒ බැංකු හා නියෝජිතයන් විසින් දරනු ලබන මුදල් විෂයයෙහි, ඉල්ලූ විට ධාරකයාට ගෙවිය යුතු වන චෙක්පත් හෝ අණකර, අණකරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරනු ලබන සෑම තැනැත්තකුම වරදක් සිදුකරන්නේ ය.

නෝට්ටු සහ කාසි පිළිබඳ වගකීම.

**47.** (1) මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි, මහ බැංකුවේ වගකීම් විය යුතු ය.

(2) මහ බැංකුව භාරයේ පවතින ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි, එහි ව්‍යවහාර මුදල් නිකුතුවේ කොටසක් වශයෙන් සලකනු නො ලැබිය යුතු අතර, මහ බැංකුවේ වත්කම් සහ වගකීම් තීරණය කිරීමේ දී සැලකිල්ලට නො ගත යුතු ය.

ව්‍යවහාර මුදල්,වලංගු ව්‍යවහාර මුදල් විය යුතු බව.

**48.** (1) මහ බැංකුව විසින් නිකුත් කරන ලද සියලුම ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි, ඕනෑම වටිනාකමක් ගෙවීම සඳහා ශ්‍රී ලංකාවේ වලංගු මුදල් වන්නේ ය.

(2) ශ්‍රී ලංකාවේ වාසිකයන් අතර සිදු කරන හෝ පියවනු ලබන යම් ගනුදෙනුවක්, මහ බැංකුව විසින් අන්‍යාකාරයෙන් බලය දී ඇත්නම් මිස, ශ්‍රී ලංකා රුපියල්වලින් සිදුකළ යුතු ය.

සමරු ව්‍යවහාර මුදල් නෝට්ටු හෝ කාසි නිකුත් කිරීම.

**49.** (1) මහ බැංකුව විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව සහ 50 වන වගන්තියට යටත්ව, සමරු ව්‍යවහාර මුදල් නෝට්ටු හෝ කාසි නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් සමරු ව්‍යවහාර මුදල් නෝට්ටු හෝ කාසි, ඒ නෝට්ටුවල හෝ කාසිවල නිශ්චිතව ප්‍රදර්ශනය කර ඇති මිලට වඩා වැඩි මිලකට සහ අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයකට අලෙවි කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සමරු ව්‍යවහාර මුදල් නෝට්ටු හෝ කාසි, ඒ ව්‍යවහාර මුදල් නෝට්ටුවල හෝ කාසිවල නිශ්චිතව ප්‍රදර්ශනය කර ඇති මිලට වඩා වැඩි මිලකට අලෙවි කිරීම 56 වන හෝ 57 වන වගන්තිය උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු නො ලැබිය යුතු ය.

(4) සමරු ව්‍යවහාර මුදල් නෝට්ටු හෝ කාසි හැර ව්‍යවහාර මුදල් නෝට්ටුවලින් හෝ කාසිවලින් සකස් කරන ලද ප්‍රදර්ශන අයිතම පාලක මණ්ඩලයේ අනුමතය ඇතිව ඒ නෝට්ටුවල හෝ කාසිවල නිශ්චිතව ප්‍රදර්ශනය කර ඇති මිලට වඩා වැඩි මිලකට අලෙවි කරනු ලැබිය හැකි අතර, ඒ ව්‍යවහාර මුදල් නෝට්ටු හෝ කාසිවල නිශ්චිතව ප්‍රදර්ශනය කර ඇති මිලට වඩා වැඩි මිලකට ඒ අයිතම අලෙවි කිරීම 56 වන හෝ 57 වන වගන්තිය උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු නො ලැබිය යුතු ය.

ව්‍යවහාර මුදල්වල ගති ලක්ෂණ.

**50.** (1) මහ බැංකුව විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන ව්‍යවහාර මුදල් නෝට්ටුවල සහ කාසිවල වටිනාකම, දිග පළල, මෝස්තරය, සලකුණු සහ වෙනත් ගති ලක්ෂණ නියම කරනු ලැබිය යුතු ය.

(2) සෑම ව්‍යවහාර මුදල් නෝට්ටුවක ම අමාත්‍යවරයාගේ සහ මහ බැංකුවේ අධිපතිවරයාගේ අත්සන්වල අනුරුවක් ඇතුළත් විය යුතු අතර, එහි මුහුණතෙහි ශ්‍රී ලංකා රජය වෙනුවෙන් නිකුත් කරන ලද බව සඳහන් කරනු ලැබිය යුතු ය.

නෝට්ටු මුද්‍රණය කිරීම සඳහා සහ කාසි ටංකනය කිරීම සඳහා වන ගිවිසුම්.

**51.** ව්‍යවහාර මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම සඳහා සහ කාසි ටංකනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයක සිටින වෙනත් යම් තැනැත්තකු සමඟ ගිවිසුම්වලට ඇතුළත් වීමට මහ බැංකුවට අධිකාරි බලය තිබිය යුතු ය.

ව්‍යවහාර මුදල් හුවමාරුව.

**52.** ඉල්ලීමක් කිරීම මත සහ රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, මහ බැංකුව විසින් නිකුත් කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි කිසිදු ගාස්තුවකින් හෝ කොමිස් මුදලකින් තොරව මහ බැංකුව විසින් හුවමාරු කරනු ලැබිය යුතු ය.

සංසරණය සඳහා යෝග්‍ය නොවන මුදල් ප්‍රතියෝජනය කිරීම.

**53.** සංසරණය සඳහා කවර හෝ හේතුවක් නිසා යෝග්‍ය නොවන සියලුම ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි මහ බැංකුව විසින් සංසරණයෙන් ඉවත් කර අවලංගු කරනු ලැබිය යුතු අතර, ප්‍රායෝගිකව හැකි ඉක්මනින් සහ පාලක මණ්ඩලය විසින් තත්කාර්ය සම්බන්ධයෙන් සාදනු ලබන රීතිවලට යටත්ව, ඒ මුදල් නෝට්ටු සහ කාසි වෙනුවට යෝග්‍ය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි, හුවමාරු කිරීම මගින් ප්‍රතියෝජනය කරනු ලැබිය යුතු ය.

**54.** (1) පාලක මණ්ඩලය විසින්, ස්වකීය අභිමතය පරිදි, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින්, ඕනෑම නිකුතුවක හෝ වටිනාකමක ව්‍යවහාර මුදල් නෝට්ටු හෝ කාසි, ප්‍රතියෝජනය සඳහා කැඳවනු ලැබිය හැකි ය. ව්‍යවහාර මුදල් නිදහස් කිරීම.

(2) මේ වගන්තිය ප්‍රකාරව ප්‍රතියෝජනය කිරීම සඳහා කැඳවන ලද යම් ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි එසේ කැඳවන ලද දිනයේ සිට පාලක මණ්ඩලය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි එක් අවුරුද්දක් නො ඉක්මවන කාලයක් සඳහා වලංගු ව්‍යවහාර මුදල් වශයෙන් පැවතිය යුතු අතර, ඉන්පසුව ඒවා වලංගු ව්‍යවහාර මුදල් වීම අවසන් වන්නේ ය.

(3) පාලක මණ්ඩලය විසින්, ප්‍රතියෝජනය සඳහා කැඳවන ලද යම් ව්‍යවහාර මුදල් නෝට්ටු හෝ කාසි ප්‍රතියෝජනය කරනු ලැබිය යුතු වන අවුරුදු එකකට අඩු නොවන කාලසීමාවක් තීරණය කළ හැකි අතර, මහ බැංකුව විසින් හෝ තත්කාර්ය සඳහා පාලක මණ්ඩලය විසින් බලය පවරන ලද යම් නියෝජිතයකු විසින් ඒ කාලසීමාව තුළ දී එසේ ප්‍රතියෝජනය සඳහා කැඳවන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු හෝ කාසි භාරදීමෙන් පසුව, ඒ නෝට්ටු හෝ කාසි වෙනුවට මුහුණත අගයට සහ ගාස්තුවක් රහිතව, යෝග්‍ය ව්‍යවහාර මුදල් නෝට්ටු හෝ කාසි හුවමාරු කිරීම මගින් ප්‍රතියෝජනය කරනු ලැබිය යුතු ය.

(4) ප්‍රතියෝජනය සඳහා කැඳවන ලද නමුත් (3) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි භාර නොදුන් සියලුම ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි පිළිබඳ මහ බැංකුවේ වගකීම නතර විය යුතු අතර, ඒ යම් නෝට්ටු හෝ කාසි සන්තකව සිටින තැනැත්තකු කිසිදු වන්දි මුදලක් සඳහා හිමිකම් නො ලැබිය යුතු ය.

**55.** ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි සැපයුම නිතිපතා පවත්වාගෙන යාම තහවුරු කිරීම පිණිස මහ බැංකුව විසින් ව්‍යවහාර මුදල් තොග ඇති කොට පරිපාලනය කරනු ලැබිය යුතු ය. ව්‍යවහාර මුදල් තොග.

**56.** පාලක මණ්ඩලයේ අධිකාරි බලයක් නොමැතිව- ව්‍යවහාර මුදල් නෝට්ටු අවලක්ෂණ කිරීම හෝ විකෘති කිරීම.

(අ) යම් මුදල් නෝට්ටුවක් කපා දමනු ලබන, සිදුරු කරනු ලබන හෝ වෙනත් යම් ආකාරයකින් විකෘති කරනු ලබන;

(ආ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් මත යමක් මුද්‍රණය කරනු ලබන, මුද්‍රාවක් තබන හෝ යමක් අඳින හෝ යම් මුදල් නෝට්ටුවක් මත හෝ යම් මුදල් නෝට්ටුවකට යම් මුද්‍රාවක් හෝ ලකුණක් අලවනු ලබන;

(ඇ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවකට හෝ ඒ මත වෙළෙඳ දැන්වීමක ස්වභාවයෙන් හෝ ආකෘතියෙන් යුත් යම් දෙයක් අමුණන හෝ අලවන;

(ඈ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් කවර හෝ ආකාරයකින් ප්‍රතිනිර්මාණය කරන හෝ යම් මුදල් නෝට්ටුවක අනුරුවක් සාදන; හෝ

(ඉ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් වලංගු මුදලක් ලෙස නොවන අන්‍යාකාරයකින් භාවිත කරන,

යම් තැනැත්තකු වරදක් සිදුකරන්නේ ය.

වලංගු මුදලක් වශයෙන් නොවන වෙනත් ආකාරයකින් ව්‍යවහාර මුදල් කාසි භාවිත කිරීම.

**57.** (1) පාලක මණ්ඩලයේ අධිකාරී බලයක් නොමැතිව, ශ්‍රී ලංකාවේ වලංගු මුදලක් ලෙස පවතින යම් කාසියක් උණු කරනු ලබන, කඩනු ලබන, සිදුරු කරනු ලබන, විකෘති කරනු ලබන හෝ වලංගු මුදලක් වශයෙන් හැර අන්‍යාකාරයකින් භාවිත කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදුකරන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් භාවිත කරන ලද යම් කාසියකින් උපදවන ලද යම් ලෝහයක් හෝ ද්‍රව්‍යයක් බව දනිමින් හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබිය දී ඒ ලෝහය හෝ ද්‍රව්‍යය දැන දැනම භාවිත කරනු ලබන, සන්තකයේ තබා ගන්නා හෝ ඒ සමඟ කටයුතු කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදුකරන්නේ ය.

ව්‍යවහාර මුදල් නෝට්ටුවක් අනුකරණය කිරීම පිළිබඳ අවසානාත්මක සාක්ෂි.

**58.** (1) යම් අධිකරණයක යම් නඩු කටයුත්තක දී, ව්‍යවහාර මුදල් නෝට්ටුවක් බවට අදහස් කෙරෙන යම් ලේඛනයක් යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක අනුකරණයක් ද යන්න තීරණය කළ යුතු වන අවස්ථාවක දී, ඒ ලේඛනය ව්‍යවහාර මුදල් නෝට්ටුව අනුකරණයක් බවට සහ මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ ලෙස සලකනු ලබන ව්‍යවහාර මුදල් නෝට්ටුවක් නොවන බවට මහ බැංකුවේ අධිපතිවරයාගේ අත්සන

යටතේ වූ සහතිකයක්, ඒ ලේඛනය, ව්‍යවහාර මුදල් නෝට්ටුවක අනුකරණයක් වන බවට ඒ නඩු කටයුත්තේ දී අවසානාත්මක සාක්ෂියක් ලෙස පිළිගනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරනු ලබන මහ බැංකුවේ අධිපතිවරයා, ඒ සහතිකය සම්බන්ධයෙන් ප්‍රශ්න කරනු ලැබීමට හෝ හරස් ප්‍රශ්න අසනු ලැබීමට ලක් කරනු නො ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම සහතිකයක් ම පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකෘතියකින් විය යුතු ය.

කාසියක් හෝ ව්‍යවහාර කාසියක් අනුකරණය කිරීම පිළිබඳ අවසානාත්මක සාක්ෂි.

**59.** (1) යම් අධිකරණයක යම් නඩු කටයුත්තක දී, යම් කාසියක් හෝ ව්‍යවහාර කාසියක් බවට අදහස් කෙරෙන අයිතමයක් ඒ කාසියේ හෝ ව්‍යවහාර කාසියේ අනුකරණයක් ද යන්න තීරණය කළ යුතු වන අවස්ථාවක දී, ඒ අයිතමය අවස්ථාවෝචිත පරිදි, යම් කාසියක හෝ ව්‍යවහාර කාසියක අනුකරණයක් බවට සහ මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ ලෙස සලකනු ලබන කාසියක් හෝ ව්‍යවහාර කාසියක් නොවන බවට මහ බැංකුවේ අධිපතිවරයාගේ අත්සන යටතේ වූ සහතිකයක්, ඒ අයිතමය යම් කාසියක හෝ ව්‍යවහාර කාසියක අනුකරණයක් බවට ඒ නඩු කටයුත්තේ දී අවසානාත්මක සාක්ෂියක් ලෙස පිළිගනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරනු ලබන මහ බැංකුවේ අධිපතිවරයා, ඒ සහතිකය සම්බන්ධයෙන් ප්‍රශ්න කරනු ලැබීමට හෝ හරස් ප්‍රශ්න අසනු ලැබීමට ලක් කරනු නො ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම සහතිකයක් ම පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකෘතියකින් විය යුතු ය.

(4) මේ වගන්තියේ, "ව්‍යවහාර කාසිය" යන යෙදුමට දණ්ඩ නීති සංග්‍රහයේ ඊට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

## VIII වන කොටස

### ගෙවීමේ සහ පියවීමේ පද්ධති

අරමුදල් පැවරීම සඳහා සහ සහතික රහිත සුරැකුම්පත් පැවරීම සහ පියවීම සඳහා පද්ධති පිහිටුවීම.

**60.** (1) මහ බැංකුව විසින්-

(අ) මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ මහ බැංකුව සමඟ පියවීමේ ගිණුමක් පවත්වාගෙන යනු ලබන සහ මහ බැංකුව විසින් ඒ පද්ධතිය සඳහා සහභාගීකරුවන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන වෙනත් යම් ආයතන හෝ තැනැත්තන් විසින් සහ ඔවුනොවුන් අතර අරමුදල් පැවරීම සඳහා;

(ආ) මහ බැංකුව සහ ඍජු සහභාගීකරුවන් විසින් සහ ඔවුනොවුන් අතර සහතික රහිත සුරැකුම්පත් පැවරීම සහ පියවීම් කිරීම සඳහා;

(ඇ) (ආ) ඡේදය යටතේ සහතික රහිත සුරැකුම්පත් පැවරීම සහ පියවීම හා සම්බන්ධයෙන් වූ ගෙවීමේ වගකීම් නිරවුල් කිරීම සඳහා; සහ

(ඈ) මහ බැංකුවේ, ඍජු සහභාගීකරුවන්ගේ සහ අලෙවිකාර ඍජු සහභාගීකරුවන් සම්බන්ධයෙන් වන විට, ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ගේ සහතික රහිත සුරැකුම්පත්වල හිමිකම් වාර්තා කිරීම සඳහා සුරක්ෂිතාගාරයක් පවත්වාගෙන යාම සඳහා,

එක් පද්ධතියක් හෝ පද්ධති වැඩි ගණනක් පිහිටුවා පවත්වාගෙන යනු ලැබිය හැකි ය. මහ බැංකුව විසින් ඒ සුරක්ෂිතාගාරයට අදාළව තමන් විසින් අවශ්‍ය යයි සලකනු ලබන රීති සාදනු ලැබිය හැකි ය.

(2) ගෙවීමේ වගකීම් හෝ සුරැකුම්පත් නිෂ්කාශනය කිරීම හෝ පියවීම සඳහා (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද පද්ධතියක්, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් ස්ථානයක පවතින වෙනත් පද්ධතියක් සමඟ සම්බන්ධ කරනු ලැබිය හැකි අතර, මහ බැංකුව විසින් ඒ පද්ධති මෙහෙයවන්නන් සමඟ ගිවිසුම්වලට ඇතුළත් විය හැකි ය.

(3) (අ) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක ව පවතින බලපත්‍රලාභී වාණිජ බැංකු අතර හෝ පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන

වෙනත් යම් මූල්‍ය ආයතන අතර නිෂ්කාශන ගනුදෙනු සම්බන්ධයෙන් මහ බැංකුව විසින් පහසුකම් සැලසිය යුතු ය.

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුව සමඟ පවත්වාගෙන යනු ලබන සංචිත හෝ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් මූල්‍ය ආයතනයක් විසින් මහ බැංකුව සමඟ පවත්වා ගෙන යනු ලබන අරමුදල්, මහ බැංකුව විසින් තත්කාර්ය සඳහා සාදනු ලබන රීතිවලට අනුකූලව ඒ බැංකු හෝ මූල්‍ය ආයතන අතර චෙක්පත් නිෂ්කාශනය කිරීම සඳහා සහ ශේෂයන් පියවීම සඳහා පදනමක් වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය.

(4) මහ බැංකුව විසින්, (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද යම් පද්ධතියක සහභාගීකරුවන් සමඟ ගිවිසුම්වලට ඇතුළත් විය හැකි අතර, පද්ධතිය මෙහෙයවීම සම්බන්ධයෙන් පද්ධතියේ සහභාගීකරුවන් වෙත ලිඛිතව රීති නිකුත් කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තියේ ව්‍යාප්තියට අගතියක් නොමැතිව, ඒ රීති මගින්-

(අ) සහභාගීකරුවන්ට සුරැකුම්පත්වල සමපාර්ශ්වීය ද්‍රව්‍යවලට එරෙහිව එක් දින ණය පහසුකම් සැපයීම සඳහා සහ ඒ ණය පහසුකම් සැපයීම සම්බන්ධයෙන් වන කොන්දේසි පිළිබඳ;

(ආ) ඉලෙක්ට්‍රොනික අත්සන් සම්බන්ධයෙන් සහතික කිරීමේ බලධරයන් පත්කිරීම සඳහා අදාළ වන යම් නීතියක් යටතේ සහභාගීකරුවන් වෙත සහතික නිකුත් කිරීමේ කාර්යය සඳහා සහතික කිරීමේ බලධරයකු වශයෙන් මහ බැංකුව පත් කිරීම සඳහා;

(ඇ) සහභාගීකරුවන් සඳහා ආචාරධර්ම සංග්‍රහයක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා;

(ඈ) ඉලෙක්ට්‍රොනිකව කරගෙන යනු ලබන ගනුදෙනු සත්‍යායනය කිරීම සඳහා;

(ඉ) පද්ධතියේ යහපත වෙනුවෙන් අවශ්‍ය යයි මහ බැංකුව විසින් සලකනු ලබන්නේ නම්, පද්ධතිය ක්‍රියාත්මක වීම නතර කිරීම හෝ අත්හිටුවීම සඳහා හෝ යම් සහභාගීකරුවකුගේ හෝ සහභාගීකරුවන් කාණ්ඩයක වරප්‍රසාද හෝ අයිතිවාසිකම් ඉවත් කිරීම හෝ අත්හිටුවීම

සඳහා හෝ සහභාගීකරුවකුගේ පද්ධතියේ සාමාජිකත්වය අත්හිටුවීම හෝ අවලංගු කිරීම සඳහා;

(ඊ) පියවීම් පද්ධතිය සම්බන්ධයෙන්, සහභාගීකරුවන්ගේ මෙහෙයුම් පද්ධති විගණනය කිරීම හෝ අධීක්ෂණය කිරීම සඳහා විගණකවරුන් හෝ අධීක්ෂකවරුන් පත් කිරීම සඳහා; සහ

(උ) සහභාගීකරුවන් විසින් මහ බැංකුව වෙත ගාස්තු සහ අයකිරීම් ගෙවීම සඳහා,

විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

(6) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද යම් පද්ධතියක් හරහා කරනු ලබන යම් ගෙවීමක් හෝ පැවරීමක් -

(අ) අරමුදල් පැවරීමක් පමණක් සම්බන්ධයෙන් වූ ගනුදෙනුවක් පිළිබඳව වන අවස්ථාවක දී, අරමුදල් පැවරීම ඉල්ලා සිටින සහභාගීකරුගේ පියවීමේ ගිණුම හර කරනු ලැබීමේ දී;

(ආ) සුරැකුම්පත් පැවරීමක් පමණක් සම්බන්ධයෙන් වූ ගනුදෙනුවක් පිළිබඳව වන අවස්ථාවක දී, සුරැකුම්පත් පැවරීම ඉල්ලා සිටින සහභාගීකරුගේ සුරැකුම්පත් ගිණුම හර කරනු ලැබීමේ දී;

(ඇ) අරමුදල් පැවරීමක් සහ සුරැකුම්පත් පැවරීමක් යන දෙකම සම්බන්ධයෙන් වූ ගනුදෙනුවක් පිළිබඳව වන අවස්ථාවක දී, අරමුදල් පැවරීම හෝ සුරැකුම්පත් පැවරීම යන දෙකෙන් ප්‍රථමයෙන් එළඹෙන දෙය ඉල්ලා සිටින සහභාගීකරුවකුගේ අවස්ථාවෝචිත පරිදි, පියවීමේ ගිණුම හර කරනු ලැබීමේ දී හෝ සුරැකුම්පත් ගිණුම හර කරනු ලැබීමේ දී,

අවසානාත්මක සහ අවලංගු කළ නොහැකිවන අතර, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ ගෙවීම හෝ පැවරීම ප්‍රතිවර්තනය කිරීමට, ආපසු ගෙවීමට හෝ නිශ්ප්‍රභා කිරීමට නියම කරනු නොලැබිය යුතු ය. තවද, ඒ ගෙවීම හෝ පැවරීම

නිවැරදි කරන ලෙසට හෝ තාවකාලිකව වාරණය කරන ලෙසට කිසිදු අධිකරණයක් විසින් ආඥාවක් කරනු නො ලැබිය යුතු ය.

(7) (අ) මේ පනත යටතේ හෝ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත හෝ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් සහතික රහිත සුරැකුම්පත්, මේ පනත යටතේ සාදන ලද රීති මගින් හෝ ඒ රීති යටතේ හෝ අවස්ථාවෝචිත පරිදි, දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත හෝ ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ සාදන ලද නියෝග මගින් හෝ ඒ නියෝග යටතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට පමණක් පැවරීම, ඔඩපනය කිරීම, බැඳීම්වලට යටත් කිරීම, ණයට දීම, ණයට ගැනීම හෝ ගනුදෙනු කිරීම සිදු කළ යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ සිදු කරන ලද යම් පැවරීමක්, ඔඩපනය කිරීමක්, බැඳීම්වලට යටත් කිරීමක්, ණයට දීමක්, ණයට ගැනීමක් හෝ ගනුදෙනු කිරීමක් වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද එය නොතකා වලංගු සහ බලාත්මක විය යුතු අතර, අදාළ විය හැකි ඒ රීතිවලට හෝ නියෝගවලට අනුකූලව, සමපාර්ශ්වීය ද්‍රව්‍ය වශයෙන් තබන ලද යම් සහතික රහිත සුරැකුම්පත් මත යම් පද්ධතියක සහභාගීකරුවකු විසින් ඉදිරිපත් කරන හිමිකම්පෑමකට ඒ පද්ධතියේ සහභාගීකරුවකු නොවන යම් තැනැත්තකුගේ ඒ සහතික රහිත සුරැකුම්පත් මත ඉදිරිපත් කරන හිමිකම්පෑම් අභිබවා ප්‍රමුඛත්වය ලැබිය යුතු ය.

(8) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද පද්ධතියක් හරහා සිදු කරන ලද යම් ගෙවීමකින්, පැවරීමකින් හෝ පියවීමකින් යම් පාඩුවක් හෝ අලාභයක් සිදු වූ යම් තැනැත්තකුට ඇති වෙනත් යම් නෛතික අයිතිවාසිකමකට හෝ ප්‍රතිකර්මයකට (5) වන සහ (6) වන උපවගන්තිවල සඳහන් කිසිවකින් බලපෑමක් සිදු නො විය යුතු ය.

(9) සමාගම් ගණන් බේරා වසා දැමීමට අදාළ වන යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, යම් පද්ධතියක සහභාගීකරුවකු ගණන් බේරා වසා දැමීමේ කටයුතු ආරම්භ කර ඇත්නම් -

(අ) ගණන් බේරා වසා දැමීමේ කටයුතු ආරම්භ වූ දිනයේ දී හෝ ඒ දිනයට පෙරාතුව දරන ලද වගකීම් සමථ කර

ගැනීම පිණිස, පද්ධතියේ රීති මගින් අවසර දී ඇති හෝ නියම කර ඇති කිසිවක් මහ බැංකුව විසින් සිදු කරනු ලැබිය හැකි ය;

(ආ) පද්ධතියේ රීති යටතේ සමථ කර ගන්නා ලද වගකීම් ගණන් බේරා වසා දැමීමේ කටයුතුවල දී සැලකිල්ලට ගනු නො ලැබිය යුතු ය; සහ

(ඇ) මහ බැංකුව විසින් සිදු කරන ලද සමථ කර ගැනීම් සහ පද්ධතියේ රීති යටතේ සහභාගීකරු විසින් සිදු කරන ලද යම් ගෙවීමක් ගණන් බේරා වසා දැමීමේ කටයුතුවල දී අවලංගු කළ හැකි නොවිය යුතු ය.

(10) සහභාගීකරුවකුගේ ගණන් බේරා වසා දැමීම සඳහා වූ කටයුතු ආරම්භ වී ඇත්නම් සහ ඒ සහභාගීකරු විසින් ගෙවිය යුතු වූ හෝ පියවිය යුතු ගෙවීමක් හෝ පියවීමක් (6) වන හෝ (9) වන උපවගන්තියේ සඳහන් පරිදි සිදු කර ඇත්නම් ද, පද්ධතියෙන් පරිබාහිරව සිදු කරනු ලැබී නම් ඒ අරමුදල් හෝ සුරැකුම්පත් ගෙවීම හෝ පියවීම වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අවලංගු වේ නම් හෝ අවලංගු කළ හැකි වේ නම් ද ඒ සහභාගීකරුගේ ඈවරකරු විසින්, ඒ ගෙවීම හෝ පියවීම පද්ධතියෙන් පරිබාහිරව සිදු කරනු ලැබී නම් අයකර ගනු ලැබිය හැකි වන්නා වූ මුදල් ප්‍රමාණය ඒ ගෙවීම හෝ පියවීම කරන ලද්දේ යම් තැනැත්තකුගේ ප්‍රතිලාභය සඳහා ද ඒ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය යුතු ය.

(11) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද පද්ධතියක ක්‍රියාත්මක වන යම් ගනුදෙනුවක් ඉලෙක්ට්‍රොනිකව සිදු කරනු ලබන අවස්ථාවක දී, ඒ ගනුදෙනුව හුදෙක් ඉලෙක්ට්‍රොනිකව සිදු කරනු ලැබීමේ හෝ ඒ ගනුදෙනුවට අදාළ තොරතුරු ඉලෙක්ට්‍රොනික වාර්තාවක ආකාරයෙන් පවත්වාගෙන යාමේ හේතුව නිසාම පමණක් ඒ ගනුදෙනුවේ නෛතික බලපෑම, වලංගුභාවය හෝ බලාත්මක කිරීමේ හැකියාව ප්‍රතික්ෂේප කරනු නො ලැබිය යුතු අතර, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ වාර්තාව යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරිපිට පවත්වනු ලබන නඩු කටයුතුවල දී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(12) (1) වන හෝ (2) උපවගන්තියේ සඳහන් යම් කර්තව්‍යයක් හෝ සියලු කර්තව්‍ය, පාලක මණ්ඩලය විසින් පනවනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත්ව, පාලක මණ්ඩලය විසින්

තත්කාර්යය සඳහා බලය දී ඇති සංස්ථාපිත ආයතනයක් විසින් ඉටු කරනු ලැබිය හැකි ය.

(13) මහ බැංකුව විසින්-

(අ) සුරැකුම්පත් ගනුදෙනු පියවීමේ කාර්යය සඳහා මහ බැංකුවේ ගිණුම් පවත්වා ගෙන යාමට, පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි බලපත්‍රලාභී වාණිජ බැංකු නොවන මූල්‍ය ආයතන වෙත; සහ

(ආ) ඍජු සහභාගීකරුවන් අතර සහතික රහිත සුරැකුම්පත් දැරීමේ හෝ සහතික රහිත සුරැකුම්පත්වල ගනුදෙනු නිෂ්කාශනය කිරීමේ සහ පියවීමේ කාර්යය සඳහා මහ බැංකුවේ ගිණුම් පවත්වාගෙන යාමට, පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි බලපත්‍රලාභී වාණිජ බැංකු නොවන මූල්‍ය ආයතන වෙත,

පහසුකම් සැලැස්විය යුතු ය.

(14) (අ) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ, (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ සහ (13) වන උපවගන්තියේ සඳහන් යම් කර්තව්‍යයක් හෝ සියලු කර්තව්‍ය, පාලක මණ්ඩලය විසින් පනවනු ලැබිය හැකි යම් නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, පාලක මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා බලය දී ඇති සංස්ථාපිත ආයතනයක් විසින් ඉටු කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් සංස්ථාපිත ආයතනය විසින් ඒ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා මහ බැංකුවේ ගිණුමක් පවත්වාගෙන යා හැකි ය.

බලපත්‍ර ලබාදීම සහ අධීක්ෂණය කිරීම.

**61.** (1) 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ හෝ ගෙවීම්, නිෂ්කාශන සහ පියවීම් පද්ධති නියාමනය කිරීම, ඒවාට බලපත්‍ර ලබාදීමට, ලියාපදිංචි කිරීමට සහ අධීක්ෂණය කිරීමට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක වැඩිදුරටත් නිශ්චිතව දක්වා ඇති පරිදි ගෙවීම්, නිෂ්කාශන සහ පියවීම් පද්ධති නියාමනය කිරීම, ඒවාට බලපත්‍ර ලබාදීම, ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් මහ බැංකුව වගකිව යුතු ය.

(2) මහ බැංකුව විසින්, රීති මගින්-

(අ) යම් ගෙවීම්, නිෂ්කාශන සහ පියවීම් පද්ධතියක් හෝ ඒ පද්ධතියේ මෙහෙයුම්කරු ලියාපදිංචි කිරීමට හෝ ඒ පද්ධතියට හෝ මෙහෙයුම්කරුට බලපත්‍ර ලබා ගැනීමට නියම කළ හැකි ය;

(ආ) යම් ගෙවීම්, නිෂ්කාශන සහ පියවීම් පද්ධතියකට හෝ ඒ පද්ධතියේ මෙහෙයුම්කරුට මහ බැංකුව විසින් නියම කරනු ලැබිය හැකි යම් කොන්දේසි සහ නියම පිළිපදින ලෙසට නියම කළ හැකි ය; තවද

(ඇ) ගෙවීම් සාධන පත්‍ර නිකුත් කිරීම නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම කළ හැකි ය.

(3) මහ බැංකුවේ යම් සේවා නියුක්තයකු විසින් හෝ මහ බැංකුව විසින් නම් කරනු ලබන වෙනත් යම් සුදුසුකම්ලත් තැනැත්තකු විසින්, ගෙවීම්, නිෂ්කාශන සහ පියවීම් පද්ධති සහ ඒ පද්ධතිවල සහභාගීකරුවන් සම්බන්ධයෙන්, මහ බැංකුව විසින් විධාන කරනු ලබන යම් ගිණුම්, පොත්, ලේඛන සහ වෙනත් වාර්තා පරීක්ෂා කිරීමට හෝ ඒ පද්ධති සහ සහභාගීකරුවන් පිළිබඳ යම් තොරතුරු හෝ වාර්තා ලබා ගැනීමට හෝ වෙනත් යම් ක්‍රියාමාර්ග ගැනීමට කාලීනව පරීක්ෂණ පැවැත්විය හැකි ය.

(4) ගෙවීම්, නිෂ්කාශන සහ පියවීම් පද්ධති හා ඒවායේ මෙහෙයුම්කරුවන් සහ සහභාගීකරුවන් විසින් මහ බැංකුව විසින් නියම කරනු ලබන යම් තොරතුරු සහ වාර්තා මහ බැංකුව වෙත සපයනු ලැබිය යුතු ය.

(5) (3) වන හෝ (4) වන උපවගන්තිය යටතේ ලබාගත් තොරතුරු සහ දත්ත මහ බැංකුව විසින් සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් හෝ සමස්තය ම හෝ 80 වන වගන්තියට අනුකූලව හෙළිදරව් කරනු ලැබිය හැකි ය.

## IX වන කොටස

### මූල්‍ය ආයතන අධීක්ෂණය සහ නිරාකරණය කිරීම

මහ බැංකුවේ අධීක්ෂණ අධිකාරී බලය.

**62.** (1) මූල්‍ය ආයතන නියාමනය කිරීම, ඒවාට බලපත්‍ර ලබා දීම, ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා මහ බැංකුව අනන්‍ය ව වගකිව යුතු ය. ඒ වගකීමට 109 වන වගන්තියේ අර්ථානුකූලව පරිපාලන ක්‍රියාමාර්ග ගැනීම ද ඇතුළත් විය යුතු ය.

(2) මහ බැංකුවේ යම් සේවානියුක්තයකු විසින් හෝ මහ බැංකුව විසින් බලය දෙන ලද වෙනත් යම් සුදුසුකම්ලත් තැනැත්තකු විසින්, එක් එක් පරීක්ෂා කිරීමේ කාලසීමාව තුළ යටත්පිරිසෙයින් එක්වරක් වත් මූල්‍ය ආයතනවල පොත් සහ ගිණුම් පරීක්ෂා කළ යුතු අතර, මහ බැංකුවේ අධිපතිවරයා විසින් එසේ කරන ලෙස නියම කරනු ලබන කවර හෝ අවස්ථාවක දී, යම් මූල්‍ය ආයතනයක් සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂා කිරීම් සිදු කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වූ එක් එක් පරීක්ෂා කිරීමක ප්‍රතිඵල පිළිබඳ වාර්තාවක් පාලක මණ්ඩලය වෙත සපයනු ලැබිය යුතු ය.

(4) මහ බැංකුව විසින් බලය දී ඇති යම් තැනැත්තකු විසින්-

(අ) (17 වන අධිකාරය වූ) දිවුරුම් හා ප්‍රතිඥා ආඥාපනත ප්‍රකාරව යම් මූල්‍ය ආයතනයක යම් අධ්‍යක්ෂවරයකුගෙන්, නිලධරයකුගෙන් හෝ සේවා නියුක්තයකුගෙන් දිවුරුම් හෝ ප්‍රතිඥා ගැනීම;

(ආ) ඒ යම් මූල්‍ය ආයතනයක කටයුතු පිළිබඳ සත්‍ය තත්ත්වය නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් තොරතුරු සපයන ලෙසට ඒ මූල්‍ය ආයතනයේ යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ සේවානියුක්තයකු වෙත නියම කිරීම; හෝ

(ඇ) ඒ යම් තොරතුරු ඇතුළත් වන හෝ ඇතුළත් වීමට ඉඩකඩ ඇති, යම් අධ්‍යක්ෂවරයකුගේ, නිලධරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ සන්තකයේ පවතින යම් පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් පරීක්ෂා කර බැලීම සඳහා ඉදිරිපත් කරන ලෙසට ඒ

අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ සේවානියුක්තයා වෙත නියම කිරීම,

කළ හැකි ය.

(5) මහ බැංකුව විසින් ඉල්ලා සිටින කවර හෝ අවස්ථාවක දී, යම් මූල්‍ය ආයතනයක පොත් සහ වාර්තා සහ එහි මුදල්, වත්කම්, බැරකම් සහ සාමාන්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමට මහ බැංකුව වෙත හෝ මහ බැංකුව විසින් බලය දී ඇති යම් තැනැත්තකු වෙත අවස්ථාව ලබා දීම ඒ මූල්‍ය ආයතනයේ සෑම අධ්‍යක්ෂවරයකුගේ ම, නිලධරයකුගේ ම හෝ සේවා නියුක්තයකුගේ ම කාර්යය විය යුතු ය.

(6) මූල්‍ය ආයතන අඛණ්ඩව අධීක්ෂණය කිරීමේ කාර්යය සඳහා මහ බැංකුව විසින්-

(අ) යම් මූල්‍ය ආයතනයක කටයුතු පිළිබඳ සත්‍ය තත්ත්වය නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා ලබා ගැනීමට අවශ්‍ය යයි සලකනු ලබන, ඒ මූල්‍ය ආයතනයේ ව්‍යාපාරයට හෝ කටයුතුවලට අදාළ යම් ප්‍රකාශ සහ තොරතුරු, කලින් කලට සහ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් කාල සීමාවක් ඇතුළත සපයන ලෙසට ඒ මූල්‍ය ආයතනයට නියම කළ හැකි ය;

(ආ) (අ) ඡේදයේ සඳහන් කාර්යය සඳහා ලබා ගැනීමට අවශ්‍ය යයි සලකනු ලබන, යම් මූල්‍ය ආයතනයක විගණකවරයා විසින් පවත්වනු ලැබූ විගණනයකට අදාළ යම් තොරතුරු, තීරණය කරනු ලබන යම් කාලසීමාවක් ඇතුළත සපයන ලෙසට ඒ මූල්‍ය ආයතනයේ විගණකවරයා වෙත නියම කළ හැකි ය; තවද

(ඇ) එසේ සපයන ලද යම් ප්‍රකාශයක හෝ තොරතුරුවල නිරවද්‍යතාවය සත්‍යායනය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන, ඒ මූල්‍ය ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පොත් සහ ගිණුම් පරීක්ෂා කළ හැකි ය.

(7) මහ බැංකුවේ යම් සේවානියුක්තයකු විසින් හෝ මහ බැංකුව විසින් බලය දී ඇති වෙනත් යම් සුදුසුකම්ලත් තැනැත්තකු විසින්,

තත්කාර්ය සඳහා මහ බැංකුව විසින් විධාන දෙනු ලැබ ඇත්නම්, යම් මූල්‍ය ආයතනයක එතෙර මෙහෙයුම් ඇතුළුව ඒ මූල්‍ය ආයතනයේ යම් පාලිත සමාගමක හෝ නියෝජ්‍යායතනයක පොත් සහ ගිණුම් පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(8) මහ බැංකුව විසින්, ව්‍යාපාරයේ ස්වභාවය අනුව තීරණය කරන ලද මූල්‍ය ආයතන පන්තිවලින්, (4) වන හෝ (6) වන උපවගන්තිය යටතේ ලබාගත් තොරතුරු සහ දත්ත, සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් හෝ සමස්තය ම-

(අ) වෙනත් මූල්‍ය ආයතන පිළිබඳ අධීක්ෂණය;

(ආ) මූල්‍ය වෙළෙඳපොළ පිළිබඳ අධීක්ෂණය;

(ඇ) සාර්ව විචක්ෂණශීලි ප්‍රතිපත්තිය භාවිතය හරහා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය පවත්වාගෙන යාම; සහ

(ඈ) මූල්‍ය ආයතන ප්‍රතිසංවිධානය හෝ නිරාකරණය කිරීම,

පවරනු ලැබ ඇති ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නිසි බලධරයන් සමඟ හුවමාරු කරගත හැකි අතර, තොරතුරු සහ දත්ත හුවමාරු කර ගැනීම සඳහා වන කාර්යපටිපාටිය තීරණය කර ගැනීම සහ අදාළ කාර්යභාරයන් සහ කාර්යයන් නිශ්චිතව දැක්වීම සඳහා ඒ යම් බලධරයකු සමඟ ගිවිසුමකට එළඹිය හැකි ය.

(9) මහ බැංකුව විසින්, ව්‍යාපාරයේ ස්වභාවය අනුව තීරණය කරන ලද මූල්‍ය ආයතන පන්තිවලින්, (4) වන හෝ (6) වන උපවගන්තිය යටතේ ලබා ගත් තොරතුරු සහ දත්ත, සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් හෝ සමස්තය ම 80 වන වගන්තියට අනුව හෙළිදරව් කරනු ලැබිය හැකි ය.

(10) මේ වගන්තියේ-

"පරීක්ෂා කිරීමේ කාලසීමාව" යන්නෙන්, මහ බැංකුව විසින් තත්කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් අදහස් වේ; සහ

"සුදුසුකම්ලත් තැනැත්තා" යන්නෙන්, අධ්‍යාපන හෝ වෘත්තීමය සුදුසුකමක් සහ බැංකුකරණය, මූල්‍යය, ගිණුම්කරණය, විගණනය, නීතිය, අවදානම් කළමනාකරණය හෝ වෙනත් යම් සමාන ක්ෂේත්‍රයක පුළුල් දැනුමක් සහ පළපුරුද්දක් ඇති තැනැත්තකු අදහස් වේ.

මහ බැංකුවේ නිරාකරණය කිරීමේ බලය.

**63.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඇතිවිය හැකි අර්බුදයකින් හටගන්නා වූ යම් සැලකිය යුතු අවදානමක් මහජන අරමුදල් කෙරෙහි ඇති නොවන්නේ නම්, මූල්‍ය ආයතන නිරාකරණය කිරීම සඳහා මහ බැංකුව අනන්‍ය ලෙස වගකිව යුතු ය.

(2) මහ බැංකුව විසින්, නිරාකරණ සැලසුම් කිරීමේ දී සහ නිරාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී තොරතුරු සහ සහයෝගීතාවය හුවමාරු කර ගැනීම සඳහා විදේශීය අධීක්ෂකවරුන් සහ නිරාකරණ බලධරයන් සමග ගිවිසුම්වලට එළඹිය හැකි ය.

(3) මූල්‍ය ආයතන සම්බන්ධයෙන් නිරාකරණ සැලසුම් කිරීම සහ නිරාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුව විසින්, 62 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අධීක්ෂණ අධිකාරී බලය ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

## X වන කොටස

## සාර්ව විචක්ෂණශීලී අධිකාරිය

මහ බැංකුවේ සාර්ව විචක්ෂණශීලී අරමුණු.

**64.** (1) මහ බැංකුව, ශ්‍රී ලංකාවේ සාර්ව විචක්ෂණශීලී අධිකාරිය විය යුතු ය.

(2) මහ බැංකුව විසින්, සාර්ව විචක්ෂණශීලී මෙවලම් භාවිතය සඳහා වන සමස්ත ප්‍රවේශයක් ස්ථාපිත කර කලින් කල යාවත්කාලීන කළ යුතු අතර, සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්තිය තුළ මහ බැංකුවේ කාර්යභාරය පිළිබඳව මහජනතාවට දැනුම් දීමේ අරමුණ ඇතිව ඒ ප්‍රවේශය ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

(3) මූල්‍ය ස්ථායීතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා, මහ බැංකුව විසින් පහත දැක්වෙන අන්තර්මාධ්‍ය සාර්ව විචක්ෂණශීලී අරමුණු පෙරදැරිව කටයුතු කරනු ලැබිය යුතු යඃ-

(අ) අහිතකර ආර්ථික සහ මූල්‍ය තත්ත්වයන් යටතේ දී පවා මූල්‍ය සේවා සැපයීම සඳහා සහාය ලබාදෙන ආකාරයකින් මූල්‍ය පද්ධතියේ ප්‍රත්‍යස්ථිතික බව පවත්වාගෙන යාම;

(ආ) ණය සහ තෝලනවල තිරසර නොවන වැඩිවීම්වලින් ඇති වන අවදානම් පාලනය කිරීම; සහ

(ඇ) මූල්‍ය පද්ධතිය තුළ අන්‍යෝන්‍ය සම්බන්ධතාවයෙන් ඇති වන අවදානම් පාලනය කිරීම සහ පද්ධතිමය වශයෙන් වැදගත් තනි ආයතනවල අසාර්ථක වීමේ අවදානම් පාලනය කිරීම.

(4) (අ) 5 වන සහ 6 වන වගන්තිවල විධිවිධානවලට අගතියක් නොවන පරිදි, මහ බැංකුව විසින්, අමාත්‍යවරයාගේ ඉල්ලීම මත, මහ බැංකුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ සිදු කිරීමට අදාළ තොරතුරු අමාත්‍යවරයා වෙත සැපයිය යුතු ය.

(ආ) අධීක්ෂණය කරන ලද හෝ සුපරීක්ෂණය කරන ලද අස්තිත්වවලට අදාළ යම් විශේෂිත තොරතුරු, අර්බුද වැළැක්වීම සහ අර්බුද කළමනාකරණය කිරීම ඇතුළු මූල්‍ය ස්ථායීතාවය සම්බන්ධයෙන් වූ රජයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා පමණක් සපයනු ලැබිය යුතු ය.

(ඇ) මේ පනතේ නිශ්චිතව දක්වා ඇති රහස්‍යභාවය පිළිබඳ අවශ්‍යතා කුමක් වුව ද, ඒ තොරතුරු සැපයීම, රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා යෝග්‍ය යයි මහ බැංකුව විසින් සලකනු ලැබිය හැකි යම් සීමාවන්ට යටත් විය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ මූල්‍ය ස්ථායීතාවය ළඟාකර ගැනීමේ දී, මහ බැංකුව විසින් තැන්පත්කරුවන්ගේ යහපත පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.

මහ බැංකුවේ සාර්ව විචක්ෂණශීලී බලතල.

**65.** (1) සාර්ව විචක්ෂණශීලී අධිකාරිය ලෙස මහ බැංකුව විසින්-

(අ) මූල්‍ය පද්ධතියේ අවදානම් සහ අන්තරාය තත්ත්වයන්වල සැකැස්ම අධීක්ෂණය කිරීම, හඳුනාගැනීම හෝ තක්සේරු කිරීම;

(ආ) සාර්ව විචක්ෂණශීලී අරමුණු ළඟාකර ගැනීම සඳහා දත්ත, තොරතුරු සහ සංඛ්‍යාන දත්ත ඉල්ලා සිටීම, රැස්කිරීම, ගොනුකිරීම, විශ්ලේෂණය කිරීම හෝ ප්‍රසිද්ධ කිරීම;

(ඇ) පීඩන පරීක්ෂා සහ සමාකරණ අභ්‍යාස පැවැත්වීම;

(ඈ) 69 වන වගන්තිය යටතේ පද්ධතිමය වශයෙන් වැදගත් මූල්‍ය ක්ෂේත්‍ර සහභාගීකරුවන් නම් කිරීම;

(ඉ) 67 වන වගන්තියේ දක්වා ඇති සාර්ව විචක්ෂණශීලි උපකරණ මහ බැංකුව විසින් නියාමනය කරන ලද සහ අධීක්ෂණය කරන ලද මූල්‍ය ආයතන සඳහා යොදා ගැනීම සහ අදාළ කර ගැනීම;

(ඊ) පද්ධතිමය වශයෙන් වැදගත් මූල්‍ය ක්ෂේත්‍ර සහභාගිකරුවන් සම්බන්ධයෙන්, වැඩි දියුණු කළ සාර්ව විචක්ෂණශීලි අධීක්ෂණය යොදා ගැනීම සහ අදාළ කර ගැනීම;

(උ) නියාමනය තුළ පවතින, පද්ධතිමය අවදානම් ඇති කළ හැකි හිඩැස් හඳුනාගැනීම;

(ඌ) හඳුනාගත් පද්ධතිමය අවදානම් අවම කිරීමට හෝ ඊට පිළියම් කිරීමට උපායමාර්ග සහ ප්‍රතිපත්ති සකස් කිරීම;

(එ) දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය නියාමන සංවර්ධනයන් නිරීක්ෂණය කිරීම සහ මූල්‍ය ස්ථායීතාවය වැඩි දියුණු කරන්නා වූ ව්‍යවස්ථාදායක සහ නියාමන ක්‍රියාමාර්ග පිළිබඳ උපදෙස් ලබා දීම;

(ඒ) අදාළ මූල්‍ය ක්ෂේත්‍ර බලධරයන් විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන මූල්‍ය ක්ෂේත්‍ර සහභාගිකරුවන් සම්බන්ධයෙන් ඒ මූල්‍ය ක්ෂේත්‍ර බලධරයන් විසින් අදාළ කරගනු ලැබිය යුතු විචක්ෂණශීලි ප්‍රමිතීන් ස්ථාපිත කිරීම සහ යෝජනා කිරීම;

(ඔ) අදාළ මූල්‍ය ක්ෂේත්‍ර බලධරයන් අතර තොරතුරු හුවමාරු කිරීම සහ සහයෝගීතාව සඳහා පහසුකම් සැලැස්වීම; සහ

(ඕ) රාජ්‍ය හෝ මූල්‍ය ක්ෂේත්‍ර බලධරයන් වෙත නිකුත් කරනු ලැබිය යුතු නිර්දේශ 72 වන වගන්තියේ විධිවිධාන යටතේ පිහිටුවන ලද මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව වෙත යෝජනා කිරීම,සිදුකළ යුතු ය.

(2) පාලක මණ්ඩලය, මේ වගන්තිය යටතේ වූ සාර්ව විචක්ෂණශීලි අධිකාරිය හා සම්බන්ධ යම් කාරණයක් තීරණය කිරීමේ කාර්යය සඳහා යටත් පිරිසෙයින් කාර්තුවකට වරක්වත් රැස්විය යුතු ය.

(3) මහ බැංකුව විසින්, ස්වකීය ස්වාධීනත්වයට අගතියක් නොවන පරිදි, මේ වගන්තිය යටතේ වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදුකිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් තොරතුරු මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව වෙත දැනුම් දිය යුතු ය.

අවදානම් අධීක්ෂණය කිරීම, විශ්ලේෂණය කිරීම සහ තක්සේරු කිරීම.

**66.** (1) මහ බැංකුව විසින්-

(අ) මූල්‍ය ක්ෂේත්‍රයේ සිදුවන වර්ධනයන් නිසා ඇතිවන අවදානම් ඇතුළුව, මූල්‍ය ක්ෂේත්‍රයේ අන්තරායයන්;

(ආ) කුටුම්භ සහ මූල්‍ය නොවන ආයතනික ක්ෂේත්‍රයේ සිදුවන වර්ධනයන් නිසා ඇතිවන අවදානම් ඇතුළුව, මූල්‍ය පද්ධතියට ඇති අවදානම්;

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පුළුල් ආර්ථික සන්දර්භයෙන් හටගන්නා මූල්‍ය පද්ධතියට ඇති අවදානම්; සහ

(ඈ) මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවේ සාමාජිකයින් විසින් නගන ලද හෝ මේ පනත ප්‍රකාරව මූල්‍ය ක්ෂේත්‍ර බලධරයකු විසින් වාර්තා කරන ලද හෝ රාජ්‍ය බලධරයකු විසින් සන්නිවේදනය කරන ලද යම් කාරණයකින් අවධානය යොමු කරවන ලද යම් අවදානමක් ඇතුළුව, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය කෙරෙහි ඇති යම් අවදානමක්, ඒ අවදානමේ ස්වභාවය සහ ඒ අවදානමේ ප්‍රමාණය,

අධීක්ෂණය කිරීම, විශ්ලේෂණය කිරීම සහ තක්සේරු කිරීම කළ යුතු ය.

(2) මහ බැංකුව විසින්, පද්ධතිමය අවදානම් තක්සේරු කිරීමේ දී භාවිත කරනු ලැබිය යුතු ක්‍රමවේදය සහ දර්ශක මුල් අවස්ථාවේ දී ම තීරණය කළ යුතු ය.

සාර්ව විචක්ෂණශීලි උපකරණ.

**67.** (1) හඳුනාගත් පද්ධතිමය අවදානම් අවම කිරීම හෝ තුරන්කිරීම සඳහා, මහ බැංකුව විසින්-

(අ) ප්‍රතිචක්‍රීය ප්‍රාග්ධන ස්වාරක්ෂක;

(ආ) ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂක;

(ඇ) ගතික ප්‍රතිපාදන;

(ඈ) ලීවර අනුපාතික මත සීමා;

(ඉ) පොලී අනුපාතික සහ ණය වර්ධනය මත සීමා;

(ඊ) ආංශික ප්‍රාග්ධන අවශ්‍යතා;

(උ) ණය - වටිනාකම් අනුපාතික මත සීමා;

(ඌ) ණය සේවා - ආදායම් අනුපාතිකය මත සීමා;

(එ) ණය - ආදායම් අනුපාතිකය සහ ණයගැති - ආදායම් අනුපාතිකය මත සීමා;

(ඒ) අනාවරණ සීමා;

(ඔ) ද්‍රවශීලතා මෙවලම්;

(ඕ) ප්‍රාග්ධන අධිභාර;

(ක) ද්‍රවශීලතා අධිභාර;

(ග) අරමුදල් සම්පාදන හෝ ව්‍යුත්පන්න වෙළෙඳපොළවල අන්තර් සම්බන්ධතා පාලනය; සහ

(ච) ආන්තික තැන්පතු අවශ්‍යතා,

ඇතුළත් වන, ගුණාත්මක සහ ප්‍රමාණාත්මක සාර්ව විචක්ෂණශීලි උපකරණ නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) මහ බැංකුව විසින් නියාමනය කරන ලද සහ අධීක්ෂණය කරන ලද යම් මූල්‍ය ක්ෂේත්‍ර සහභාගිකරුවකු හෝ ඒ මූල්‍ය ක්ෂේත්‍ර සහභාගිකරුවන් පන්තියක් සම්බන්ධයෙන් මහ බැංකුව විසින් සාර්ව විචක්ෂණශීලි උපකරණ අදාළ කරනු ලැබිය හැකි ය.

මූල්‍ය ආයතන සම්බන්ධයෙන් මහ බැංකුවේ බලතල

**68.** (1) මහ බැංකුව විසින් මූල්‍ය ආයතන සම්බන්ධයෙන් පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය:-

(අ) ඍජුව ම අදාළ දත්ත හෝ තොරතුරු රැස්කිරීම;

(ආ) 67 වන වගන්තිය අනුව සාර්ව විචක්ෂණශීලී උපකරණයක් අදාළ කිරීම;

(ඇ) (අ) ඡේදය යටතේ රැස්කරන ලද දත්ත සහ තොරතුරු සත්‍යායනය කිරීම සහ මේ පනත යටතේ සාදන ලද රීති සමග වන අනුකූලතාව සත්‍යායනය කිරීම සඳහා ස්ථානීය පරීක්ෂණ සිදුකිරීම; සහ

(ඈ) අනුකූලතාවය දක්වා නැති මූල්‍ය ක්ෂේත්‍ර සහභාගිකරුවකු සම්බන්ධයෙන්, මේ පනතේ 109 වන වගන්තියේ දක්වා ඇති පරිපාලන ක්‍රියාමාර්ග අදාළ කර ගැනීමෙන් සහ අනුකූලතාවය ඇති කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගන්නා ලෙසට හෝ ගැනීමෙන් වළකින ලෙසට මූල්‍ය ක්ෂේත්‍ර සහභාගිකරුවකු වෙත නියම කිරීමෙන්, ඒ රීති බලාත්මක කිරීම.

(2) මහ බැංකුවට, ස්වකීය සාර්ව විචක්ෂණශීලී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සෘජුව ම යම් තැනැත්තකුගෙන් හෝ ආයතනයකින් අදාළ දත්ත හෝ තොරතුරු රැස්කර ගැනීමට බලය තිබිය යුතු ය.

පද්ධතිමය වශයෙන් වැදගත් මූල්‍ය ක්ෂේත්‍ර සහභාගිකරුවන් නම් කිරීම.

**69.** (1) මහ බැංකුව විසින්, මූල්‍ය ක්ෂේත්‍ර සහභාගිකරුවන් පද්ධතිමය වශයෙන් වැදගත් ලෙස නම් කිරීම සඳහා භාවිත කරනු ලබන නිර්ණායක නියම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති කිසිවක්, පද්ධතිමය වශයෙන් වැදගත් ලෙසට නම් කරන ලද යම් මූල්‍ය ක්ෂේත්‍ර සහභාගිකරුවකුට යම් රාජ්‍ය බලධරයකුගෙන් කිසිදු ආකාරයක ඇපයක් හෝ ණයක් හෝ වෙනත් සහායක් සඳහා ඉල්ලීමක් කිරීමට හිමිකමක් ලබාදෙන ලෙස අර්ථකථනය කරනු නො ලැබිය යුතු ය.

මහ බැංකුව විසින් මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව වෙත නිර්දේශ යෝජනා කළ යුතු බව.

**70.** යම් පද්ධතිමය අවදානමක්, 67 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති සාර්ව විචක්ෂණශීලී උපකරණ නොවන බලතල මගින් වැළැක්වීම හෝ අවම කිරීම අවශ්‍ය යයි මහ බැංකුව සලකනු ලබන්නේ නම් හෝ ඒ අවදානම මහ බැංකුවේ නියාමන හෝ අධීක්ෂණ අධිකාරියෙන් පරිබාහිර යම් මූල්‍ය ක්ෂේත්‍ර සහභාගිකරුවන්ගේ පන්තියක හැසිරීම තුළින් හටගැනීමට ඉඩකඩ ඇත්නම්, මහ බැංකුව විසින්, 76 වන වගන්තිය යටතේ අදාළ රාජ්‍ය බලධරයන් හෝ මූල්‍ය ක්ෂේත්‍ර බලධරයන් වෙත නිකුත් කරනු ලැබිය යුතු නිර්දේශ, මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව වෙත යෝජනා කරනු ලැබිය යුතු ය.

මූල්‍ය ස්ථායීතා සමාලෝචනය.

**71.** (1) මහ බැංකුව විසින්, (මේ පනතේ "මූල්‍ය ස්ථායීතා සමාලෝචනය" යනුවෙන් සඳහන් කරනු ලබන) මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය පිළිබඳ තක්සේරුවක් එක් එක් වර්ෂයේ ඔක්තෝබර් මස තිස්එක් වන දින හෝ එදිනට පෙර සකස් කර ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

(2) මූල්‍ය ස්ථායීතා සමාලෝචනයේ-

(අ) මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය පිළිබඳ මහ බැංකුවේ තක්සේරුව;

(ආ) මූල්‍ය පද්ධතියේ අවදානම් සහ අන්තරායයන් පිළිබඳ හඳුනාගැනීම සහ තක්සේරුව;

(ඇ) මූල්‍ය පද්ධතියේ අවදානම්, අන්තරායයන් හෝ කැළඹීම් හඳුනාගැනීමට සහ කළමනාකරණය කිරීමට මහ බැංකුව සහ වෙනත් මූල්‍ය ක්ෂේත්‍ර බලධරයන් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ විවරණයක්; සහ

(ඈ) සමාලෝචනයට යටත් වන කාලසීමාව තුළ දී මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව විසින් කරන ලද නිර්දේශ පිළිබඳ සහ ඒ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ විවරණයක්,

ඇතුළත් විය යුතු ය.

## XI වන කොටස

### මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව

මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව.

**72.** (1) මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවක් තිබිය යුතු ය.

(2) සාර්ව විචක්ෂණශීලි ප්‍රතිපත්තියට සමගාමීව මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සුරක්ෂිත කිරීමට දායකවීම මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවේ අරමුණ විය යුතු ය.

මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

**73.** මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව විසින්-

(අ) මූල්‍ය පද්ධතියට බලපාන හඳුනාගත් පද්ධතිමය අවදානම් වර්ධනය වීම අවම කිරීම සඳහා සාර්ව විචක්ෂණශීලි ප්‍රතිපත්තිය පරීක්ෂා කිරීම;

(ආ) සාර්ව විචක්ෂණශීලි ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම;

(ඇ) 70 වන වගන්තිය යටතේ මහ බැංකුවේ යෝජනාවක් මත, හඳුනාගත් අවදානමට ප්‍රතිචාර වශයෙන් ගත යුතු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව අදාළ රාජ්‍ය බලධරයන් වෙත සහ මූල්‍ය ක්ෂේත්‍ර බලධරයන් වෙත නිර්දේශ නිකුත් කිරීම සහ අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, ඒ නිර්දේශ ප්‍රසිද්ධ කිරීම; සහ

(ඈ) ස්වකීය නිර්දේශ සමග වන අනුකූලතාව අධීක්ෂණය කිරීම,

කළ යුතු ය.

මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවේ සංයුතිය.

**74.** (1) මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව-

(අ) සභාපතිවරයා විය යුතු, මහ බැංකුවේ අධිපතිවරයාගෙන්;

(ආ) සාර්ව විචක්ෂණශීලි ප්‍රතිපත්තිය භාර මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයාගෙන්;

(ඇ) නියාමනය සහ අධීක්ෂණය භාර මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයාගෙන්;

(ඈ) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නම් කරන ලද භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයකුගෙන්;

(ඉ) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයාගෙන්;

(ඊ) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයාගෙන්; සහ

(උ) පාලක මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි තවත් එක් තැනැත්තකුගෙන්,

සමන්විත විය යුතු ය.

(2) මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව විසින්, වෙනත් යම් රාජ්‍ය බලධරයකුගේ අනුයෝජිතයන්ට ස්වකීය අදහස් ප්‍රකාශ කිරීම සඳහා කමිටුවේ රැස්වීම්වලට ආරාධනා කරනු ලැබිය හැකි ය.

(3) මුල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවේ රැස්වීමක ගණපූරණය (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් සාමාජිකයන් ද ඇතුළුව, ඡන්දය හිමි සාමාජිකයන් හතරදෙනකු විය යුතු ය.

(4) මුල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවේ සෑම ඡන්දය හිමි සාමාජිකයකුට ම එක් ඡන්දයක් තිබිය යුතු අතර, ඡන්ද සමාන වන අවස්ථාවක දී සභාපතිවරයා දෙවන හෝ තීරක ඡන්දයකට හිමිකම් ලැබිය යුතු ය.

(5) 73 වන වගන්තියේ (ඇ) ඡේදය සම්බන්ධයෙන් වන විට, මුල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව විසින් සාමාන්‍ය යෝජනාවක් මගින් ඡන්දය දෙනු ලැබිය යුතු ය.

(6) මුල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවේ යම් රැස්වීමක් යටත් පිරිසෙයින් කාර්තුවකට වරක් කැඳවනු ලැබිය යුතු ය. යම් අතිවිශේෂ රැස්වීමක්, සභාපතිවරයා විසින් ඔහුගේ අභිමතය මත හෝ යටත් පිරිසෙයින් ඡන්දය හිමි සාමාජිකයන් දෙදෙනකුගේ ලිඛිත ඉල්ලීම මත කැඳවනු ලැබිය හැකි ය.

(7) මුල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව විසින්, එහි රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය යුතු ය.

(8) මුල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවේ එක් එක් රැස්වීම්වල සටහන් යටත් පිරිසෙයින් අවුරුදු දොළහක කාලසීමාවක් සඳහා තබාගත යුතු ය.

මුල්‍ය පද්ධති අධීක්ෂණ කමිටු ලේකම් කාර්යාලය.

**75.** මුල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවේ සභාපතිවරයාගේ විධානය යටතේ මුල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව වෙත ඉහළ ප්‍රමිතියේ විශ්ලේෂණාත්මක, සංඛ්‍යානමය, පරිපාලනමය, කාර්ය සම්පාදනමය සහ මුල්‍ය සහාය ලබා දීම සඳහා වගකිව යුතු, මුල්‍ය පද්ධති අධීක්ෂණ කමිටු ලේකම් කාර්යාලයක් මහ බැංකුව විසින් පිහිටුවනු ලැබිය යුතු ය.

රාජ්‍ය බලධරයන් සහ මුල්‍ය ක්ෂේත්‍ර බලධරයන් සඳහා වන නිර්දේශ.

**76.** (1) 73 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ වන යම් නිර්දේශයක්, සාමාන්‍ය හෝ විශේෂිත ස්වභාවයේ විය හැකි අතර, ඒ නිර්දේශය ලබන්නා වූ බලධරයාගේ අධිකාරී බලය අනුව, රාජ්‍ය බලධරයන් සියල්ලම හෝ එක් බලධරයකු හෝ වැඩි ගණනක් වෙත ආමන්ත්‍රණය කරනු ලැබිය හැකි ය.

(2) ප්‍රතිපත්තිමය ප්‍රතිචාරයක් දැක්වීම සඳහා නිශ්චිත කාලසීමාවක් නිර්දේශයෙහි ඇතුළත් විය යුතු ය.

(3) ඒ නිර්දේශය මගින් මූල්‍ය ක්ෂේත්‍ර බලධරයන් ආමන්ත්‍රණය කරනු ලැබිය හැකි අතර, ඒ නිර්දේශය ලබන්නා වූ බලධරයාගේ අධිකාරි බලය අනුව තම නියාමන, අධීක්ෂණ, බලාත්මක කිරීමේ හෝ නිරාකරණය කිරීමේ බලය ක්‍රියාත්මක කරමින් නිශ්චිත ක්‍රියාමාර්ග අදාළ කර ගන්නා ලෙස ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(4) ඒ නිර්දේශය ලබන්නා වූ බලධරයා විසින්, නිර්දේශයේ නිශ්චිතව සඳහන් කරන ලද කාලසීමාව තුළ සියලු ක්‍රියාමාර්ග අදාළ කර ගනු ලැබූ විට, ඒ නිර්දේශය සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක කරනු ලැබූ ලෙසට සලකනු ලැබිය යුතු ය.

(5) (අ) නිර්දේශය ලබන්නා වූ බලධරයා විසින් නිර්දේශය සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක කිරීමට අදහස් නො කරන අවස්ථාවක දී, ඒ බලධරයා විසින් ඒ සඳහා වන හේතු මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටු ලේකම් කාර්යාලය වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(ආ) නිර්දේශය ලබන්නා වූ බලධරයා විසින් නිශ්චිත කාලසීමාව තුළ නිර්දේශවලින් කොටසක් පමණක් ක්‍රියාත්මක කරනු ලබන අවස්ථාවක දී, ඒ බලධරයා විසින් ඉතිරි නිර්දේශ ක්‍රියාත්මක නො කිරීම සඳහා වන හේතු මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටු ලේකම් කාර්යාලය වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(6) මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව විසින් නිර්දේශය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක නොකිරීමට තීරණය කරනඅවස්ථාවක දී, ඒ තීරණය ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

(7) (6) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, පද්ධතිමය වශයෙන් වැදගත් ලෙස නම් කරන ලද මූල්‍ය ක්ෂේත්‍ර සහභාගිකරුවකු සම්බන්ධයෙන් නිර්දේශය නිකුත් කරනු ලබන අවස්ථාවක දී, මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව වහාම රැස්කොට, විස්තරාත්මක පැහැදිලි කිරීමකට යටත්ව ඒ නිර්දේශය නැවත නිකුත් කළ යුතු ද යන වග තීරණය කරනු ලැබිය යුතු ය. යම් නිර්දේශයක් නැවත නිකුත් කරනු ලැබුවේ නම් සහ මූල්‍ය ක්ෂේත්‍ර සහභාගිකරු විසින් ඒ නිර්දේශය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක නො කරන්නේ නම්, මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව විසින් ගනු ලැබූ තීරණය ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

(8) (අ) මුල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව විසින්, උචිත අවස්ථානුගත තත්ත්වයන් හි දී නිර්දේශයක් ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ද යන වග තීරණය කරනු ලැබිය යුතු ය.

(ආ) මුල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව යම් නිර්දේශයක් ප්‍රසිද්ධ කිරීම සඳහා තීරණය කරන්නේ නම්, ඒ පිළිබඳව ඒ කමිටුව විසින් පූර්ව දැනුම් දීමක් නිර්දේශය ලබන්නා වූ බලධරයා වෙත කරනු ලැබිය යුතු ය.

(ඇ) මුල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව විසින් ප්‍රසිද්ධ කර ඇත්තේ යම් නිර්දේශයක් ද ඒ නිර්දේශය ලබන්නා වූ බලධරයා විසින් ඊට ප්‍රතිචාර ලෙස දක්වන තම අදහස් සහ තර්කන ප්‍රසිද්ධ කරනු ලැබිය හැකි ය.

## XII වන කොටස

### මුල්‍ය ක්ෂේත්‍ර බලධරයන් සමග තොරතුරු හුවමාරු කිරීම

සාර්ව විචක්ෂණශීලි කාරණා සම්බන්ධයෙන් තොරතුරු හුවමාරු කිරීම.

**77.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මුල්‍ය ක්ෂේත්‍ර බලධරයන්, සාර්ව විචක්ෂණශීලි අධිකාරිය සම්බන්ධයෙන් මහ බැංකුව සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතු අතර, මහ බැංකුව විසින් සාර්ව විචක්ෂණශීලි අධිකාරි බලය ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය වන දත්ත සහ තොරතුරු මහ බැංකුව වෙත සැපයිය යුතු ය.

(2) මේ කොටස යටතේ මහ බැංකුව විසින් යම් දත්ත, තොරතුරු හෝ සංඛ්‍යා ලේඛන සඳහා ඉල්ලීමක් කරනු ලැබූ පසු, මුල්‍ය ක්ෂේත්‍ර බලධරයකු විසින්, තම සන්නතකයේ පවතින ඒ දත්ත, තොරතුරු හෝ සංඛ්‍යා ලේඛන ඒ ඉල්ලීමේ නිශ්චිතව සඳහන් කරන ලද කාලසීමාවක් ඇතුළත හෝ සාධාරණ කාලසීමාවක් ඇතුළත මහ බැංකුව වෙත සැපයිය යුතු ය.

ගිවිසුම්.

**78.** (1) මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුව විසින්, ඒ ක්‍රියාත්මක කිරීමේ කාර්යපටිපාටිය තීරණය කිරීම සඳහා සහ ඔවුනොවුන්ගේ අදාළ කාර්යභාරය හා කාර්යය නිශ්චිතව දැක්වීම සඳහා, ප්‍රායෝගිකව හැකි තාක් ඉක්මනින්, එක් එක් මුල්‍ය ක්ෂේත්‍ර බලධරයා සමඟ ගිවිසුමකට එළඹිය යුතු ය.

(2) ඒ ගිවිසුමක, අවම වශයෙන්-

(අ) තොරතුරු රැස්කිරීම සහ හුවමාරු කිරීම; සහ

(ආ) මූල්‍ය ක්ෂේත්‍ර බලධරයන් විසින් ගනු ලැබිය යුතු සාර්ව විචක්ෂණශීලි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම් දීම සහ සාකච්ඡා කිරීම, පිළිබඳ විධිවිධාන ඇතුළත් විය යුතු ය.

(3) මහ බැංකුව විසින් මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා යම් රාජ්‍ය බලධරයකු සමඟ ගිවිසුමකට එළඹිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ එළඹෙන ලද ගිවිසුම යටත් පිරිසෙයින් සෑම අවුරුදු තුනකට එක්වරක් සුදුසු පරිදි සමාලෝචනය කර යාවත්කාලීන කළ හැකි ය.

## XIII වන කොටස

## සංඛ්‍යා ලේඛන සහ තොරතුරු

සංඛ්‍යා ලේඛන සහ තොරතුරු රැස් කිරීම.

**79.** මහ බැංකුව විසින්, ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහ මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම සඳහා-

(අ) අදාළ සංඛ්‍යා ලේඛන සහ තොරතුරු රැස් කිරීම, ගොනු කිරීම, විශ්ලේෂණය කිරීම, සාරාංශ කිරීම සහ ප්‍රසිද්ධ කිරීම;

(ආ) එසේ අවශ්‍ය කරන සංඛ්‍යා ලේඛනමය තොරතුරු සහ ඒ තොරතුරු මහ බැංකුවට සපයනු ලැබිය යුතු ආකෘතිය, වාර්තා කිරීමේ නියමයන්ට යටත් තැනැත්තන්, අදාළ රහස්‍යභාවය පිළිබඳ කාරණා සහ ඒ නියම උල්ලංඝනය කිරීමක දී ගනු ලැබිය හැකි පරිපාලනමය ක්‍රියාමාර්ග නියම කිරීම; සහ

(ඇ) සංඛ්‍යා ලේඛන සහ තොරතුරු සංවිධානය කිරීමේ දී ස්ථිරසාර බව සහ කාර්යක්ෂමතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සංඛ්‍යානමය ක්‍රමවේද සහ දත්ත බෙදාහැරීමේ ප්‍රමිතීන් යොදා ගැනීමේ දී ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික නියෝජ්‍යායතන සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම, කරනු ලැබිය හැකි ය.

සංඛ්‍යා ලේඛන සහ තොරතුරු බෙදාහැරීම.

**80.** මහ බැංකුව විසින්, 119 වන වගන්තියේ සඳහන් රහස්‍යභාවය පිළිබඳ රීතිවලට යටත්ව, සංඛ්‍යා ලේඛන සහ තොරතුරු ද සංඛ්‍යා ලේඛන සහ තොරතුරු ගොනු කිරීමේ දී අදාළ කරගත් ක්‍රමවේදය ද ප්‍රසිද්ධ කරනු ලැබිය හැකි ය.

## XIV වන කොටස

## පාර්ලිමේන්තුව, රජය සහ මහජනතාව සමග වන සම්බන්ධතාව

වගවීම.

**81.** (1) මහ බැංකුව විසින්, සෑම මාස හයකට ම වරක් සහ අවශ්‍ය යයි එය සලකන යම් අමතර කාලවල දී ස්වකීය මුල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කළ යුතු ය.

(2) මහ බැංකුවේ අධිපතිවරයා, පාර්ලිමේන්තුවේ ඉල්ලීම මත හෝ ස්වකීය අභිලාෂය පරිදි, කලින් කලට මහ බැංකුවේ කර්තව්‍ය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව මගින් හෝ එහි යම් කමිටුවක් මගින් විමසීමට ලක් කරනු ලැබිය හැකි ය.

(3) මහ බැංකුව විසින්, එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් මාස හතරක කාලසීමාවක් ඇතුළත තම ප්‍රතිපත්තිමය අරමුණු සහ මුල්‍ය පද්ධතියේ තත්ත්වය අවධාරණය කරමින්, ඒ මුදල් වර්ෂය තුළ ආර්ථිකයේ තත්ත්වය පිළිබඳව පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්තාවක් ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු අතර, එය අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ඒ මුදල් වර්ෂය තුළ මහ බැංකුව විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනයක් සහ තක්සේරුවක් වාර්තාවේ ඇතුළත් විය යුතු ය.

රජයේ මුල්‍ය උපදේශකවරයා, මුල්‍ය නියෝජිතයා සහ රජයේ බැංකුකරු.

**82.** (1) මහ බැංකුව, රජයේ මුල්‍ය උපදේශකවරයා ලෙස කටයුතු කළ යුතු ය.

(2) මහ බැංකුව විසින්, රජය සමඟ එකඟ විය යුතු යම් නියම සහ කොන්දේසි මත, යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ විධිවිධාන සලස්වා ඇති ප්‍රමාණයට, රජයේ රාජ්‍ය මුල්‍ය නියෝජිතයා ලෙස සහ රජයේ බැංකුකරු ලෙස කටයුතු කළ හැකි ය.

(3) රජයේ රාජ්‍ය මුල්‍ය නියෝජිතයා ලෙස සහ රජයේ බැංකුකරු ලෙස ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී මහ බැංකුව විසින්, ඒ කර්තව්‍ය ඉටු කිරීමට ප්‍රමාණවත් පහසුකම් සහිත කාර්යාල හෝ නියෝජ්‍යායතන මහ බැංකුව සතු නොවන අවස්ථාවක දී ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි ස්ථානවල බැංකු හෝ වෙනත් ආයතනවල සේවාවන් ලබාගත හැකි ය.

(4) රජයේ රාජ්‍ය මූල්‍ය නියෝජිතයා ලෙස කටයුතු කිරීමේ දී මහ බැංකුවට ලැබුණු අරමුදල් පිළිබඳ දත්ත රජයේ ඉල්ලීම මත, මහ බැංකුව විසින් රජය වෙත ලබා දිය යුතු ය.

(5) මහ බැංකුවේ කර්තව්‍ය රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය සමඟ සමායෝජනය කිරීමේ කාර්යය සඳහා මහ බැංකුව විසින් ඉල්ලා සිටිය හැකි යම් තොරතුරු සහ ලේඛන මහ බැංකුවේ ඉල්ලීම මත රජය විසින් මහ බැංකුව වෙත ලබා දිය යුතු ය.

(6) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව හෝ ශ්‍රී ලංකාව සාමාජිකයකු වන වෙනත් යම් ජාත්‍යන්තර මූල්‍ය ආයතනයක් සමඟ යම් කටයුතු කිරීමක දී, ගිවිස ගැනීමක දී හෝ ගනුදෙනු කිරීමක දී මහ බැංකුව විසින් ශ්‍රී ලංකා රජය නියෝජනය කරනු ලැබිය හැකි අතර, ඒ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ, ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුවේ හෝ වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනයේ ශ්‍රී ලංකාව සාමාජිකයකු වීම හෝ ඒවා සමඟ කටයුතු කිරීම හේතුවෙන් උද්ගත වන යම් ගිණුම් මහ බැංකුව විසින් පවත්වාගෙන යා යුතු ය. විදේශීය ආණ්ඩු, ආයතන හෝ නියෝජ්‍යායතන සමඟ යම් කටයුතු කිරීමක දී, ගිවිස ගැනීමක දී හෝ ගනුදෙනු කිරීමක දී රජය නියෝජනය කිරීම සඳහා රජය විසින් මහ බැංකුවට බලය දිය හැකි ය.

(7) රජය විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් සඳහා මහ බැංකුව විසින් රෙජිස්ට්‍රාර් කාර්යාලයක් පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

රජයේ තැන්පතුධරයා.

83. (1) මහ බැංකුව නිල තැන්පතුධරයා විය යුතු අතර, රජයෙන් හෝ රජය වෙනුවෙන් ඕනෑම ව්‍යවහාර මුදලකින් තැන්පතු භාරගනු ලැබිය හැකි ය:

එසේ වුව ද, පාලක මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි යම් රීතිවලට යටත්ව, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ කිහිපයකට රජයේ තැන්පතු භාර ගැනීම සඳහා මහ බැංකුව විසින් බලය ලබා දිය හැකි ය.

(2) තැන්පතුධරයා ලෙස, මහ බැංකුව විසින් මුදල් ලබා ගැනීම, මුදල් ගෙවීම, ඒ පිළිබඳ වාර්තා තබා ගැනීම සහ ඊට අදාළ වෙනත් මූල්‍ය සේවාවන් රජය වෙත සැපයීම සිදු කරනු ලැබිය යුතු ය.

(3) රජය විසින් ශ්‍රී ලංකා රුපියල්වලින් දරනු ලබන යම් තැන්පතුවක් මත කිසිදු පොලියක් මහ බැංකුව විසින් ගෙවනු නො ලැබිය යුතු ය.

**84.** (1) මහ බැංකුවේ රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතා ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීම සඳහා පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත (මේ පනතේ "සම්බන්ධීකරණ සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාවක් තිබිය යුතු ය:- සම්බන්ධීකරණ සභාව.

(අ) සභාපතිවරයා විය යුතු, අමාත්‍යවරයා;

(ආ) මහ බැංකුවේ අධිපතිවරයා;

(ඇ) භාණ්ඩාගාරයේ ලේකම්වරයා; සහ

(ඈ) ආර්ථික ප්‍රතිපත්ති විෂයය මුදල් අමාත්‍යවරයා වෙත නොව වෙනත් අමාත්‍යවරයකු වෙත පවරනු ලැබ ඇති අවස්ථාවක දී, ආර්ථික ප්‍රතිපත්ති විෂයය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා.

(2) සම්බන්ධීකරණ සභාව විසින්, මෑතකාලීන සාර්ව-ආර්ථික වර්ධනයන්, ඒවායේ ස්වභාවය සහ අවදානම් පිළිබඳ තොරතුරු හුවමාරු කරගැනීම සහ අදහස් හුවමාරු කරගැනීම සඳහා කාර්තුවකට වරක් තම රැස්වීම් පවත්වනු ලැබිය යුතුය.

(3) සම්බන්ධීකරණ සභාවේ සභාපතිවරයා හෝ මහ බැංකුවේ අධිපතිවරයා විසින්, මූල්‍ය ක්ෂේත්‍ර සහභාගීකරුවන් අතර ව්‍යාප්ත වීමේ බලපෑමක් සහිත, ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථායීතාවයට සැලකිය යුතු අවදානමක් ඇති කරනු ලබන හෝ ආර්ථික කටයුතු මත සැලකිය යුතු අහිතකර බලපෑමක් ඇති කරනු ලබන බවට අපේක්ෂිත යම් සිදුවීමක් හෝ අවස්ථානුගත තත්ත්වයක් පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම සහ අදහස් හුවමාරු කර ගැනීම සඳහා හදිසි රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(4) මහ බැංකුව විසින් -

(අ) (2) වන උපවගන්තියේ කාර්යය සඳහා අදාළ වන දත්ත;

(ආ) උද්ධමනය, මුදල් තත්ත්ව සහ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කෙරෙහි රජයේ ආර්ථික ප්‍රතිපත්ති ඇති කරන බලපෑම පිළිබඳව මහ බැංකුවේ තක්සේරුවක්, සම්බන්ධීකරණ සභාව හමුවේ තැබිය යුතු ය.

(5) සැක දුරුකිරීම සඳහා, රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් තීරණ ගැනීමට සම්බන්ධීකරණ සභාවට කිසිදු අධිකාරී බලයක් නොමැත්තේ ය.

රජය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

**85.** (1) 5 වන සහ 6 වන වගන්තිවල විධිවිධානවලට අගතියක් නොමැතිව, මහ බැංකුව විසින් -

(අ) රජය සහ වෙනත් යම් රාජ්‍ය බලධරයකු සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම; සහ

(ආ) මුදල්, විදේශ විනිමය මෙහෙයුම්, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය, අර්බුද වැළැක්වීම සහ අර්බුද කළමනාකරණය සහ රාජ්‍ය මූල්‍යය හා අදාළ වන කාරණා සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති පිළිබඳව රජය සහ වෙනත් යම් රාජ්‍ය බලධරයන් සමඟ අදහස් හුවමාරු කිරීම, කරනු ලැබිය යුතු ය.

(2) මහ බැංකුවේ සහ අමාත්‍යාංශයේ කර්තව්‍යවලට බලපාන්නා වූ සියලු කාරණා පිළිබඳව මහ බැංකුව සහ අමාත්‍යවරයා ඔවුනොවුන් අන්‍යෝන්‍ය වශයෙන් සම්පූර්ණයෙන් ම දැනුවත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී බලපෑමක් ඇති කිරීමේ හැකියාවක් ඇති බවට මහ බැංකුවේ මතය වන යම් කරුණක් පිළිබඳව මහ බැංකුව විසින් රජයට උපදෙස් ලබා දිය හැකි ය.

අන්තර් ආයතනික සහයෝගීතාව.

**86.** මහ බැංකුව විසින්, ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහ මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ සිදු කිරීමේ දී, තොරතුරු හුවමාරු කර ගැනීම, කටයුතු සම්බන්ධීකරණය කිරීම හෝ අවශ්‍ය යයි මහ බැංකුව සලකනු ලබන වෙනත් යම් සහයෝගීතාවයක් වෙනුවෙන් කටයුතු සැලසීම සඳහා දේශීය හෝ විදේශීය නියාමන, අධීක්ෂණ හෝ මුදල් අධිකාරීන් සමඟ හෝ අන්තර්ජාතික රාජ්‍ය මූල්‍ය ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ලැබිය හැකි ය.

මුදල් සම්පාදනය සම්බන්ධයෙන් වන තහනම.

**87.** (1) මහ බැංකුව විසින්, කෙලින් ම හෝ වක්‍රව, රජය වෙත හෝ රජයට අයත් යම් රාජ්‍ය බලධරයකු වෙත හෝ වෙනත් යම් රාජ්‍ය අස්ථිත්වයක් වෙත ණය ප්‍රදානය නො කළ යුතු ය.

(2) මහ බැංකුව විසින්, මේ පනතේ 113 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ මහ බැංකුවේ කර්තව්‍යවලට අදාළව වන වියදම් සඳහා හැර, රජය වෙනුවෙන් යම් පිරිවැයක් නො දැරිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ දක්වා ඇති තහනම, පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් රජය සතු හෝ මහජනතාව සතු බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන සඳහා අදාළ නො විය යුතු ය.

(4) රජය විසින් හෝ රජය සතු යම් අස්ථිත්වයක් විසින් හෝ වෙනත් යම් රාජ්‍ය අස්ථිත්වයක් විසින් නිකුත් කරන ලද සුරැකුම්පත් මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළෙන් මිල දී නො ගත යුතු ය. මහ බැංකුව විසින් ද්විතීයික වෙළෙඳපොළෙන් ඒ සුරැකුම්පත් මිල දී ගනු ලැබිය හැකි අතර, එසේ වුව ද, ඒ මිල දී ගැනීමෙන් (1) වන උපවගන්තියේ දක්වා ඇති තහනම මඟ හැර යාමක් සිදු නො විය යුතු ය.

## XV වන කොටස

### රාජ්‍ය ණය කළමනාකරණය සහ ණය මෙහෙයුම්

**88.** (1) රජයේ නියෝජිතයා වශයෙන් මහ බැංකුව, රාජ්‍ය ණය කළමනාකරණය සඳහා වගකිව යුතු ය. රාජ්‍ය ණය කළමනාකරණය.

(2) රජයේ සුරැකුම්පත් නිකුතුව, රජයේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කළ යුතු මහ බැංකුව හරහා සහ රජයේ ගිණුම වෙනුවෙන් සිදු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මහ බැංකුව විසින්, ඒ සුරැකුම්පත්වල යම් නිකුතුවකට දායක වීම හෝ ඒ යම් නිකුතුවක දායක නොවූ කොටස් ප්‍රමාණයක් මිල දී ගැනීමට එකඟ වීම නො කළ යුතු ය.

**89.** (1) රජයේ නියෝජිතයා වශයෙන් මහ බැංකුව විසින්, රජය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසි යටතේ ප්‍රතිමූල්‍ය ණය යෝජනාක්‍රම සහ පොලී සහනාධාර ණය යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීමේ අරමුණින් රජයේ අරමුදල්වලින්- ණය දෙන ආයතන සමඟ ණය මෙහෙයුම්.

(අ) යම් ණයක් හෝ අත්තිකාරමක් ප්‍රදානය කිරීම සහ ආපසු අයකර ගැනීම;

(ආ) ඇප සහතික නිකුත් කිරීම, හානිපූරණ ගෙවීම් සිදු කිරීම, යම් කල්ගත වූ හිමිකම්පෑම් අයකර ගැනීම සහ යම් අයකර ගත නොහැකි යම් ශේෂයක් කපා හැරීම; හෝ

(ඇ) ප්‍රදාන සහ පොලී සහනාධාර ප්‍රදානය කිරීම,

සිදු කළ හැකි ය.

(2) ඒ ආයතනයට ලබා දෙනු ලබන යම් ණයක් හෝ අත්තිකාරමක් පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව, පොරොන්දු නෝට්ටුවක් හෝ රජය විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත් යම් සුරැකුමකට එරෙහිව ලබා දෙනු ලැබිය යුතු ය:-

(අ) රජය විසින් තීරණය කරනු ලැබිය හැකි වසර පහළොවක් නො ඉක්මවන කාලසීමාවක් ඇතුළත ඒ ණය හෝ අත්තිකාරම ආපසු ගෙවිය යුතු බව;

(ආ) ඒ ණය හෝ අත්තිකාරම මහ බැංකුව වෙත ආපසු ගෙවීම, ඒ කාර්යය සම්බන්ධයෙන් ණය ලබාගත් තැනැත්තන් විසින් ඒ ආයතනයට ගෙවිය යුතු ණය, ඔඩපනයක ආකාරයෙන් මහ බැංකුව වෙත පැවරීම මගින් සුරක්ෂිත කරන බව; සහ

(ඇ) රජය විසින් තීරණය කරනු ලබන, ඒ ණය හෝ අත්තිකාරම මත ඇති පොලී අනුපාතිකය ඇතුළු වෙනත් යම් කොන්දේසි.

(3) මහ බැංකුව විසින්, අමාත්‍යවරයා විමසා, රජය විසින් ලබා දෙනු ලැබූ අරමුදල්වලින් ණය දෙන ආයතනවලට ණය සහ අත්තිකාරම් ප්‍රදානය කරනු ලැබිය යුත්තේ කවර නියමවලට සහ කොන්දේසිවලට යටත්ව ද යන්න පිළිබඳව, ණය දෙන ආයතන විසින් ඒ ණය ලබා දෙනු ලැබිය යුත්තේ කවර කාර්යයන්වලට ද යන්න පිළිබඳව සහ ඒ ආයතනවල ණය දීමේ ප්‍රතිපත්තියට බලපාන හෝ ණය දීමේ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් වූ වෙනත් යම් කාරණාවලට අදාළව නියම සහ කොන්දේසි නියම කරනු ලැබිය හැකි ය.

(4) මේ පනතේ මේ කොටස යටතේ මහ බැංකුව වෙත කරන ණය පැවරීමක්, පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් යුත් සාධන පත්‍රයක් මගින් සිදු කරනු ලැබිය යුතු ය.

(5) යම් පැවරීමක් ලියා අත්සන් කරනු ලැබූ පසුව, එසේ පවරන ලද ණය සම්බන්ධයෙන් මහ බැංකුවට පළමු බැඳියාවක් තිබිය යුතු ය.

(6) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ මේ කොටසේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

මුද්දර ගාස්තු.

**90.** මේ පනතේ මේ කොටස යටතේ මහ බැංකුව වෙත ඔඩපනයක ආකාරයෙන් සාදනු ලබන යම් ණය පැවරීමේ සාධන පත්‍රයක් සඳහා හෝ ඒ සම්බන්ධයෙන් කිසිදු මුද්දර ගාස්තුවක් අය කරනු ලැබීම හෝ ගෙවනු ලැබීම නො කළ යුතු ය.

පැවරීමේ සාධන පත්‍රය ලියාපදිංචි කිරීම.

**91.** මේ පනතේ මේ කොටස යටතේ මහ බැංකුව වෙත සාදනු ලබන කවර හෝ පැවරීමේ සාධන පත්‍රයක්, (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කිරීම අවශ්‍ය නො විය යුතු ය.

වංචා වැළැක්වීමේ ආඥාපනත අදාළ වීම.

**92.** කවර හෝ පැවරීමක්, (70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි, බලපත්‍රලාභී ප්‍රසිද්ධ නොතාරිස්වරයකු සහ සාක්ෂිකරුවන් ඉදිරියේ ලියා අත්සන් කිරීම අවශ්‍ය නො විය යුතු ය.

අර්ථ නිරූපණය.

**93.** මේ පනතේ මේ කොටසේ -

"පැවරීම" යන්නෙන්, ඔඩපනයක ආකාරයෙන් පැවරීම අදහස් වේ;

"ණය දෙන ආයතනය" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී යම් බැංකුවක් අදහස් වේ; සහ

"ඵලදායී කාර්යය" යන්නෙන්, රජය විසින් කලින් කලට තීරණය කරනු ලබන, කෘෂිකර්මය, කර්මාන්තය, වෙළෙඳාම, වාණිජ්‍යය හෝ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම හෝ දියුණු කිරීම හා සම්බන්ධ හෝ ඊට අදාළ යම් කාර්යයක් අදහස් වේ.

## XVI වන කොටස

## මූල්‍ය විධිවිධාන

ගිණුම්කරණ ප්‍රමිති.

**94.** මූල්‍ය වාර්තාකරණ රාමුව සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි, පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද ජාත්‍යන්තරව පිළිගත් මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූල විය යුතු ය.

මුදල් වර්ෂය.

**95.** මහ බැංකුවේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය.

සංචිත ගිණුම්.

**96.** (1) මහ බැංකුව විසින්, සාමාන්‍ය සංචිත ගිණුමක් පිහිටුවා පවත්වාගෙන යා යුතු ය.

(2) රඳවා ගන්නා ලද ඉපැයීම් ඍණ බවට පත්වන්නේ නම්, රඳවා ගන්නා ලද ඉපැයීම් මාරු කිරීමේ කාර්ය සඳහා හැර, සාමාන්‍ය සංචිත ගිණුම වෙනත් යම් කාර්ය සඳහා භාවිත කරනු නො ලැබිය යුතු ය.

(3) මහ බැංකුව විසින්, ලාභ බෙදා හැරීමට පෙරාතුව, පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ජාත්‍යන්තරව පිළිගත් මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව, විදේශ ව්‍යවහාර මුදල්, රත්‍රන්, මූල්‍ය සාධන පත්‍ර සහ ආදායම් ප්‍රකාශයේ වාර්තා කරනු ලබන වෙනත් මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් මහ බැංකුවේ තත්ත්වය හේතු කොටගෙන විනිමය අනුපාතවලින් උද්ගත වන උපලබ්ධි නොවූ ලැබීම් සහ අලාභ ද වෙළෙඳපොළ මිල ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන උපලබ්ධි නොවූ ලැබීම් ද සටහන් කිරීම සඳහා විශේෂ සංචිත ගිණුම් පිහිටුවනු ලැබිය යුතු ය.

ලාභ, අලාභ සහ බෙදා හැරිය හැකි ඉපැයීම්.

**97.** (1) එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු දින හතළිස් පහක් ඉක්මයාමට පෙර, මහ බැංකුව විසින්, එහි ශුද්ධ ලාභ හෝ අලාභ සහ බෙදා හැරිය හැකි ඉපැයීම් තීරණය කරනු ලැබිය යුතු ය.

(2) (අ) බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභවලින්, මිල ප්‍රත්‍යාගණනවලින් උද්ගත වන උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන ලැබීම් සහ විනිමය අනුපාතවලින් උද්ගත වන උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන ලැබීම් සහ අලාභවල මුළු මුදල අඩු කිරීමෙන් සහ ඊට සමාන මුදලක් අදාළ උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන සංචිත ගිණුම්වලට බෙදා වෙන් කිරීමෙන්, බෙදාහැරීමට ඇති ඉපැයීම් තීරණය කරනු ලැබිය යුතු ය.

(ආ) උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශූන්‍ය ශේෂයක් පවතින තෙක්, විනිමය අනුපාතවලින් උද්ගත වන උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන අලාභ අදාළ උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට මාරු කරනු ලැබිය යුතු අතර, ඉන්පසු ඒ අලාභ රඳවා ගන්නා ලද ඉපැයීම්වලින් ආවරණය කර ගනු ලැබිය යුතු ය.

බෙදා හැරිය හැකි ඉපැයීම් වෙන් කිරීම.

**98.** (1) එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු දින හැටක් ඉක්මයාමට පෙර, පාලක මණ්ඩලය විසින් ඒ මුදල් වර්ෂයේ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ හිමිකමේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය මත පදනම්ව, පහත දැක්වෙන විධිවිධානවලට අනුකූලව, බෙදාහැරිය හැකි ඉපැයීම් බෙදා වෙන් කරනු ලැබිය යුතු ය:-

(අ) පළමුව-පාලක මණ්ඩලය විසින් යෝග්‍ය යයි සලකනු ලැබිය හැකි යම් කාර්ය සඳහා මහ බැංකුව විසින් විශේෂ සංචිත පිහිටුවනු ලැබිය හැකි ය;

(ආ) දෙවනුව-ගෙවා නිමි ප්‍රාග්ධනය සහ සාමාන්‍ය සංචිත මහ බැංකුවේ මුළු මුදල්මය බැරකම්වලින්, යටත් පිරිසෙයින් සියයට හයක්වත් වන තෙක්, ඉහත විධිවිධානය ප්‍රකාරව විශේෂ සංචිතවලට වෙන් කිරීමෙන් පසු ඉතිරිව පවතින බෙදා හැරිය හැකි ඉපැයීම්වලින් සියයට සියයකට සමාන මුදලක් සමාන්‍ය සංචිත ගිණුමට බැර කරනු ලැබිය යුතු ය;

(ඇ) තෙවනුව-ඉහත විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමෙන් පසු ඉතිරිව පවතින බෙදා හැරිය හැකි ඉපැයීම්, අමාත්‍යවරයා විමසා, මුදල් වර්ෂය අවසානයට රජය විසින් මහ බැංකුවට ගෙවිය යුතුව තිබෙන යම් බැඳීම් පියවා අවසන් කිරීම සඳහා යොදා ගැනීම හෝ ඒකාබද්ධ අරමුදලට ගෙවා බැර කිරීම හෝ සිදු කරනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, කිසිදු බෙදා හැරීමක් සිදු කරනු නොලැබිය යුතුය .

ප්‍රාග්ධන ඌනතා ආවරණය කර ගැනීම.

**99.** මහ බැංකුවේ වත්කම්වල අගය එහි මුදල්මය බැරකම්වලට සහ එහි ගෙවා නිමි ප්‍රාග්ධනයෙහි එකතුවට වඩා අඩු බවට මහ බැංකුවේ විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශවලින් පෙන්නුම් කරන විටක දී -

(අ) මහ බැංකුව විසින්, දින තිහක් නොඉක්මවන කාලසීමාවක් ඇතුළත තත්ත්වය තක්සේරු කර ඒ ඌනතාවයට හේතු සහ ඒ ඌනතාවයේ ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් පිළියෙල කර තත්ත්වය තක්සේරු කරනු ලැබිය යුතුය;

(ආ) (අ) ඡේදය යටතේ පිළියෙල කරන ලද වාර්තාව පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ විටක දී, ප්‍රාග්ධනය අනූන මට්ටමකට යළි පත් කිරීමේ අරමුණින් ඒ හිඟයට පිළියම් යෙදීම සඳහා රජය විසින් ප්‍රාග්ධන දායකත්වයක් සිදු කරන ලෙස මහ බැංකුව විසින් අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) (ආ) ඡේදය යටතේ ඉල්ලීමක් කරනු ලැබීමෙන් පසුව, අමාත්‍යවරයා විසින්, අවශ්‍ය මුදල, ව්‍යවහාර මුදලින් හෝ පවත්නා වෙළෙඳපොළ ආශ්‍රිත පොලී අනුපාතික යටතේ නිකුත් කරනු ලබන, නිශ්චිත කල්පිරීමේ කාලයක් ඇති ගනුදෙනු කළ හැකි ණය සාධන පත්‍රවලින් මහ බැංකුව වෙත මාරු කිරීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමතය ඉල්ලා සිටිනු ලැබිය හැකිය.

මහ බැංකුවේ ශේෂ පත්‍රය.

**100.** මහ බැංකුව විසින්, එක් එක් මාසයේ අවසන් දිනට ඇති එහි වත්කම් සහ බැරකම් ප්‍රමාණය සහ සංයුතිය පෙන්නුම් කරන පොදු ශේෂපත්‍රයක් පසුව එළඹෙන මාසයේ අවසන් දිනට පෙර පළ කරනු ලැබිය යුතුය.

වාර්ෂික මූල්‍ය ප්‍රකාශ.

**101.** (1) මහ බැංකුව විසින්, මුදල් වර්ෂයක් සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) මහ බැංකුව විසින්, එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු මාස හතරක් ඇතුළත, පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද, මහ බැංකුවේ අධිපතිවරයා සහ ප්‍රධාන ගණකාධිකාරීවරයා විසින් අත්සන් කරන ලද සහ විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(3) පාර්ලිමේන්තු සැසිවාර පවත්වන වකවානුවක නම්, ඒ මූල්‍ය ප්‍රකාශ අමාත්‍යවරයා වෙත ලැබීමෙන් පසු, දින දහහතරක් ඇතුළත ඒ මූල්‍ය ප්‍රකාශ පාර්ලිමේන්තුව ඉදිරියෙහි තැබිය යුතු අතර, පාර්ලිමේන්තු සැසිවාර නොපවත්වන වකවානුවක නම්, ඉන් අනතුරුව එළඹෙන සැසිවාරය ආරම්භ වීමෙන් පසු දින දහහතරක් ඇතුළත ඒ මූල්‍ය ප්‍රකාශ පාර්ලිමේන්තුව ඉදිරියෙහි තැබිය යුතුය.

(4) (2) වන උපවගන්තියේ නියමයන් සම්පූර්ණ කරනු ලැබූ විට දී, මහ බැංකුව විසින් ඒ මූල්‍ය ප්‍රකාශ ප්‍රසිද්ධ කරනු ලැබිය යුතුය.

**102.** (1) එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමට පෙරාතුව, පාලක මණ්ඩලය විසින් මහ බැංකුවේ වාර්ෂික අයවැය අනුමත කරනු ලැබිය යුතු ය. අයවැය.

(2) ක්ෂයවීම් සහ අලාභ සඳහා වෙන්කිරීම් ඇතුළු ප්‍රක්ෂේපිත වියදම් ද සමඟ, යම් මූලාශ්‍රයකින් මහ බැංකුව විසින් ජනනය කරන බවට හෝ යම් මූලාශ්‍රයක් වෙතින් මහ බැංකුවට ප්‍රදානය කරනු ලබන බවට ප්‍රක්ෂේපිත සියලු අයභාර සහ ආදායම්, වාර්ෂික අයවැයෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(3) වාර්ෂික අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා පාලක මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය යුතු ය.

## XVII වන කොටස

### අභ්‍යන්තර සහ බාහිර විගණන

**103.** (1) මහ බැංකුවේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය. මහ බැංකුවේ ගිණුම් විගණනය කිරීම.

(2) මහ බැංකුවේ ගිණුම් සහ ඒ ගිණුම් හා සම්බන්ධ කාරණා පිළිබඳ තොරතුරු අන්තර්ගත සියලු පොත්පත් සහ ලේඛන වෙත ප්‍රවේශ වීමට සහ ඒවා පරීක්ෂා කිරීමට විගණකාධිපතිවරයාට හෝ විගණකාධිපතිවරයා විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද, 2018 අංක 19 දරන ජාතික විගණන පනත යටතේ පිහිටුවන ලද ජාතික විගණන කාර්යාලයේ යම් නිලධරයකුට හෝ විගණකාධිපතිවරයා විසින් පත් කරන ලද වෙනත් යම් විගණකවරයකුට සෑම විටක ම අයිතිය තිබිය යුතු ය.

(3) විගණකාධිපතිවරයා විසින් විගණනයෙන් පැන නගින ප්‍රධාන කරුණු සහ විශේෂයෙන් ම, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියට අදාළ අභ්‍යන්තර පාලනවල ඇති සැලකිය යුතු දුර්වලතා පිළිබඳව මහ බැංකු අධිපතිවරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(4) විගණකාධිපතිවරයා විසින් මහ බැංකුවේ ගිණුම් පිළිබඳ මතයක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් ඒ මතය පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබනු ලැබිය යුතු ය. විගණකාධිපතිවරයාගේ මතය, මහ බැංකුවේ විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සමඟ ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා පත් කිරීම.

**104.** (1) පාලක මණ්ඩලය විසින් (මේ පනතේ "ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මහ බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු පත් කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ගිණුම්කරණය හෝ විගණනය යන ක්ෂේත්‍රයක සැලකිය යුතු වෘත්තීමය පළපුරුද්දක් ඇති තැනැත්තකු විය යුතු ය.

(3) ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා වසර පහක කාලයක් සඳහා පත් කරනු ලැබිය යුතු අතර, පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා නැවත පත් කිරීමට සුදුසුකම් ලැබිය යුතු ය:

එසේ වුව ද, කිසිදු තැනැත්තකු වසර දහයකට වඩා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ලෙස සේවය කරනු නො ලැබිය යුතු ය.

(4) ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සහ 20 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් යම් නුසුදුසුකමකට යටත් බවට පාලක මණ්ඩලය සෑහීමට පත් වන්නේ නම්, පාලක මණ්ඩලයේ තීරණයක් මගින් ඒ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(5) පාලක මණ්ඩලය විසින්, ජාත්‍යන්තර වෘත්තීමය පරිචයන් පිළිබඳ රාමුවට අනුකූලව, අභ්‍යන්තර විගණනයේ විෂය පථය, නියම සහ කොන්දේසි, මහ බැංකුවේ විගණන ප්‍රඥප්තියෙහි නිර්වචනය කරනු ලැබිය යුතු ය.

(6) මේ පනත යටතේ වූ හෝ පාලක මණ්ඩලය විසින් නිශ්චිත ලෙස විධාන කරනු ලැබිය හැකි වූ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ සිදු කිරීමේ දී, යම් බාහිර පාර්ශ්වයකින් හෝ අස්ථිත්වයකින් මහ බැංකුවට සපයන ලද හෝ මහ බැංකුව විසින් ලබා ගන්නා ලද යම් ලේඛනයක්, තොරතුරක් හෝ වාර්තාවක් ඇතුළුව මහ බැංකුව විසින් කරන ලද යම් කටයුත්තක් හෝ ගනුදෙනුවක් සම්බන්ධයෙන් වන යම් ලේඛනයක්, තොරතුරක් හෝ වාර්තාවක් වෙත ප්‍රවේශ වීමට, එය භාරයට ගැනීමට හෝ එහි පිටපත් ලබා ගැනීමට ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා හෝ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ඒ සඳහා බලයලත් යම් නිලධරයකු හිමිකම් ලැබිය යුතු අතර, පාලක මණ්ඩලය විසින් අන්‍යාකාරයෙන් තීරණය කරනු ලැබුවහොත් මිස, ප්‍රධාන

අභ්‍යන්තර විගණකවරයා හෝ තත්කාර්යය සඳහා බලයලත් යම් තැනැත්තකු විසින් දැනුම් දෙන ලද නියමයන්ට අනුකූලව කටයුතු කිරීම මහ බැංකුවේ සියලු නිලධරයන්ගේ, සේවානියුක්තයන්ගේ වගකීම විය යුතු ය.

**105.** (1) මහ බැංකු අධිපතිවරයා හැර පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සමන්විත වන (මේ පනතේ "විගණන කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) මහ බැංකුවේ විගණන කමිටුවක් තිබිය යුතු ය. විගණන කමිටුව.

(2) (අ) ගිණුම්කරණය හෝ විගණනය යන ක්ෂේත්‍රයක පුළුල් පළපුරුද්දක් ඇති යටත් පිරිසෙයින් එක් සාමාජිකයකුවත් පාලක මණ්ඩලයේ නොමැති විටක දී, ඒ යම් ක්ෂේත්‍රයක පුළුල් පළපුරුද්දක් ඇති විශේෂඥයකු විගණන කමිටුවේ අතිරේක සාමාජිකයකු ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(ආ) 16 වන වගන්තියේ විධිවිධාන ඒ විශේෂඥයා පත් කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(ඇ) විගණන කමිටුවේ සාමාජිකයකු ලෙස තමා පත් කරනු ලැබූ දිනට ඉහතින් ම වූ වසර තුනක කාලසීමාව තුළ දී ඒ විශේෂඥයා පාලක මණ්ඩලයේ සාමාජිකයකු ව හෝ මහ බැංකුවේ සේවානියුක්තයකුව සිට නොමැති විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරන ලද විශේෂඥයකු 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සහ 20 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් යම් නුසුදුසුකමකට යටත් බවට පාලක මණ්ඩලය සෑහීමට පත් වන්නේ නම්, පාලක මණ්ඩලයේ තීරණයක් මගින් ඒ විශේෂඥයා ඉවත් කරනු ලැබිය යුතු ය.

(4) විගණන කමිටුවේ බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට -

(අ) අභ්‍යන්තර විගණන කර්තව්‍යය අධීක්ෂණය කිරීම;

(ආ) ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා විසින් නිකුත් කරන ලද තීරණ සහ නිර්දේශවලට අනුකූලව කටයුතු කිරීම පිළිබඳ අධීක්ෂණය කිරීම;

(ඇ) විගණකවරුන්ගේ තීරණ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ඒ විගණකවරුන් හමුවීම; සහ

(ඈ) විගණකවරුන් සමඟ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම,

ඇතුළත් විය යුතු ය.

(5) විගණන කමිටුව විසින්, කාලීනව පාලක මණ්ඩලයට වාර්තා කරනු ලැබිය යුතු ය.

(6) (2) වන උපවගන්තියට යටත්ව, පාලක මණ්ඩලය විසින් විගණන කමිටුවේ සංයුතිය සහ බලතල, කාර්ය සහ කර්තව්‍ය මහ බැංකුවේ විගණන ප්‍රඥප්තියෙහි නිර්වචනය කරනු ලැබිය යුතු ය.

## XVIII වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

රජයේ ආර්ථික ප්‍රතිපත්තියට සහාය දීම සඳහා මහ බැංකුව සතු වගකීම.

**106.** 6 වන වගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව, මහ බැංකුව විසින්, ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය දිරි ගැන්වීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රජයේ ආර්ථික ප්‍රතිපත්තියට සහාය දිය යුතු ය.

නියාමන උපකරණ.

**107.** (1) මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ මහ බැංකුව වෙත පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම සඳහා අවශ්‍ය යයි මහ බැංකුව විසින් සලකනු ලැබිය හැකි යම් රීති සෑදීමට හෝ විධාන නිකුත් කිරීමට මහ බැංකුවට බලය තිබිය යුතු ය.

(2) මහ බැංකුව විසින් නිකුත් කරන ලද රීතියක් පොදුවේ අදාළ විය යුතු ය. ඒ රීති සමස්තය ම අනුගමය විය යුතු අතර, ඍජුව ම අදාළ විය යුතු ය.

(3) මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානයක් එය නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තාට පමණක් අනුගම්‍ය විය යුතු ය.

රීති පළ කිරීම.

**108.** (1) මහ බැංකුව විසින් සාදන ලද රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ පළ කිරීම සිදු කළ දිනයේ දී හෝ ඒ රීති මගින් නිශ්චිතව දක්වන යම් පසු දිනයක සිට බලාත්මක විය යුතු ය.

(2) මහ බැංකුව විසින් ස්වකීය විධාන පළ කිරීම පිළිබඳ තීරණය කරනු ලැබිය හැකි ය.

(3) මහ බැංකුව විසින් පළ කරන ලද රීති සහ විධාන පිළිබඳ ප්‍රසිද්ධ රෙජිස්ටරයක් මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

**109.** (1) මහ බැංකුව විසින්, මේ පනතේ කවර හෝ විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් රීතියක්, විධානයක් හෝ තීරණයක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු සම්බන්ධයෙන් පරිපාලනමය ක්‍රියාමාර්ග ගනු ලැබිය හැකි ය. පරිපාලනමය ක්‍රියාමාර්ග.

(2) යම් තැනැත්තකුට විරුද්ධව පරිපාලනමය ක්‍රියාමාර්ග ගැනීමට පෙර, මහ බැංකුව විසින්, (1) වන උපවගන්තියේ සඳහන් උල්ලංඝනය කිරීමට අදාළ සියලු වැදගත් කරුණු සපයමින්, කරුණු දැක්වීම සඳහා ඒ තැනැත්තාට ප්‍රමාණවත් අවස්ථාවක් ලබා දෙනු ලැබිය යුතු ය.

(3) (අ) පරිපාලනමය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලැබිය යුතු යුතු කාර්ය පටිපාටිය නිශ්චිතව දක්වමින් මහ බැංකුව විසින් රීති සාදනු ලැබිය යුතු ය.

(ආ) පරිපාලනමය දඩ සම්බන්ධයෙන් වන විට, පරිපාලනමය දඩ මුදල පාලක මණ්ඩලය විසින් නියම කරනු ලැබිය යුතු ය.

(4) පරිපාලනමය ක්‍රියාමාර්ග ගනු ලැබිය යුත්තේ ද යන්න සහ ඒ ක්‍රියාමාර්ගවල ප්‍රමාණය පිළිබඳ තීරණය කිරීමේ දී, මහ බැංකුව විසින් -

(අ) උල්ලංඝනය කිරීමේ බරපතළභාවය සහ ඒ උල්ලංඝනය කිරීම නැවත නැවත සිදු වන්නේ ද යන්න;

(ආ) ඒ උල්ලංඝනය කිරීම හේතුවෙන් තැන්පත්කරුවන්ට හෝ වෙනත් යම් තැනැත්තකුට අලාභයක් හෝ හානියක් සිදු වන්නේ ද යන්න;

(ඇ) දණ්ඩනයක් නියම කරනු ලැබිය යුත්තේ යම් තැනැත්තකුට විරුද්ධව ද, ඒ තැනැත්තා ඒ උල්ලංඝනය කිරීම මගින් අයථා ලෙස ප්‍රතිලාභයක් ලැබුවේ ද යන්න;

(ඈ) ඒ තැනැත්තාගේ මූල්‍යමය සම්පත්;

(ඉ) යම් ලිහිල් කිරීමේ සාධක; සහ

(ඊ) අදාළ යයි එය විසින් සලකනු ලබන වෙනත් යම් කාරණා,

පිළිබඳ සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(5) යම් ලිඛිත හෝ වෙනත් නීතියක කුමක් සඳහන් වුව ද, කිසිදු තැනැත්තකු, මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද හෝ දෙන ලද යම් රීතියක්, නියමයක් හෝ විධානයක් ඉටු කිරීමේ දී හෝ ඊට අනුකූලව කටයුතු කිරීමේ දී ඒ තැනැත්තා විසින් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් හේතුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් විඳින ලද හෝ දරන ලද හෝ විඳිනු ලදැයි හෝ දරන ලදැයි කියනු ලබන යම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් යම් අධිකරණයක යම් නඩුවකට හෝ නඩු කටයුත්තකට භාජනය නො විය යුතු ය. නැතහොත් යටත් වනු නො ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්යය සඳහා "පරිපාලනමය ක්‍රියාමාර්ග" යන්නට, පරිපාලනමය දඩ, ලිඛිත අවවාද කිරීම් හෝ නියම කිරීම්, මුල්‍ය ආයතනවල පරිපාලකයන් අත්හිටුවීම සහ පහ කිරීම, බලපත්‍ර අහෝසි කිරීම සහ මේ පනතින් හෝ වෙනත් යම් අදාළ නීතියකින් නිශ්චිතව දක්වනු ලබන වෙනත් ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

බැංකු ආයතනයක ව්‍යාපාර කටයුතු අත්හිටුවීම හෝ පරිසීමා කිරීම සඳහා මහ බැංකුව සතු බලය.

**110.** (1) මහ බැංකුවේ සේවානියුක්තයකු හෝ මහ බැංකුව විසින් බලය දෙන ලද සුදුසුකම්ලත් තැනැත්තකු, තමා විසින් ම හෝ යම් පරීක්ෂකවරයකු ලවා යම් බැංකු ආයතනයක කටයුතු පිළිබඳ පරීක්ෂා කර බැලීමෙන් පසු හෝ ඒ ආයතනයෙන් ලැබුණු තොරතුරු අනුව, ඒ ආයතනය බුන්වත් බවට හෝ එහි තැන්පත්කරුවන්ගේ ඉල්ලීම් සපුරාලීමට නොහැකි වීමට ඉඩ ඇති බවට හෝ එය ව්‍යාපාර කටයුතුවල දිගටම නිරත වීම මගින් එහි තැන්පත්කරුවන්ට හෝ ණය හිමියන්ට අලාභයක් සිදු වීමට ඉඩ ඇති බවට සෑහීමට පත්වන අවස්ථාවක දී, මහ බැංකුවේ ඒ සේවානියුක්තයා හෝ මහ බැංකුව විසින් බලය දෙන ලද ඒ සුදුසුකම්ලත් තැනැත්තා විසින්, මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම සඳහා ඒ පිළිබඳ වාර්තාවක් මහ බැංකු අධිපතිවරයා වෙත යවනු ලැබිය යුතු ය.

(2) මහ බැංකුව විසින්, ඒ කාරණා සහ අවස්ථානුගත කාරණා සමාලෝචනය කිරීමෙන් පසු, මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති පරිදි ක්‍රියාමාර්ග ගත යුතු බව මහ බැංකුවේ මතය වන අවස්ථාවක, මහ බැංකුව විසින්, ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු වහාම අත්හිටුවන ලෙස ඒ ආයතනයට විධාන කරමින් සහ ඒ ආයතනයේ සියලු පොත්පත්, වාර්තා සහ වත්කම් තම භාරයට ගන්නා ලෙස සහ ඒ ආයතනය විසින් තවදුරටත් ව්‍යාපාර කටයුතු කරගෙන යාම වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස

මහ බැංකුවේ සේවානියුක්තයකුට හෝ මහ බැංකුව විසින් බලය දෙන ලද සුදුසුකම්ලත් තැනැත්තකුට විධාන කරමින් නියමයක් කරනු ලැබිය හැකි ය.

(3) යම් ලිඛිත හෝ වෙනත් නීතියක කුමක් සඳහන් වුව ද, (2) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයක් සමාලෝචනය කරවා ගැනීමේ හෝ අහෝසි කරවා ගැනීමේ කාර්යය සඳහා හෝ ඒ නියමය හේතුවෙන් දරන ලද හෝ දරනු ලැබීමට ඉඩ ඇති හෝ දරන ලදැයි කියනු ලබන යම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් යම් අධිකරණයක දී කිසිම නඩුවක් හෝ නඩු කටයුත්තක් පවරනු ලැබිය හැකි නො විය යුතු ය.

(4) යම් බැංකු ආයතනයක් සම්බන්ධයෙන් (2) වන උපවගන්තිය යටතේ මහ බැංකුව විසින් කරන ලද යම් නියමයක්, ඒ නියමය කරන ලද දින සිට මාස හයක කාලසීමාවක් ඉකුත් වීමෙන් පසු බලාත්මක වීම නතර විය යුතු ය; ප්‍රායෝගිකව හැකි තාක් ඉක්මනින්, එහෙත් ඕනෑම විටක දී ඒ කාලසීමාව ඉකුත් වීමට පෙර-

(අ) කොන්දේසි විරහිතව හෝ මහජන යහපත හෝ ඒ ආයතනයේ තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් ණයහිමියන්ගේ යහපත පිණිස අවශ්‍ය යයි මහ බැංකුව විසින් සලකනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා ඒ ආයතනයට අවසර දෙමින් නියමයක් කිරීම; හෝ

(ආ) තත්කාර්ය සඳහා අදාළ විය හැකි යම් ලිඛිත නීතියක් යටතේ ආයතනය ගණන් බේරා වසා දැමීම සඳහා නිසි අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට මහ බැංකුවේ සේවානියුක්තයකුට හෝ මහ බැංකුව විසින් බලය දෙන ලද සුදුසුකම්ලත් තැනැත්කුට ඉඩ සැලැස්වීම; හෝ

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද ආයතනයේ ශාඛාවක කටයුතු ගණන් බේරා වසා දැමීම සඳහා නිසි අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට මහ බැංකුවේ සේවානියුක්තයකුට හෝ මහ බැංකුව විසින් බලය දෙන ලද සුදුසුකම්ලත් තැනැත්තකුට ඉඩ සැලැස්වීම,

මහ බැංකුවේ කාර්යය විය යුතු ය.

(5) අදාළ නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව යම් බැංකු ආයතනයකට ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට අවසර දෙමින් (4) වන උපවගන්තිය යටතේ මහ බැංකුව විසින් නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක දී, නිසි අධිකරණය විසින්, ඒ නියමය බලාත්මකව පවතින ඕනෑම අවස්ථාවක දී ඒ බැංකු ආයතනය විසින් තත්කාර්ය සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් අනුව, කොන්දේසි විරහිතව හෝ මහ බැංකුව විසින් නිශ්චිතව දක්වන ලද කොන්දේසි කිසිවක් හෝ සියල්ල අධිකරණය විසින් තීරණය කරනු ලබන ආකාරයට මඳ වශයෙන් වෙනස් කරමින් හෝ වෙනස් කරමින්, ආයතනයට ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා අවසර දෙමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය; (4) වන උපවගන්තිය යටතේ මහ බැංකුව විසින් කරන ලද නියමයේ කුමක් සඳහන් වුව ද, ඒ ආඥාව බලාත්මක විය යුතු ය.

(6) මහ බැංකුවේ සේවානියුක්තයා හෝ මහ බැංකුව විසින් බලය දෙන ලද සුදුසුකම්ලත් තැනැත්තා ඒ යම් ඉල්ලීමක වගඋත්තරකරු ලෙස නම් කරනු ලැබිය යුතු අතර, මහ බැංකුව වෙනුවෙන් කරුණු දැක්වීම සඳහා සහ ඒ පිළිබඳ නඩු විභාගයේ දී සාක්ෂි ඉදිරිපත් කිරීම සඳහා ඒ මහ බැංකුවේ සේවානියුක්තයා හෝ මහ බැංකුව විසින් බලය දෙන ලද සුදුසුකම්ලත් තැනැත්තා හිමිකම් ලැබිය යුතු ය.

(7) යම් බැංකු ආයතනයක් ගණන් බේරා වසා දැමීම සඳහා (4) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි මහ බැංකුවේ සේවානියුක්තයකු හෝ මහ බැංකුව විසින් බලය දෙන ලද සුදුසුකම්ලත් තැනැත්තකු විසින් ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක දී-

(අ) අධිකරණය විසින් එසේ කිරීමට අවසර දෙනු ලැබුවහොත් මිස සහ අධිකරණය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි කොන්දේසි කිසිවක් ඇත්නම් ඒ කොන්දේසිවලට අනුකූලව මිස, ඒ ඉල්ලීම විභාග වෙමින් පවතින කාලය අතරතුර ඒ ආයතනය විසින් ව්‍යාපාර කටයුතු කරගෙන යනු නො ලැබිය යුතු ය; සහ

(ආ) අධිකරණය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් පරීක්ෂණයකින් පසු, ඒ ආයතනය බුන්වත් නොවන බව අධිකරණයේ මතය වන අවස්ථාවක, කොන්දේසි විරහිතව හෝ මහජන යහපත හෝ ඒ ආයතනයේ තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් ණයහිමියන්ගේ යහපත

පිණිස අවශ්‍ය යයි අධිකරණය විසින් සලකනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා ඒ ආයතනයට අවසර දෙමින් අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(8) මේ වගන්තිය යටතේ නිසි අධිකරණයක් විසින් කරන ලද සෑම ආඥාවක් ම අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කිරීමට යටත් විය යුතු අතර, සිවිල් නඩුවල අභියාචනාවලට අදාළ සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ යම් අභියාචනයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය:

එසේ වුව ද, (7) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වන යම් ආඥාවක් අවසානාත්මක විය යුතු අතර අභියාචනා කිරීමට යටත් නො විය යුතු ය.

(9) මේ වගන්තිය යටතේ නිසි අධිකරණයක් වෙත ඉදිරිපත් කරන ලද සෑම ඉල්ලීමක් ම රුපියල් පන්දහසක වටිනාකමක නඩුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(10) මේ වගන්තියේ, යම් බැංකු ආයතනයකට අදාළව "නිසි අධිකරණය" යන්නෙන්, කොළඹ දිසා අධිකරණය හෝ ඒ ආයතනයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය අදහස් වේ.

(11) (2) වන උපවගන්තිය යටතේ යම් බැංකු ආයතනයක ව්‍යාපාර කටයුතු අත්හිටුවනු ලැබ ඇති අවස්ථාවක දී, මහ බැංකුව විසින්-

(අ) ඒ බැංකු ආයතනයේ ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය වන බවට මහ බැංකුව විසින් සලකනු ලැබිය හැකි යම් ක්‍රියාමාර්ගයක් වහාම ගැනීම සඳහා හෝ යම් ක්‍රියාවක් හෝ දෙයක් සිදු කිරීම සඳහා ඒ බැංකු ආයතනයට නියම කිරීම;

(ආ) ඒ බැංකු ආයතනයේ, ව්‍යාපාර කටයුතු නිසි ආකාරයෙන් සිදු කිරීම සම්බන්ධයෙන් ඒ බැංකු ආයතනයට උපදෙස් ලබා දීම සඳහා යෝග්‍ය සහ සුදුසු තැනැත්තකු පත් කිරීම;

(ඇ) ඒ බැංකු ආයතනයේ ව්‍යාපාර කටයුතුවල පාලනය භාර ගැනීම සහ ව්‍යාපාර කටයුතු සිදු කිරීම හෝ ඒ බැංකු ආයතනයේ ව්‍යාපාර කටයුතු සිදු කිරීම වෙනත් තැනැත්තකු වෙත පැවරීම;

(ඇ) ඒ බැංකු ආයතනයේ ප්‍රාග්ධනය වැඩි කිරීම සහ අලුත් කොටස්හිමියන් ඒකරාශී කිරීම මගින් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිෂ්ඨාපනය කිරීම මගින් ඒ බැංකු ආයතනය ප්‍රතිසංවිධානය කිරීම; සහ

(ඉ) ඒ බැංකු ආයතනය, ඒකාබද්ධ කිරීම සඳහා කැමැත්ත දක්වන වෙනත් යම් බැංකු ආයතනයක් සමඟ ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය වන යම් වැඩපිළිවෙළ යෙදීම,

සිදු කරනු ලැබිය හැකි ය.

(12) (අ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සම්බන්ධයෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ 76ක වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මහ බැංකුව විසින් නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක දී, බැංකු පනතේ 76ක වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල කුමක් සඳහන් වුව ද, මේ වගන්තියේ (4), (5), (7), (8), (9), (10) සහ (11) වන උපවගන්තිවල විධිවිධාන මේ උපවගන්තියේ (ii) වන ඡේදයට යටත්ව, ඒ බලපත්‍රලාභී විශේෂිත බැංකුව, බැංකු ආයතනයක් ලෙස සලකා අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ බැංකුව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(ආ) මේ උපවගන්තියේ (i) වන ඡේදය යටතේ මේ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වීම මගින් -

(i) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ගණන් බේරා වසා දැමීමට නියම කරනු ලබන අවස්ථාවක දී, බැංකු පනතේ IXඅ වන කොටස යටතේ ඒ බැංකුව වෙත නිකුත් කරන ලද බලපත්‍රය මහ බැංකුව විසින් අවලංගු කළ යුතු අතර, ඒ පනතේ VIII වන කොටසේ විධිවිධාන, ශ්‍රී ලංකාව ඇතුළත සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බැංකුවක් සම්බන්ධයෙන් වන විට, ඒ ගණන් බේරා වසා දැමීම අනිවාර්ය ගණන් බේරා වසා දැමීමක් ලෙස සලකා ඒ ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් අදාළ විය යුතු අතර, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද බැංකුවක් සම්බන්ධයෙන් වන විට, ඒ බැංකුවේ කටයුතු අනිවාර්ය ගණන් බේරා වසා දැමීමක් හෝ බැංකුවේ ව්‍යාපාර කටයුතු වසා දැමීමක් ලෙස සලකා ඒ බැංකුව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය;

(ii) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට නියම කරනු ලබන අවස්ථාවක දී, 1988 අංක 30 දරන බැංකු පනතේ 76ග වගන්තිය යටතේ

මහ බැංකුව වෙත පවරා ඇති බලතල මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(ඇ) මේ උපවගන්තියේ "බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නට, 1988 අංක 30 දරන බැංකු පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

පුහුණු කිරීම.

**111.** මහ බැංකුවේ ක්‍රියාකාරීත්වය සඳහා අදාළ වන විෂයයන් සම්බන්ධයෙන් තාක්ෂණික තැනැත්තන් පුහුණු කිරීම මහ බැංකුව විසින් ප්‍රවර්ධනය කර ඒ සඳහා අනුග්‍රහ දැක්විය යුතු අතර, ඒ කාර්යය සඳහා කුසලතා පෙන්නුම් කරන මහ බැංකුවේ සේවානියුක්තයන්ගේ හෝ මහ බැංකුව විසින් තෝරා ගනු ලැබූ වෙනත් යම් සුදුසුකම්ලත් තැනැත්තන්ගේ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත අධ්‍යයන පිරිවැය පියවීම සඳහා මහ බැංකුව වෙත මෙයින් බලය පවරනු ලැබේ.

මේ පනත යටතේ වන වැරදි.

**112.** (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් රීතියක්, නියමයක් හෝ විධානයක් උල්ලංඝනය කරන හෝ ඊට අනුකූල වීමට අපොහොසත් වන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) මේ පනත යටතේ වූ වරදක් සංස්ථාවක් විසින් කරනු ලබන අවස්ථාවක දී, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු ව සිටි සෑම තැනැත්තකු ම, ඒ වරද ඒ තැනැත්තාගේ දැනුම නොමැතිව සිදු කරන ලද බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා විසින් සියලු නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව ඒ තැනැත්තා විසින් ඔප්පු කරන්නේ නම් මිස, ඒ වරද සිදු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

වරදවල් සමථයකට පත් කිරීම.

**113.** (1) මේ පනත යටතේ යම් වරදක් සිදු කරන ලද අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, පාලක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි රුපියල් මිලියන දහයක් නො ඉක්මවන මුදල් ප්‍රමාණයක් සඳහා ඒ වරද සමථයකට පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ යම් වරදක් සමථයකට පත් කිරීම, චූදිත තැනැත්තා නිදොස් කිරීමක් ලෙසින් බල සහිත විය යුතු ය.

ගාස්තු සහ අයකිරීම්.

**114.** (1) මේ පනත යටතේ මහ බැංකුව විසින් ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ සිදු කිරීමේ දී සපයනු ලබන සේවා සඳහා මහ බැංකුව විසින් ගාස්තු හෝ අයකිරීම් එකතු කළ හැකි ය.

(2) මහ බැංකුව විසින්, ඒ ගාස්තු හෝ අයකිරීම් තම නිල වෙබ් අඩවියෙහි පළ කළ යුතු ය.

(3) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව මහ බැංකුව විසින් රජය වෙත සපයනු ලබන සේවා සඳහා මහ බැංකුව වෙත වෙළෙඳපොළ අනුප්‍රමාණ අනුව ප්‍රතිපූරණය කරනු ලැබිය යුතු ය.

තහනම් කළ ක්‍රියාකාරකම්

**115.** (1) මේ පනත මගින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් අන්‍යාකාරයෙන් විශේෂිතව ම බලය ලබා දී ඇති පරිදි මිස, මහ බැංකුව විසින් -

(අ) මේ පනත යටතේ බලය ලබා දී ඇති පරිදි මිස, යම් ණයක් ලබා දීම හෝ යම් මුදල්මය හෝ මූල්‍යමය ලාභයක් ඉපැයීම;

(ආ) ස්වකීය හිමිකම් කිසිවක් සපුරා ගැනීමේ දී යම් අයිතිවාසිකමක් අත්කර ගනු ලබන අවස්ථාවක දී මිස, යම් වෙළෙඳාමක නිරත වීම හෝ අන්‍යාකාරයක වාණිජමය, කාර්මික හෝ වෙනත් ව්‍යවසායක ඍජු අයිතිවාසිකමක් ඇතිකර ගැනීම:

එසේ වුව ද, ඒ සියලු අයිතිවාසිකම් හැකි මුල්ම අවස්ථාවේ දී බැහැර කරනු ලැබිය යුතු ය;

(ඇ) වෙනත් යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක හෝ යම් සමාගමක කොටස් මිල දී ගැනීම හෝ ඒ කොටස් සුරැකුම් මත ණය හෝ අත්තිකාරම් ලබා දීම;

(ඈ) නිශ්චල දේපළ හෝ ඊට අදාළ හිමිකම් ලේඛන උකස් කිරීම මත හෝ අන්‍යාකාරයෙන් ඇපයට තැබීම මත ණය හෝ අත්තිකාරම් ලබා දීම; හෝ

(ඉ) ස්වකීය පරිපාලනය සහ මෙහෙයුම් කටයුතු සඳහා පරිශ්‍රයන් සැපයීම සඳහා හෝ එහි කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා ආනුෂංගික වන වෙනත් යම් අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය බවට මහ බැංකුව විසින් සලකනු ලැබිය යුතු පරිදි මිස, ඉඩම් දේපළ පිළිබඳ යම් අයිතිවාසිකමක් හෝ ඉඩම් දේපළ සඳහා යම් අයිතිවාසිකමක් මිලදී ගැනීම මගින්, බදු දීම මගින් හෝ වෙනත් යම් ආකාරයකින් අත්කර ගැනීම,

නො කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මහ බැංකුව විසින් -

(අ) පාලක මණ්ඩලයේ අදහස අනුව, ශ්‍රී ලංකාවේ බැංකු සහ මුල්‍ය ක්ෂේත්‍රයෙහි මානව සම්පත් අභිවෘද්ධිය හා ප්‍රවර්ධනය සඳහා සහ තාක්ෂණික සංවර්ධනය සඳහා හෝ යම් පහසුකමක් හෝ සියලු පහසුකම් සැපයීම සඳහා පිහිටුවනු ලැබූ යම් සමාගමක යම් හිමිකාරීත්ව කොටසක් සතුව සිටීම හෝ ඒ යම් සමාගමකට වෙනත් යම් ආකාරයකින් සහභාගීවීමක් ඇතුළුව මහ බැංකුවේ කර්තව්‍ය නිසි ආකාරයෙන් ඉටු කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන ක්‍රියාකාරකම්වල නිරත වන යම් සංවිධානයකට ප්‍රමාණවත් ලෙස සුරක්ෂිත කරන ලද ණය සැපයීම හෝ ඒ යම් සංවිධානයක හිමිකාරීත්ව කොටසක් සතුව සිටීම හෝ ඊට වෙනත් යම් ආකාරයකින් සහභාගී වීම;

(ආ) පාලක මණ්ඩලය විසින් සාදන ලද රීතිවලට අනුකූලව මහ බැංකුවේ යම් සේවානියුක්තයකු වෙත ණය ප්‍රදානය කිරීම;

(ඇ) මහ බැංකුවේ සේවානියුක්තයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සහ නාමිකයන්ගේ ප්‍රතිලාභය සහ ආරක්ෂාව සඳහා සේවානියුක්තයන්ගේ විශ්‍රාම අරමුදල් හෝ ඊට සමාන වැඩපිළිවෙළ ස්ථාපිත කිරීම සහ ඒ අරමුදල් හෝ වැඩපිළිවෙල කළමනාකරණය කිරීම; සහ

(ඈ) මහ බැංකුවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් දේපළ බදු දීම,

කළ හැකි ය.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් යම් ක්‍රියාකාරකමක් 81 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් වාර්තාවෙහි මහ බැංකුව විසින් පළ කරනු ලැබිය යුතු ය.

මේ පනතේ විධිවිධාන වෙනත් ලිඛිත නීති අභිබවා බලපැවැත්විය යුතු බව.

**116.** 120 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ ඒ වෙනත් ලිඛිත නීතියේ විධිවිධාන අතර යම් අනනුකූලතාවක් හෝ ගැටීමක් ඇතිවුවහොත් මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

**117.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද -

බදුවලින් නිදහස් කිරීම.

(අ) මහ බැංකුව ආදායම් බදු ගෙවීමෙන් නිදහස් විය යුතු ය;

(ආ) මහ බැංකුව විසින් බැඳුම්කරයක් මත ආනයනය කරනු ලැබූ හෝ මිල දී ගනු ලැබූ කවර හෝ විස්තරයකට අයත් සියලු භාණ්ඩ රේගු බදුවලින් නිදහස් විය යුතු ය; සහ

(ඇ) මහ බැංකුව විසින් හෝ මහ බැංකුව වෙනුවෙන් හෝ මහ බැංකුවට පක්ෂව සාදන ලද යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් මහ බැංකුව විසින් මුද්දර ගාස්තු ගෙවීමට යටත් වන අවස්ථාවක දී, මහ බැංකුව ඒ සාධන පත්‍රය සම්බන්ධයෙන් මුද්දර ගාස්තු ගෙවීමෙන් නිදහස් විය යුතු ය.

වරණීය අයිතිවාසිකම.

**118.** (1) යම් හිමිකමක් අයවිය යුතු හෝ ගෙවිය යුතු අවස්ථාවේ දී ස්වකීය හිමිකම් සුරක්ෂිත කර ගැනීම සඳහා, සමපාර්ශ්වීය ද්‍රව්‍ය ආකාරයෙන් හෝ වෙනත් යම් ආකාරයකින් අදාළ ණයගැතියාගේ ගිණුම වෙනුවෙන් මහ බැංකුව විසින් පවත්වා ගෙන යනු ලබන යම් මුදල් ශේෂවලින්, සුරැකුම්වලින් හා වෙනත් වත්කම්වලින් මහ බැංකුවෙහි කර්තව්‍ය ඉටු කිරීම තුළින් පැන නගින එහි එක් එක් හිමිකම් සපුරා ගැනීම සඳහා වෙනත් සියලු හිමිකම්වලට එරෙහිව, මහ බැංකුවට මුල් ප්‍රමුඛතාවය සහ කොන්දේසි විරහිත වරණීය අයිතිවාසිකමක් තිබිය යුත්තේ ය.

(2) මහ බැංකුව විසින්, මුදල් ශේෂ වන්දි මුදල් වශයෙන් විසර්ජනය කිරීම මගින් සහ වාණිජමය වශයෙන් සාධාරණ ආකාරයෙන් අනිසි ප්‍රමාදයකින් තොරව සුරැකුම්පත් සහ වෙනත් වත්කම් විකුණා ඒ විකිණීමෙන් ලද මුදලින් ඒ විකිණීම හා සම්බන්ධ පිරිවැය අඩුකිරීමෙන් පසුව තමා වෙත ගෙවීම් සිදු කිරීම මගින් පමණක් ස්වකීය වරණීය අයිතිවාසිකම ක්‍රියාත්මක කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ මහ බැංකුවේ වරණීය අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීම සඳහා යම් අධිකරණයක් හෝ යම් රාජ්‍ය අස්ථිත්වයක් විසින් යම් ක්‍රියාමාර්ගයක් ගැනීම අවශ්‍ය නොවන අතර, (2) වන උපවගන්තිය අනුව මහ බැංකුව විසින් ස්වකීය වරණීය අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කරවීම සඳහා වූ වෙනත් කිසිදු හිමිකම් ඉල්ලීමකට අවසර ලබා නො දිය යුතු ය.

**119.** (1) ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද යම් අධිකරණයක් විසින් අවසන් තීන්දුවක් නිකුත් කිරීමට පෙර මහ බැංකුවට විරුද්ධව හෝ රත්‍රන්, විශේෂ ගැණුම් හිමිකම්, ව්‍යවහාර මුදල්, ණය, තැන්පතු හෝ සුරැකුම් සහ ඒවායින් වන යම් ලැබීමක් ඇතුළුව මහ බැංකුවේ දේපළවලට විරුද්ධව කිසිදු තහනමක් හෝ ඇස්කිසි කිරීමක් නිකුත් කරනු නො ලැබිය යුතු ය.

නඩු තීන්දුවලට පෙර තහනම් කිරීම්වලින් මුක්තිය.

(2) මහ බැංකුව විසින්, තම අභිමතය පරිදි, ස්වකීය රත්‍රන් සහ විශේෂ ගැණුම් හිමිකම් සම්බන්ධයෙන් හැර, පැහැදිලිව සහ ලිඛිතව, සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් ඒ ආරක්ෂාව අත් හළ හැකි ය.

**120.** (1) පාලක මණ්ඩලයේ, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ, විධායක මණ්ඩලයේ හෝ මුල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවේ සාමාජිකයකු ලෙස හෝ මහ බැංකුවේ සේවානියුක්තයකු ලෙස හෝ මහ බැංකුවේ අධිකාරි බලය යටතේ වෙනත් යම් තත්ත්වයකින් සේවය කරන හෝ සේවය කර ඇති කිසිදු තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ඒ තැනැත්තාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කිරීමේ දී හෝ සිදු කිරීමේ දී හැර, ස්වකීය කාර්ය සිදු කිරීමේ දී ඔහු විසින් ලබා ගෙන ඇති යම් ප්‍රසිද්ධ නොවන තොරතුරකට ප්‍රවේශ වීම සඳහා ඉඩදීම, ඒ තොරතුරු හෙළිදරව් කිරීම හෝ ප්‍රසිද්ධ කිරීම හෝ පෞද්ගලික වාසිය සඳහා ඒ තොරතුර භාවිත කිරීම හෝ භාවිත කිරීමට ඉඩ ලබා දීම නො කළ යුතු ය.

රහස්‍යභාවය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, ඒ උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් ප්‍රසිද්ධ නොවන තොරතුරක් අනාවරණය කිරීම-

(අ) ඒ තොරතුරු අදාළ වන ස්වභාවික තැනැත්තාගේ හෝ නෛතික තැනැත්තාගේ ලිඛිත කැමැත්ත පරිදි සිදු කරන්නේ නම්;

(ආ) අධිකරණයක නියමයක් පරිදි හෝ මේ පනතේ හෝ තත් කාලයෙහි බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක වෙනත් යම් විධිවිධානවලට අනුකූල වීම පිණිස සිදු කරන්නේ නම්;

(ඇ) මහ බැංකුවේ විගණන කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණයට මහ බැංකුවේ බාහිර විගණකවරුන් වෙත සිදු කරන්නේ නම්;

(ඇ) මහ බැංකුව හා සම්බන්ධ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී, දේශීය හෝ විදේශීය නියාමන, අධීක්ෂණ හෝ මුදල් අධිකාරීන් වෙත හෝ ජාත්‍යන්තර රාජ්‍ය මූල්‍ය ආයතන වෙත තොරතුරු සැපයීම සඳහා සිදු කරන්නේ නම්; හෝ

(ඉ) යම් නීති කෘත්‍යයක දී මහ බැංකුවේ යහපත පිණිස සිදු කිරීම අවශ්‍ය කරනු ලබන්නේ නම්, පාලක මණ්ඩලය විසින් නියම කරනු ලැබූ කාර්ය පටිපාටිවලට අනුව, මහ බැංකුවෙන් පිටතට, ප්‍රසිද්ධ නොවන තොරතුරු අනාවරණය කළ හැකි ය.

(3) මහ බැංකුව විසින් දරනු ලබන හෝ රැස් කරනු ලබන තොරතුරු වර්ගීකරණය කිරීම සහ ඒ තොරතුරුවලට ප්‍රවේශය දීම පිළිබඳව තීරණය කිරීම සඳහා පාලක මණ්ඩලය හිමිකම් ලැබිය යුතු ය.

(4) යම් නඩු කටයුත්තක දී මහ බැංකුවේ යම් පොතක හෝ ලේඛනයක හෝ ඒ පොතෙහි හෝ ලේඛනයෙහි යම් සටහනක සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, ඒ සහතික කරන ලද පිටපත අවස්ථාවෝචිත පරිදි, ඒ පොතෙහි, ලේඛනයෙහි හෝ සටහනෙහි පැවැත්ම පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර, වර්තමානයෙහි නීතිය මගින් ආවේශ්‍ය කළ හැකි ප්‍රමාණයට සහ ඒ ප්‍රමාණයට පමණක් සහ වෙනත් ආකාරයකින් නොවන පරිදි, සෑම අවස්ථාවක දීම, ඒ මුල් පොතෙහි, ලේඛනයෙහි හෝ සටහනෙහි සටහන් කරනු ලැබූ කරුණුවල, ගනුදෙනුවල හෝ ගිණුම්වල සාක්ෂියක් වශයෙන් ආවේශ්‍ය කර ගනු ලැබිය යුතු ය.

(5) මේ උපවගන්තියේ, යම් පොතක්, ලේඛනයක් හෝ සටහනක් සම්බන්ධයෙන් "සහතික කරන ලද පිටපත" යන්නෙන්, ඒ පොතෙහි, ලේඛනයෙහි හෝ සටහනෙහි පිටපතක් වන්නා වූ ද, ඒ පිටපතෙහි යට කොටසෙහි -

(අ) එය ඒ පොතෙහි, ලේඛනයෙහි හෝ සටහනෙහි සත්‍ය පිටපතක් වන බවට;

(ආ) ඒ පොත හෝ ලේඛනය තවමත් මහ බැංකුව භාරයේ පවතින බවට;

(ඇ) ඒ සටහන මහ බැංකුවේ සාමාන්‍ය පොත්වලින් එකක අඩංගු වන බවට සහ සුපුරුදු සහ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී කරනු ලැබූ බවට,

වන සහතිකයක් ඇත්තා වූ ද, ඒ සහතිකය සම්බන්ධයෙන් මහ බැංකුවේ අධිපතිවරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබිය හැකි නිලධරයකුගේ නම සහ නිල නාමය පිටසන් කර, දාතම යොදන ලද්දා වූ ද, පිටපතක් අදහස් වේ.

(6) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳපනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන සහ මේ පනතේ විධිවිධාන අතර යම් අනනුකූලතාවක් හෝ ගැටීමක් ඇතිවුවහොත්, මහ බැංකුවේ යම් තොරතුරක් සම්බන්ධයෙන්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අධිකරණ සමාලෝචනය.

**121.** පාලක මණ්ඩලයේ, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ හෝ විධායක මණ්ඩලයේ කිසිදු සාමාජිකයකු හෝ ඊට පෙර ඒ යම් තනතුරක් දරන ලද තැනැත්තකු ද ඇතුළුව මහ බැංකුවේ යම් සේවා නියුක්තයකු මහ බැංකුව වෙනුවෙන් බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හෝ සිදු කිරීමේ දී සහ ක්‍රියාත්මක කරන, ඉටුකරන සහ සිදු කරන අතරතුර දී කරන ලද යම් හානියක් සඳහා හෝ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා ඒ හානිය, ක්‍රියාව හෝ නොකර හැරීම සද්භාවයෙන් තොරව සිදු කරන ලද බව හෝ එමගින් චේතනාන්විත වැරදි සහගත විෂමචාරයක් හෝ සිතාමතා කරන ලද පැහැර හැරීමක් සංස්ථාපනය වන බව ඔප්පු කරනු ලැබ ඇත්තේ නම් මිස, වගකීමකට යටත් නො විය යුතු ය.

නඩුකටයුතුවල ගාස්තු හානිපූරණය.

**122.** (1) පාලක මණ්ඩලයේ, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සහ විධායක මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම සහ මහ බැංකුවේ සේවානියුක්තයන් සහ ඒ යම් මණ්ඩලයක සාමාජිකයකු ව සිටි හෝ මහ බැංකුවේ සේවානියුක්තයකුව සිටි සෑම තැනැත්තකු ම ඔහුගේ යම් විෂමාචාරයක් හෝ සිතාමතා සිදුකරන ලද පැහැර හැරීමක් හේතුවෙන් සංස්ථාපනය වී ඇතැයි පාලක මණ්ඩලය විසින් සලකනු ලැබිය හැකි යම් අලාභ සහ වියදම් හැර, මේ පනත යටතේ වන ඔහුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ සිදු කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් දරන ලද සියලු අලාභ සහ වියදම් මහ බැංකුව විසින් හානිපූරණය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, ඒ හානිපූරණයක ප්‍රතිලාභය ලබන සෑම තැනැත්තකු ම යම් ව්‍යවස්ථාපිත අධිකාරියක් විසින් පවත්වනු ලබන යම් පරීක්ෂණයක් හෝ විමර්ශනයක්

සම්බන්ධයෙන් හෝ ඒ තැනැත්තාට විරුද්ධව පවරන ලද යම් නඩු කටයුත්තක් සම්බන්ධයෙන් නෛතික උපදෙස් ඉල්ලා සිටීමට හෝ නෛතික නියෝජනය ලබා ගැනීමට හිමිකම් ලැබිය යුතු ය. ඒ පරීක්ෂණය හෝ විමර්ශනය හෝ නඩු කටයුත්ත සම්බන්ධයෙන් සාධාරණ ලෙස දරනු ලැබිය හැකි යම් ගාස්තුවක්, ඒ ගාස්තුව දරනු ලැබූ අවස්ථාවේ දී මහ බැංකුව විසින් ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් තැනැත්තකුගේ විෂමාචාරය හෝ සිතාමතා සිදු කරන ලද පැහැර හැරීමක් හේතුවෙන් ඒ තැනැත්තා මහ බැංකුව විසින් හානිපූරණය කරනු ලැබීමට හිමිකම් නො ලබන බවට තීරණය කරනු ලැබූ අවස්ථාවක දී, ඉල්ලා සිටිනු ලැබූ විට, මහ බැංකුව විසින් එසේ දරන ලද මුළු ගාස්තුව ඒ තැනැත්තා විසින් වහාම මහ බැංකුවට ප්‍රතිපූරණය කිරීම අවශ්‍ය වන්නේ ය. ප්‍රතිපූරණය කරන තෙක්, එසේ ඉල්ලා සිටිනු ලැබූ මුදල, ඒ තැනැත්තා විසින් මහ බැංකුවට ගෙවිය යුතු ණයක් සංස්ථාපනය කරන්නේ ය.

සාමාජිකයන් හා සේවා නියුක්තයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**123.** පාලක මණ්ඩලයේ, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සහ විධායක මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම සහ ඒ මණ්ඩලවල සේවා නියුක්තයන් සහ මහ බැංකුවේ සේවානියුක්තයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මහ බැංකුව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**124.** මහ බැංකුව, (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

අර්ථ නිරූපණය.

**125.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"බැංකුව" යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී යම් වාණිජ බැංකුවක් හෝ විශේෂිත බැංකුවක් අදහස් වේ;

"බැංකු ආයතනය" යන්නෙන් -

(අ) යම් වාණිජ බැංකුවක්;

(ආ) ණය හෝ අත්තිකාරම් සපයන හෝ ආයෝජන සිදු කරන හෝ මහජනතාවගෙන් මුදල් තැන්පතු භාරගනු ලබන (යම් ලිඛිත නීතියක් මගින් හෝ වෙනත් ආකාරයකින් පිහිටුවන ලද) රජය වෙනුවෙන් කටයුතු කරන යම් නියෝජ්‍යායතනයක් හෝ ආයතනයක්;

(ඇ) සීමාසහිත කෝපරේටිව් ෆෙඩරල් බැන්ක් ඔෆ් සිලෝන්; සහ

(ඈ) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ කාර්ය සඳහා බැංකු ආයතනයක් විය යුතු බවට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබූ වෙනත් යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක්,

අදහස් වේ.

"සමරු ව්‍යවහාර මුදල් නෝට්ටුව හෝ කාසිය" යන්නෙන්, යම් තැනැත්තකු හෝ විශේෂ අවස්ථාවක් අනුස්මරණය කිරීම සඳහා නිකුත් කරනු ලැබූ ව්‍යවහාර මුදල් නෝට්ටුවක් හෝ කාසියක් අදහස් වේ;

"ව්‍යවහාර මුදල්" යන්නෙන්, මේ පනතේ විධිවිධානවලට අනුව නිකුත් කරන ලදුව සංසරණයේ පවතින සියලු ව්‍යවහාර මුදල් අදහස් වේ;

"අලෙවිකාර ඍජු සහභාගීකරු" සහ "ඍජු සහභාගීකරු" යන යෙදුම් සඳහා (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ සහ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ ඊට දී ඇති අර්ථ ම තිබිය යුතු ය;

"තැන්පතු බැරකම්" යන්නෙන්, ඉල්ලුම් තැන්පතු, විශේෂ තැන්පතු, ඉතිරි කිරීමේ තැන්පතු, කාලීන තැන්පතු, අන්තර් බැංකු මුදල් කැඳවුම් වෙළෙඳපොළ තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හැර යම් ආයතනයක් විසින් කරන ලද ආයෝජන, ණයවර ලිපිවලට එරෙහි ආන්තික, විශ්‍රාම

වැටුප් අරමුදල්, ළමා තැන්පතු යෝජනාක්‍රම සහ සමාන ස්වභාවයක වෙනත් යෝජනාක්‍රම ඇතුළුව විශේෂ තැන්පතු යෝජනාක්‍රම සහ තැන්පතුවල ප්‍රතිඵලයක් ලෙස ඒ තැන්පත්කරුවන් උදෙසා භාරයක් ලෙස දරන හෝ ඒ තැන්පත්කරුවන් වෙනුවෙන් දරන අරමුදල් අදහස් වන නමුත්, ඊට අන්තර් වාණිජ බැංකු තැන්පතු ඇතුළත් නොවේ;

"මූල්‍ය ආයතනය" යන්නෙන්, මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන -

(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක්;

(ආ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්;

(ඇ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ අර්ථානුකූලව යම් බලපත්‍රලත් මුදල් සමාගමක්;

(ඈ) 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනතේ අර්ථානුකූලව යම් ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍යකරණ ආයතනයක්;

(ඉ) මේ පනත යටතේ නිකුත් කරන ලද හෝ නිකුත් කරන ලද බවට සලකනු ලබන මුදල් තැරැව්කාර නියෝගවල අර්ථානුකූලව යම් මුදල් තැරැව්කරුවකු;

(ඊ) (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ හෝ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ අර්ථානුකූලව යම් ප්‍රාථමික අලෙවිකරුවකු;

(උ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ අර්ථානුකූලව යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු; හෝ

(ඌ) තත්කාලයෙහි බලපවත්නා යම් ලිඛිත නීතියක් මගින් මහ බැංකුව වෙත පවරනු ලැබිය හැකි වෙනත් යම් මූල්‍ය ආයතනයක්,

අදහස් වේ;

"මූල්‍ය වෙළෙඳපොළ" යන්නෙන් මූල්‍ය වත්කම් නිර්මාණය කිරීම සහ හුවමාරු කිරීම සඳහා වන සංවිධිත ආයතනික ව්‍යුහයක් හෝ යාන්ත්‍රණයක් අදහස් වේ;

"මුදල් වෙළෙඳපොළ යටිතල පහසුකම්" යන්නට පද්ධතිය මෙහෙයවන්නා ද ඇතුළුව, ගෙවීම්, සුරැකුම්පත්, ව්‍යුත්පන්නයන් හෝ වෙනත් මූල්‍ය ගනුදෙනු නිෂ්කාශනය කිරීමේ, පියවීමේ හෝ වාර්තා කිරීමේ කාර්ය සඳහා භාවිත කරන, සහභාගීත්ව ආයතන අතර පවතින්නා වූ බහුපාර්ශ්වික පද්ධතියක් ඇතුළත් වේ;

"මූල්‍ය ක්ෂේත්‍ර බලධරයා" යන්නෙන්, මූල්‍ය ක්ෂේත්‍ර සහභාගීකරුවකු නියාමනය කිරීම හෝ අධීක්ෂණය කිරීම සඳහා නීතිය මගින් පිහිටුවනු ලැබූ යම් බලධරයකු අදහස් වේ;

"මුදල් ක්ෂේත්‍ර සහභාගීකරු" යන්නෙන් -

(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක්;

(ආ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්;

(ඇ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ අර්ථානුකූලව යම් බලපත්‍රලත් මුදල් සමාගමක්;

(ඈ) 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනතේ අර්ථානුකූලව යම් ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍යකරණ ආයතනයක්;

(ඉ) මේ පනත යටතේ නිකුත් කරන ලද හෝ නිකුත් කරන ලද බවට සලකනු ලබන මුදල් තැරැව්කාර නියෝගවල අර්ථානුකූලව යම් මුදල් තැරැව්කරුවකු;

(ඊ) (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ හෝ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ අර්ථානුකූලව යම් ප්‍රාථමික අලෙවිකරුවකු;

(උ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ අර්ථානුකූලව යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු;

(ඌ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ අර්ථානුකූලව යම් රක්ෂණ සමාගමක්;

(එ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ අර්ථානුකූලව යම් රක්ෂණ තැරැව්කරුවකු හෝ අලාභ ගැළපුම්කරුවකු;

(ඒ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ අර්ථානුකූලව යම් ආයතනික නියෝජිතයකු;

(ඔ) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක්;

(ඕ) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව යම් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු;

(ක) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව ඒකක භාරයක් ක්‍රියාත්මක කරන යම් කළමනාකරණ සමාගමක්;

(ග) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව වෙළෙඳපොළ අතරමැදියකු වශයෙන් ව්‍යාපාර කටයුතු කරගෙන යන යම් තැනැත්තකු;

(ච) තත්කාලයෙහි බලපවත්නා යම් ලිඛිත නීතියක් මගින් මහ බැංකුව වෙත පවරනු ලැබිය හැකි වෙනත් යම් මූල්‍ය ආයතනයක්,

අදහස් වේ;

"මූල්‍ය පද්ධතිය" යන්නෙන්, මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම් හරහා මුදල් සම්ප්‍රේෂණය කිරීමේ සහ අරමුදල් ණයට දීමේ සහ ණයට ගැනීමේ නිරතව සිටින විවිධ මූල්‍ය සාධන පත්‍ර සම්බන්ධයෙන් කටයුතු කරන මූල්‍ය ආයතනවල සහ වෙළෙඳපොළවල ජාලයක් අදහස් වේ;

"රජය" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය අදහස් වේ;

"ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව" යන්නෙන්, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"මුදල්මය බැරකම්" යන්නෙන්, සංසරණය වන ව්‍යවහාර මුදල්, බලපත්‍රලාභී වාණිජ බැංකු හා රජයේ නියෝජ්‍යායතන විසින් මහ බැංකුව තුළ දරනු ලබන තැන්පතු ඇතුළු සංචිත මුදල් සහ මහ බැංකුවේ පවතින සියලුම වර්ගවල බැරකම් හා මුදල් පදනමෙහි විශ්ලේෂණාත්මක භාවිතය සැලකිල්ලට ගෙන මහ බැංකුව විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි එවැනි වෙනත් බැරකම් අදහස් වේ;"

"මුදල් සැපයුම" යන්නෙන්, සියලුම ව්‍යවහාර මුදල්, ඉල්ලුම් තැන්පතු, කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු සහ මහ බැංකුව විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි වූ ද සහ රජයට, (වාණිජ) බැංකුවලට සහ මහ බැංකුව විසින් නියම කරනු ලැබිය හැකි මූල්‍ය ආයතනවලට හෝ මූල්‍ය ආයතන කාණ්ඩවලට හැර, තැනැත්තන්ට අයිතිය ඇත්තා වූ ද වෙනත් මූල්‍ය වත්කම් අදහස් වේ;

"නෝට්ටුව" යන්නෙන්, 1941 අංක 21 දරන ව්‍යවහාර මුදල් ආඥාපනත යටතේ කොමසාරිස්වරුන්ගේ මණ්ඩලය විසින් නිකුත් කරන ලද හෝ නිකුත් කරන ලදැයි සලකනු ලබන ව්‍යවහාර මුදල් නෝට්ටුවක් ඇතුළුව මහ බැංකුව විසින් නිකුත් කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටුවක් අදහස් වේ;

"වෙනත් මූල්‍යමය බැරකම්" යන්නෙන්, මූල්‍ය ආයතනයක් සම්බන්ධයෙන් වන විට, ඒ මූල්‍ය ආයතනය විසින් තම ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී, විනිමය බිල්පත්,

පොරොන්දු නෝට්ටු, බැඳුම්කර, සහතික පත්‍ර, නෝට්ටු, වාණිජ පත්‍ර හෝ මහජනයාගෙන් මුදල් ලබාගන්නා ඊට සමාන වෙනත් යම් සාධන පත්‍රයක් හෝ නිකුත් කිරීමෙන් මහජනයාගෙන් යම් ආකාරයකින් මුදල් භාරගැනීම මගින් ඒ මූල්‍ය ආයතනය විසින් දරන ලද (තැන්පතු බැරකම් නොවන) බැරකම් අදහස් වේ;

"තැනැත්තා" යන්නට, රජයේ යම් දෙපාර්තමේන්තුවක යම් නිලධරයකු සහ යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ අන්‍යාකාරයෙන් පිහිටුවන ලද හෝ සංස්ථාපනය කරන ලද, සංස්ථාගත කළ හෝ සංස්ථාගත නො කළ, යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

"නියම කරනු ලබන" යන්නෙන්, රීති මගින් නියම කරනු ලැබීම අදහස් වේ;

"රාජ්‍ය බලධරයා" හෝ "රාජ්‍ය අස්ථිත්වය" යන යෙදුම්වලට, අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක අමාත්‍යාංශයක්, පළාත් සභාවක දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක්, රාජ්‍ය සංස්ථාවක් සහ රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් යම් සමාගමක කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරනු ලබන්නේ ද, ඒ සමාගම ඇතුළත් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, 2007 අංක 07 දරන සමාගම් පනත හැර, යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවනු ලබන්නා වූ හෝ පිහිටුවනු ලැබුවා වූ ද, රජය විසින්, ප්‍රදානයක්, ණයක් හෝ අන්‍යාකාරයෙන් සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් අරමුදල් හෝ ප්‍රාග්ධනය සපයනු ලබන්නා වූ ද යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"ජාත්‍යන්තර රාජ්‍ය මූල්‍ය ආයතනය" යන්නට, ආසියානු සංවර්ධන බැංකුව, ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුළත් වේ;

"වාසිකයා" යන්නෙන් -

(අ) ශ්‍රී ලංකාවෙහි පදිංචිව සිටින ශ්‍රී ලංකාවේ පුරවැසියකු;

(ආ) යම් මාස දොළහක කාලසීමාවක් තුළ එකතුව දින එකසිය අසූතුනකට නො අඩු කාලසීමාවක් ශ්‍රී ලංකාවේ වාසය කර ඇති තැනැත්තකු;

(ඇ) ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද යම් සමාගමක් හෝ යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද සංස්ථාවක් හෝ ශ්‍රී ලංකාවේ යම් ව්‍යාපාර ආයතනයක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් සංවිධානයක්; හෝ

(ඈ) යම් විදේශීය රටක නීතියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවනු ලැබූ සමාගමක හෝ වෙනත් නෛතික තැනැත්තකුගේ ශ්‍රී ලංකාවෙහි ක්‍රියාත්මක වන ශාඛාවක්, පාලිත සමාගමක්, අනුබද්ධ සමාගමක්, ව්‍යාප්ති කාර්යාලයක්, කාර්යාලයක් හෝ වෙනත් යම් ඒකකයක්,

අදහස් වේ;

"සහතික රහිත සුරැකුම්පත්" යන්නෙන්, සහතික රහිත ආකාරයෙන් නිකුත් කරන ලද සුරැකුම්පත් අදහස් වේ;

"භාණ්ඩාගාරයේ ලේකම්වරයා" යන්නෙන්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ;

"සුරැකුම්පත්" යන්නට -

(අ) සහතික රහිත හෝ අන්‍යාකාරයෙන් නිකුත් කරන ලද (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්**;**

(ආ) සහතික රහිත හෝ අන්‍යාකාරයෙන් නිකුත් කරන ලද (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව නිකුත් කරන ලද ලියාපදිංචි ස්කන්ධ හෝ සුරැකුම්පත්**;** සහ

(ඇ) 60 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්යය සඳහා හැර, සහතික රහිත හෝ අන්‍යාකාරයෙන් නිකුත් කරන ලද මහ බැංකුවේ යම් සුරැකුම්පතක්,

ඇතුළත් වේ;

"සුරැකුම්පත් ගිණුම" යන්නෙන්, සහභාගීකරුවකු විසින් මහ බැංකුව සමඟ පවත්වාගෙන යනු ලබන ගිණුමක් අදහස් වේ;

"ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව" යන්නෙන්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අදහස් වේ;

"පියවීමේ ගිණුම" යන්නෙන්, මේ පනත යටතේ සහභාගීකරුවකු විසින් මහ බැංකුව සමඟ පවත්වාගෙන යනු ලබන්නා වූ ද, මහ බැංකුවේ අනුමතය ඇතිව පද්ධතියේ කාර්ය සඳහා භාවිත කරනු ලබන්නා වූ ද ගිණුමක් අදහස් වේ;

"විශේෂ තැන්පතු" යන්නෙන්, යම් විශේෂ ගිණුමක තැන්පත් කරන ලද මුදල්වලින් උද්ගත වන්නා වූ, වාණිජ බැංකුවක ඒ සියලු තැන්පතු බැරකම් අදහස් වේ.

## XIX වන කොටස

## ඉවත් කිරීම් සහ ඉතිරි කිරීම්

(422 වන අධිකාරය වූ) මුදල් නීති පනත ඉවත් කිරීම.

**126.** (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

ධුර කාල තවදුරටත් පැවතිය යුතු බව.

**127.** (1) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ විධිවිධාන යටතේ පත්කරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ ධුරය දරන්නා වූ මහ බැංකුවේ අධිපතිවරයා, මේ පනත යටතේ මහ බැංකුවේ අධිපතිවරයා ලෙස සලකනු ලැබිය යුතු අතර, මහ බැංකුවේ අධිපතිවරයා වශයෙන් තවදුරටත් කටයුතු කරනු ලැබිය යුතු ය. තව ද, ස්වකීය ධුර කාලය අවසන් වන තෙක් ඔහු ඒ ධුරයෙහි දිගටම සේවය කරනු ලැබිය යුතු ය.

(2) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පත්කරන ලද භාණ්ඩාගාරයේ ලේකම්වරයා හැර, ඒ පනතේ විධිවිධාන යටතේ පත්කරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ ධුරය දරන්නා වූ මුදල් මණ්ඩලයේ සාමාජිකයන්, මේ පනත යටතේ පාලක මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔවුන්ගේ අදාළ ධුරවල කාලය අවසන් වන තෙක් මේ පනත යටතේ පාලක මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් තවදුරටත් කටයුතු කරනු ලැබිය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන ප්‍රකාරව මහ බැංකුවේ අධිපතිවරයා වශයෙන් හෝ පාලක මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් තවදුරටත් කටයුතු කරනු ලබන තැනැත්තන්, මේ පනත යටතේ යම් ධුරයකට නැවත පත්කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය:

එසේ වුව ද, ඒ යම් තැනැත්තකු, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ විධිවිධාන යටතේ මහ බැංකුවේ අධිපතිවරයා වශයෙන් හෝ පත්කළ සාමාජිකයකු වශයෙන් සේවය කළ කාලය ඇතුළුව අවුරුදු දොළහක් ඉක්මවන කාලයක් සඳහා ඒ තැනැත්තා සේවය කරනු නො ලැබිය යුතු ය.

තාවකාලික අත්තිකාරම්.

**128.** (1) මේ පනතේ 87 වන වගන්තියේ සඳහන් තහනම නොතකා, මහ බැංකුව විසින්, මුදල් වර්ෂයේ පළමු මාසය ඇතුළත ඒකාබද්ධ අරමුදලින් දරනු ලැබීමට බලයලත් වියදම් මූල්‍යනය කිරීම සඳහා අලුත් ඍජු තාවකාලික අත්තිකාරම් රජය වෙත ලබා දෙනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ඒ සෑම අලුත් අත්තිකාරමක් ම මාස හයකට නොවැඩි කාලසීමාවක් ඇතුළත ආපසු ගෙවනු ලැබිය යුතු අතර, ගෙවීමට පවතින ඒ මුළු අත්තිකාරම් මුදල, අදාළ කාලසීමාව සඳහා 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් පළ කරන ලද අර්ධ වාර්ෂික වාර්තාවේ වාර්තා කරන ලද පූර්ව මුදල් වර්ෂයේ පළමු මාස හතරෙහි ආදායමෙන් සියයට දහයක් නො ඉක්මවිය යුතු ය.

(2) ඒ අලුත් අත්තිකාරම් සඳහා, මහ බැංකුව විසින් තීරණය කරනු ලබන, පවතින වෙළඳපොළ ආශ්‍රිත අනුපාතික අනුව වූ පොලියක් අය කරනු ලැබිය යුතු ය.

(3) නියමිත දිනයේ දී මහ බැංකුව විසින් රජය වෙත දී ඇති ණයවල ගෙවීමට ඉතිරිව ඇති ණය ශේෂය ප්‍රතිමූල්‍යනය කිරීම සඳහා ඒ අලුත් අත්තිකාරම් දෙනු නො ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන, රජයේ හදිසි රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා මූල්‍යනය කිරීම සඳහා රජය වෙනුවෙන් නීතිය මගින් විධිවිධාන සාදනු ලබන තෙක් බලාත්මක විය යුතු ය.

රජය වෙත ගෙවනු ලබන තාවකාලික ණය.

**129.** (1) 87 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් තහනම නොතකා, නියමිත දිනය වන විට මහ බැංකුව විසින් රජය වෙත දී ඇති ණයවල ගෙවීමට ඉතිරිව ඇති යම් ණය ශේෂයක් පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

(2) මහ බැංකුව විසින්, අමාත්‍යවරයා විමසා, නියමිත දිනය වන විට මහබැංකුව විසින් රජය වෙත දී ඇති ණයවල ගෙවීමට ඉතිරිව ඇති යම් ණය ශේෂයක්, නියමිත දිනයට ඉක්බිතිව ම එළඹෙන අවුරුදු දහයක කාලසීමාවක් මුළුල්ලේ පවතින වෙළඳපොළ ආශ්‍රිත පොලී අනුපාතික මත නිකුත් කරනු ලබන නිශ්චිත කල්පිරීමේ කාලසීමාවක් සහිත, ගනුදෙනු කළ හැකි ණය සාධන පත්‍ර බවට පරිවර්තනය කරනු ලැබිය යුතු අතර, මහ බැංකුව විසින් හැකිතාක් දුරට, ඒ ණය සාධන පත්‍ර ස්වකීය මුදල් ප්‍රතිපත්තිය යටතේ විකුණනු ලැබිය යුතු ය.

ඵලදායී කාර්ය වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන ණය දීමේ මෙහෙයුම් සම්බන්ධයෙන්, ණය දෙන ආයතනවලට තාවකාලික ණය ලබා දීම.

**130.** 115 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන කුමක් වුව ද, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 88අ වගන්තිය ප්‍රකාරව ණය දෙන ආයතනවලට ප්‍රදානය කරන ලද ණයවලින් ගෙවීමට ඉතිරිව ඇති ණයක් සහ එකී පනතේ 108 වන හෝ 108අ වන වගන්තිය යටතේ දෙන ලද යම් ණය ඇපකරයක්, එකඟ වූ නියම සහ කොන්දේසිවලට යටත්ව, මේ පනත යටතේ පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

මුදල් මණ්ඩලයේ අයිතිවාසිකම් හා බැඳීම්.

**131.** (1) නියමිත දිනයට පෙරාතුව (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ මුදල් මණ්ඩලය වෙත ආරෝපණය කරන ලද යම් අයිතිවාසිකමක් හෝ බැඳීමක්, අන්‍යාකාරයෙන් විධිවිධාන සලසා ඇති පරිදි හැර, මේ පනත යටතේ මහ බැංකුව විසින් පිළිගනු ලැබිය යුතු ය.

(2) නියමිත දිනයට පෙරාතුව (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ මුදල් මණ්ඩලය විසින් ගන්නා ලද, නිකුත් කරන ලද හෝ කරන ලද යම් ක්‍රියාමාර්ගයක්, නියෝගයක් හෝ තීරණයක්, අන්‍යාකාරයෙන් විධිවිධාන සලසා ඇති පරිදි හැර, මේ පනත යටතේ මහ බැංකුව විසින් ගනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ හෝ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ඉතිරි කිරීම.

**132.** (1) වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක කුමක් සඳහන් වුව ද, නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි-

(අ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී (මෙහි මින්මතු "ඉවත් කළ පනත"යනුවෙන් සඳහන් කරනු ලබන) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ මහ බැංකුවේ ප්‍රාග්ධනය, නියමිත දිනයේ දී මේ පනත යටතේ මහ බැංකුවේ ප්‍රාග්ධනය ලෙස සලකනු ලැබිය යුතු ය**;**

(ආ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුරය දරන, ඉවත් කළ පනත යටතේ මහ බැංකුවේ සේවානියුක්තයන්, නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි මේ පනත යටතේ මහ බැංකුවේ සේවානියුක්තයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ සේවානියුක්තයන් විසින්, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, ඔවුන් දැරූ ධුරවලට අදාළ වූ නියම සහ කොන්දේසිවලට වඩා වාසිසහගත බව අඩු නොවන නියම හා කොන්දේසි මත මේ පනත යටතේ තවදුරටත් මහ බැංකුවේ ධුරය දැරිය යුතු ය**;**

(ඇ) ඉවත් කළ පනත යටතේ මහ බැංකුව විසින් නිකුත් කරන ලද සමරු නෝට්ටු සහ කාසි සහ ස්වකීය ව්‍යවහාර මුදල් නිකුතුවේ කොටසක් වශයෙන් මහ බැංකුව දරන නෝට්ටු සහ කාසි ඇතුළුව මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබුවා වූ ද, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවත්නා වූ ද සියලුම ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි, අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ මහ බැංකුව විසින් නිකුත් කරන ලද සහ දරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි ලෙස සලකනු ලැබිය යුතු ය**;**

(ඈ) ඉවත් කළ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ මහ බැංකුව විසින් පිහිටුවන ලද්දා වූ හා ක්‍රියාත්මක කරන ලද්දා වූ ද නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින්නා වූ ද සියලු ගෙවීම්, නිෂ්කාශන සහ පියවීම් පද්ධති, නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි, මේ පනත යටතේ මහ බැංකුව විසින් පිහිටුවන ලද හා ක්‍රියාත්මක කරන ලද ගෙවීම්, නිෂ්කාශන සහ පියවීම් පද්ධති ලෙස සලකනු ලැබිය යුතු ය**;**

(ඉ) ඉවත් කළ පනත යටතේ මහ බැංකුව විසින් හෝ එහි යම් නිලධරයන් විසින් ආරම්භ කරනු ලැබ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවතින සියලු

පරීක්ෂණ, විගණන, විමසීම් හෝ විමර්ශන, නියමිත දිනයේ  සිට බලපවත්වන පරිදි, මේ පනත යටතේ මහ බැංකුව විසින් හෝ නිලධරයන් විසින්, ආරම්භ කරන ලද අවස්ථාවෝචිත පරිදි, පරීක්ෂණ, විගණන, විමසීම් හෝ විමර්ශන ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඊ) ඉවත් කළ පනත යටතේ, මහ බැංකුව, මුදල් මණ්ඩලය හෝ මුදල් මණ්ඩලය විසින් බලය දෙන ලද මහ බැංකුවේ යම් නිලධරයකු විසින් ඇතුළත් වූ ද, නියමිත දිනයට පෙරාතුව වූ දිනයේ දී වලංගුව සහ බලාත්මකව පවතින්නා වූ ද, මහ බැංකුව හෝ මුදල් මණ්ඩලය හෝ  ඒ බලයලත් නිලධරයා පාර්ශ්වයක් වන්නා වූ ද හෝ මහ බැංකුවට පක්ෂව වූ ද, සියලුම කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, ඇප, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජන ප්‍රදාන සහ කවර හෝ ස්වභාවයක වූ වෙනත් සාධන පත්‍ර, නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි මේ පනත යටතේ මහ බැංකුව විසින් ඇතුළත් වූ හෝ මහ බැංකුවට පක්ෂ වූ ද, කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, ඇප, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජන ප්‍රදාන සහ වෙනත් සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය  යුතු ය;

(උ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන සලසා ඇති ආකාරයට නිශ්චිත වශයෙන් අත්හිටුවනු ලැබ හෝ අවලංගු කරනු ලැබ හෝ ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, ඉවත් කළ පනත යටතේ මහ බැංකුව හෝ මුදල් මණ්ඩලය හෝ මුදල් මණ්ඩලය විසින් බලය දෙන මහ බැංකුවේ යම් නිලධරයකු විසින් කරන ලද හෝ නිකුත් කරන ලද්දා වූ ද, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී වලංගුව සහ බලාත්මක ව පවතින්නා වූ ද, සියලුම බලපත්‍ර, ලියාපදිංචි කිරීම්, රීති, නියෝග, විධාන, තීරණ, නියම, අනුමතයන් හෝ ප්‍රතික්ෂේප කිරීම්, දැන්වීම්, චක්‍රලේඛ, මෙහෙයුම් උපදෙස් හෝ වෙනත් යම් ලිඛිත නිවේදන, නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි මේ පනත යටතේ මහ බැංකුව විසින් කරන ලද හෝ නිකුත් කරන ලද බලපත්‍ර, ලියාපදිංචි කිරීම්, රීති, නියෝග, විධාන, තීරණ, නියම, අනුමතයන් හෝ ප්‍රතික්ෂේප කිරීම්, දැන්වීම්, චක්‍රලේඛ, මෙහෙයුම් උපදෙස් හෝ ලිඛිත නිවේදන ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඌ) ඉවත් කළ පනත යටතේ මහ බැංකුව, මුදල් මණ්ඩලය, එහි සාමාජිකයන් හෝ මහ බැංකුවේ යම් නිලධරයකු

විසින් හෝ මහ බැංකුවට, මුදල් මණ්ඩලයට, එහි සාමාජිකයන්ට හෝ මහ බැංකුවේ යම් නිලධරයකුට එරෙහිව යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ ගොනු කරනු ලැබ, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පවතින සියලු ඉල්ලීම්, නඩු, නඩු කටයුතු හෝ කවර හෝ ස්වභාවයක අභියාචනා, නියමිත දිනයේ සිට මේ පනත යටතේ මහ බැංකුව හෝ එහි යම් නිලධරයකු විසින් හෝ මහ බැංකුවට හෝ එහි යම් නිලධරයකුට එරෙහිව කරන ලද ඉල්ලීම්, නඩු, නඩු කටයුතු හෝ අභියාචනා ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කරගෙන යනු ලැබිය හැකි ය **;**

(එ) යම් නඩුවක දී හෝ නඩු කටයුත්තක දී, යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් ඉවත් කළ පනත යටතේ මහ බැංකුවට හෝ මුදල් මණ්ඩලයට හෝ මහ බැංකුවේ යම් නිලධරයකුට පක්ෂව හෝ එරෙහිව ඇතුළත් කරන ලද සියලු නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ ආඥා, නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි මේ පනත යටතේ මහ බැංකුවට හෝ මහ බැංකුවේ ඒ නිලධරයාට පක්ෂව හෝ එරෙහිව ඇතුළත් කරන ලද නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ ආඥා ලෙස සලකනු ලැබිය යුතු ය**;**

(ඒ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, ඉවත් කළ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල හෝ ඒ යටතේ නිකුත් කරන ලද යම් නියාමන අවශ්‍යතාවයක කාර්ය සඳහා හෝ අන්‍යාකාරයෙන් මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන සියලු සංචිත, නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි මේ පනත යටතේ ඒ කාර්ය සඳහා දරනු ලබන මහ බැංකුවේ සංචිත ලෙස සලකනු ලැබිය යුතු ය**;**

(ඔ) ඉවත් කළ පනත යටතේ, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින්නා වූ-

(i) (මුදල් ශේෂ, සංචිත අරමුදල්, ආයෝජන, බුද්ධිමය දේපළ සහ තැන්පතු ඇතුළුව) මහ බැංකුවේ සියලුම නිශ්චල සහ චංචල දේපළ**;**

(ii) තැන්පතු සහ අසම්භාව්‍ය බැරකම් ඇතුළු මහ බැංකුවේ සියලුම බැරකම්**;**

(iii) ඒ දේපළවලින් හෝ බැරකම්වලින් උද්ගත වන සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද, අධිකාරී බලතල, බැඳීම්, යුතුකම් සහ බැඳියාවන්; සහ

(iv) මහ බැංකුවට හෝ මහ බැංකුවේ යම් දේපළකට අදාළ වන හෝ සම්බන්ධ වන සියලු පොත්, ගිණුම් සහ ලේඛන,

නියමිත දිනයේ සිට මේ පනත යටතේ මහ බැංකුවේ දේපළ, බැරකම්, අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද, අධිකාරී බලතල, බැඳීම්, යුතුකම්, බැඳියාවන්, පොත්, ගිණුම් සහ ලේඛන ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඕ) ඉවත් කළ පනත යටතේ, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින්නා වූ, මහ බැංකුව විසින් හිමිකම් ලබන්නා වූ හෝ භුක්ති විඳින්නා වූ සියලු නිදහස් කිරීම්, ආපසු ගෙවීම්, අලාභ, අනුග්‍රහ, සහන, බදු, තීරුබදු, අයකිරීම් සම්බන්ධ ප්‍රතිලාභ හෝ වෙනත් යම් මුදල්මය ප්‍රතිලාභ, නියමිත දිනයේ සිට මේ පනත යටතේ මහ බැංකුව විසින් හිමිකම් ලබන්නා වූ හෝ භුක්ති විඳින්නා වූ නිදහස් කිරීම්, ආපසු ගෙවීම්, අලාභ, අනුග්‍රහ, සහන, බදු, තීරුබදු, අයකිරීම් සම්බන්ධ ප්‍රතිලාභ හෝ වෙනත් මුදල්මය ප්‍රතිලාභ ලෙස සලකනු ලැබිය යුතු ය;

(ක) යම් පනතක, නියෝගයක, නිවේදනයක, කොන්ත්‍රාත්තුවක, සාධන පත්‍රයක, වාර්තාවක, කොටස් සහතිකයක, ලේඛනයක, ඔප්පුවක, බැඳුම්කරයක, ගිවිසුමක, ඇපයක, ඇටෝර්නි බලපත්‍රයක, නෛතික නියෝජන ප්‍රදානයක සහ කවර හෝ ස්වභාවයක වෙනත් සාධන පත්‍රවල, ඉවත් කළ පනත යටතේ මහ බැංකුවට, මුදල් මණ්ඩලයට හෝ මහ බැංකුවේ යම් නිලධරයකුට කර ඇති සෑම සඳහනක් ම, නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි, මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා මේ පනත යටතේ මහ බැංකුවට හෝ මහ බැංකුවේ යම් නිලධරයකුට කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**133.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.